# ප්‍රජාශක්ති

## 2022 පළමු කලාපය












ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

RDTRI

# ප්‍රජාශක්ති - 2022

## උපදේශකත්වය

ටී.ඒ. රණසිංහ

අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්ලිව්. ජී.පී.වේරවැල්ල

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කරණය

පී.ඒ.සී. ජයසිංහ

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සී.කේ.ඩබ්ලිව්. අල්විස්

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## පිටකවරය

එන්.එම්.එම්. පියුමි කෝසලා වීරසූරිය

## ප්‍රකාශනය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4, කාසල් වීදිය

කොළඹ 08

# පටුන

පිටු අංක

01. දිළිඳුකම අවමකරලීම සඳහා ගෘහකළමනාකරණයේ කාලීන වැදගත්කම. 01-03

- ඩබ්ලිව්. එච්. සිරිසේන

02. ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා කාන්තා සවිබලකරණය වැදගත්වන ආකාරය. 04-07

- චිත්‍රා ජයසිංහ

03. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් බලගැන්වීමේදී ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම. 08-11

- සුභානි පියසිංහ

04. සෞභාග්‍යයේ දැක්ම හා සංවර්ධනය. - පී.පී. යමුනා කුමාරි 12-14

05. සෞභාග්‍යමත් දේශයක පැවති මහනුවර යුගයට අයත් නිර්මාණ තාක්ෂණය. - එච්.එම්.ජී.කේ.නවරත්න 15-19

06. ඉන්දියාවේ ග්‍රාමසංවර්ධන උපාය මාර්ග. - එස්.එම්. යූ.බී. සමරකෝන් 20-22

07. සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමේදී බල ශක්තිය භාවිතයේ ප්‍රජා වගකීම. -ජී.ජී.එස්. බණ්ඩාර 23-25

08. රට නගන පෙර දැක්ම හා ජනතා කේන්ද්‍රීය ස්වයංපෝෂිත ආර්ථිකයක්.- තිලක් ගංගොඩ 26-32

09. කොරෝනා වෛරස ව්‍යාප්තියේ බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් යළි නංවාලීම සඳහා සෞභාග්‍යා වැඩසටහනේ දායකත්වය. - ප්‍රදීප් ලංකාපෙල 33-36

10. සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම සඳහා කෘෂිකර්මාන්තයේ සහ දේශීය කර්මාන්තවල බලපෑම. 37-38

- එම්.බී.අයි.ජ්.චන්ද්‍රසිරි

11. සෞභාග්‍යමත් දේශයක් සඳහා ඉලක්ක ගොඩනැංවීම. - පී.බී.ඩී. වැත්තැව 39-40

12. ශ්‍රී ලංකාවේ කාබනික වගාවට විකල්පයක් ලෙස ක්‍රියාත්මක වූ හරිත විප්ලවය. 41-44

- කේ.එම්.ජී.සමරසේන

13. මූලික ආර්ථික සංකල්ප හඳුනා ගනිමින් ජාතික ආර්ථික අර්බුදය තුල ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම පිළිබඳ විග්‍රහයක්. - අනුෂා හේවගේ 45-50

14. ග්‍රාමීය සංවර්ධනයේදී ගම හා නගරය අතර පවතින අන්තර් සබඳතාවයේ වැදගත්කම. 51-54

- ඩබ්. අනුෂා ප්‍රියංජනී

15. සංවර්ධනය, අසමානතාව හා කොවිඩ් - සුභාසිනී දිනුෂා අල්ගම 55- 63

# 01. දිළිඳුකම අවමකරලීම සඳහා ගෘහ කළමනාකරණයේ කාලීන වැදගත්කම.

*ඩබ්ලිව්. එච්. සිරිසේන*
*පුහුණු හා පර්යේෂණ නිලධාරි*

ගෘහය තුළ ජීවත්වීම සඳහා කරනු ලබන අරගලයේ දී මුදල් ප්‍රධාන ස්ථානයක් ගනී. පවුල තුළ සමාදානයෙන් ජීවත්වීම සඳහා අවශ්‍ය පසුබිම ගොඩනැගෙන්නේ එකී පවුලට ප්‍රමාණවත් ආදායමක් ලැබීමෙනි. පවුලේ ආදායම් වියදම් කළමනාකරණය පිළිබඳව බුදුදහමේ සිඟාලෝවාද සූත්‍රයෙන් ලැබෙන පිටිවහල ඉතා වැදගත් වේ. කෙතරම් මුදල් උපයා ගත්තත් ඒවා නිවැරදිව පරිහරණය නොකරන්නේ නම් අයහපත් පවුල් පරිසරයක් නිර්මාණය වීමත්, පවුලේ සාමය, සතුට, සමාදානය පවුල තුළින් ගිලිහීයාමත් සිදුවේ. පවුල තුළ තිබිය යුත්තේ සාමූහික ක්‍රියාදාමයකි. බොහෝ විට අඟහිඟකමින් පිරුණු දිළිඳු පවුල තුළ නැත්තේ ද මෙම සාමූහිකත්වයයි. පවුලේ තීරණ ගැනීමේ ඒකාධිකාරය සැමියා හෝ බිරිඳ විසින් දරනු ලැබේ. සැමියා, බිරිඳ, දරුවන්, එකතුවී පවුලේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමක් හෝ ඒ සඳහා අවශ්‍ය පසුබිම ද බොහෝ විට දක්නට නොලැබේ. මෙවැනි පවුල් වැඩි ප්‍රමාණයක

## සංවර්ධන සංකල්පය හා පවුලේ සංවර්ධනය

සංවර්ධනය වූ කලී මෑත ඉතිහාසය තුළ වඩාත් සාකච්ඡාවට භාජනය වූ පුළුල් සංකල්පයකි. මේ දක්වා මෙම සංකල්පය පිළිබඳව අර්ථ නිරූපන රැසක් ප්‍රධාන ධාරාවන් දෙකක් ඔස්සේ විග්‍රහ වී ඇත. දෙවන ලෝක යුද්ධයෙන් පසුව 1980 දශකයේ අග භාගය දක්වා සංවර්ධනය පිළිබඳ අර්ථ නිරූපනය මූලික වශයෙන් නිෂ්පාදන භාණ්ඩ මත පදනම් වූ සංවර්ධන ප්‍රවේශයක් වටා කේන්ද්‍රවී ඇත. දළ දේශීය නිෂ්පාදිතය හා ඒ ආශ්‍රිතව ගොඩනගනු ලබන ආර්ථික වෘද්ධි සංකල්පය මගින් ප්‍රමාණාත්මක ස්වරූපය පමණක් අවධාරණය විය. ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ සමස්ත ජන කොටසට සාධාරණ අන්දමින් බෙදී නොයාම තුළ මෙම ප්‍රවේශයේ ප්‍රමාණාත්මක බව පිළිබඳ ප්‍රශ්න කිරීම් හා විවාදයන් ඇති විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව මත පදනම් වූ සංවර්ධනය අර්ථ නිරූපනය කිරීමේ ප්‍රවේශය වඩා සංවිධානාත්මක රාමුවක් තුළ සාකච්ඡාවට බඳුන් වූ අතර, එය වඩා යථාර්තවාදී නිර්වචනය කිරීමක් ලෙස ද පිළිගැනීමට ලක්විය.[2]

ලෝකයේ බටහිර රාජ්‍ය අතළොස්සක් විසින් තම බලය සෙසු බොහෝ රටවල් වෙත බලෙන් පැටවීම නිසා එම රටවල ආර්ථික වශයෙන්ද, දේශපාලනික වශයෙන්ද සාමාජීය වශයෙන්ද ව්‍යුහාත්මක වෙනස්කම් ඇති විය. බලවත් රටවල් නිර්මාණය කරන ලද නිර්ණායක ඔස්සේ ඌණ සංවර්ධිත හා සංවර්ධිත රටවල් ලෙස නම් කරනු ලැබූහ. ඔවුන්ගේ රටවල් සංවර්ධිත රටවල් ලෙස හඳුන්වා දුන් අතර, තම කර්මාන්ත හා නිෂ්පාදනවලට වෙළඳපොළක් සකසා ගැනීමෙන් පසුව එම රටවලට ඊනියා නිදහසක් ප්‍රධානය කළහ. ආර්ථික ප්‍රවේශයක් දෙස පමණක් බලා සංවර්ධනය යන්නට නිර්වචන සැපයීම වෙනුවට ඉන් ඔබ්බට ගිය බොහෝ අංශ ඔස්සේ ගණනය කළ යුතු බව හඳුනාගෙන ඇත. එසේම එම මිණුම් ඒ ඒ රටවලට ආවේණික තත්වයන් ඔස්සේ සළකා බැලිය යුතු බවද හඳුනාගෙන ඇත. අවසාන වශයෙන් සංවර්ධනය තුළින් අපේක්ෂා කරනුයේ සෑම අංශයකින්ම මිනිසාගේ ජීවන තත්වයේ ගුණාත්මක දියුණුවයි. එවිට දිළිඳුකම අවම වී, මානවයා ඇතුළු සත්ව සංහතියටම සුවසේ ජීවත් විය හැකි පරිසර පද්ධතියක් නිර්මාණය වී, යහපත් රටක්, යහගුණයෙන් සපිරි පවුල් සහිත සමාජයක් බිහිවනු ඇත. එය තීව්‍ර ලෙස දැනෙන මෙම යුගයේදී මේ සඳහා වන ක්‍රියාවලියේ දී පවුලේ සංවර්ධනයට ප්‍රමුඛස්ථානයක් හිමිවිය යුතු බව කිව යුතුමය.

ස්වාමියා සුරා පානයට ඇබ්බැහිවී ඇත. උපයන මුදලින් වැඩි ප්‍රමාණයක් ඒ සඳහා වැය කරයි. මොවුන් දිනෙන් දිනම දියුණුව වෙනුවට දිළිඳුකම ම වැළඳගනී.1

දිළිඳුකම යන්න අප රටෙහි අනාදිමත් කාලයක සිට සාකච්ඡාවට බඳුන් වන මාතෘකාවකි. දේශපාලනික වශයෙන්ද මෙම මාතෘකාව තේමා කරගනිමින් දේශපාලන බලය ලබාගැනීමටද මෙම තත්වය යොදාගැනීම ඇතැම්විට දක්නට ඇතත්, දිළිඳුකම යන්නට වැඩි වශයෙන් අවධානය දක්වා ඇත්තේ සමාජ විද්‍යාඥයින්, අර්ථ ශාස්ත්‍රඥයින්, දිළින්දන් සඳහා වැඩ කරන සමාජ ක්‍රියාකාරීන්, විවිධ සංවිධාන ක්‍රියාකාරීන් වැනි පිරිස්ය. ඔවුන් දිළිඳුකම තම තමන්ගේ කෝණවලින් විග්‍රහ කරති. මේ සඳහා විවිධ නිර්ණායකයන්ද යොදාගනී. ඔවුන් දිළින්දන් වෙනුවෙන් වැඩ කරති, කතා කරති. දිළින්දන් වෙනුවෙන් බොහෝ කාර්යභාරයක් කරන සේයාවක් පෙන්නුම් කළත්, දිනෙන් දින මෙම ගැටලුව විවිධ ස්වරූපයන්ගෙන් ඉස්මතුව පෙන්නුම් කරන ආකාරය දක්නට ඇත. සත්‍ය ලෙසම දිළිඳුකම පිළිබඳව කතාකළ යුත්තේ එම ගැටලුවෙන් පීඩා විඳින පිරිස්ය. ඒ ගැන කතා නොකරන්නේ ද ඔවුන්මය. මේ නිසාම විවිධ සමාජ, දේශපාලන ක්‍රියාකාරකම්වලදී මෙවැනි පිරිස් විවිධාකාරයෙන් යොදාගැනීමේ උත්සාහයන් ද දක්නට ඇත. එයද දිළිඳුකමේ ලක්ෂණයකි. මෙම ක්‍රියාදාමය තුළ ඔවුන්ගේ ගැති මානසිකත්වය තව තවත් වර්ධනය කරති. විවිධ මාදිලියේ සහනාධාර සපයති. එමගින් දිළිඳු පවුල්වල ජීවන තත්වය ඉහළ යනවා ඇතැයි අපේක්ෂා කරති. ඔවුන්ගේ ශක්තිය, ආත්ම විශ්වාසය, ගෞරවය වර්ධනය කරනවා වෙනුවට යැපීම් මානසිකත්වයම වර්ධනය කරති.

දිළිඳු පවුල් සඳහා ණය මුදල් සැපයීමට විවිධ පුද්ගලයින් මෙන්ම, විවිධ සංවිධානද තරඟයට මෙන් ක්‍රියාකාරී වී සිටී. ලබාදෙන ණය මුදල් සඳහා විවිධ පොලී අනුපාතද ක්‍රියාත්මක කරයි. ඇතැම් විට ඒවා දෛනිකව, සතිපතා, මාසිකව මෙන්ම වාර්ෂික වශයෙන්ද ක්‍රියාත්මක වුවත්, බොහෝවිට ඒවායේ සැබෑ ස්වරූපය පිළිබඳව නිවැරදි වැටහීමක් ණය ලබාගන්නා දිළිඳු පවුල්වල අය තුළ දක්නට නොලැබේ. මේ නිසාම විවිධාකාරයේ ගොදුරුවීම්වලට ලක්ව පීඩාවිඳින තත්වයන් අසන්නට මෙන්ම දක්නට ද ලැබේ. දිළිඳුකමින් පෙළෙන්නන් අතර හැකියා, දක්ෂතා ඇති අය සිටියත්, එවැනි අය ක්‍රියාකාරීව ඉස්මතු වන්නේ කලාතුරකිනි. සම්පත් ලෙස දැකිය හැකි දේ ඔවුන් බොහෝ විට සම්පත් ලෙස නොදකිති. ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුවත්බව පුළුල්වීමක් දක්නට නැත. දිගුකාලීන ඉලක්ක ඔවුන් තුළ බොහෝවිට නොමැති අතර, අද ජීවත්වීම ප්‍රධාන ඉලක්කයයි. තම ගෙවත්තෙන් හෝ අවට පරිසරයෙන් ස්වාභාවිකවම ලැබෙන දේ රැස්කර ළඟම ඇති කඩයට හෝ රැගෙන ගොස් කීයකට හෝ විකුණා එදිනෙදා ජීවත්වීම සඳහා අවශ්‍ය දෑ රැගෙන ඒම පුරුද්දක් ලෙස පවත්වාගෙන යන තත්වයක් ද දක්නට ඇත. තමන් විකුණන භාණ්ඩවල නියම මිල පිළිබඳව බොහෝ විට නිවැරදි වැටහීමක් නැත. කීයකට හෝ ඒවා අලෙවි කරයි. ඒවා රැස්කර තබාගැනීමට හුරුවක් හෝ පෙළඹවීමක් පෙන්නුම් නොකරන අතර, එදිනෙදා ජීවත්වීම සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන් බොහෝ ඉහළ මට්ටමක පැවතීම ද මෙයට හේතු වී ඇත. මේවා ඔවුන් දිළිඳුකම තුළම රඳවා තබාගැනීමට හේතුකාරක වන කරුණු ලෙස ක්‍රියාත්මක වේ. දිළිඳු පවුල් තුළ දක්නට ලැබෙන සෘණාත්මක ලක්ෂණ ඔවුන් දිළිඳුකම තුළම රඳවා ගැනීමට හේතු ලෙස ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්වම ක්‍රියාත්මක වේ. මේවා ඔවුන් සවිබලගැන්වීමට ඇති ප්‍රධාන බාධාවන්ය. මෙම අයහපත් තත්වයන් ප්‍රයෝජනයට ගන්නේ වෙනත් බාහිර පිරිස්ය. ඔවුන්ගේ අරමුණු කරා යාමට මෙවැනි පිරිස් යොදාගැනීම බොහෝ විට දක්නට ලැබෙන තත්වයකි. ඒවායේ අයහපත් ප්‍රතිඵල පිළිබඳව ඔවුන්ට නිවැරදි වැටහීමක් නැත. මේ නිසාම අනාදිමත් කාලයක සිට බහුතරයක් දිළිඳු ප්‍රජාව දැඩි සමාජ ආර්ථික පීඩාවන්ට ලක්ව ඇත. මෙවැනි පසුබිමක සිටින පවුල් සංවර්ධන මාවතය යොමුගත කිරීම සඳහා ආරම්භක ප්‍රවේශයක් ලෙස ගෘහය කළමනාකරණය කිරීම සඳහා පෙළඹවීම වැදගත් වේ. ඒ අනුව, "පවුලේ එක්ව වෙසෙනා සියලු දෙනාට වඩාත් යහපත් අන්දමින් සුවදායකව, සැනසිල්ලේ, ආරක්ෂාකාරීව විසිය හැකි අයුරින් තමන් සතු සම්පත් භාවිත කරමින් හා අවශ්‍ය බාහිර සම්පත් හා සේවා ගලපාගනිමින් ඉටු කරන ක්‍රියාදාමය ගෘහකළමනාකරණයයි."3

තවද, දිළිඳු පවුල් කුඩා ප්‍රමාණයෙන් හෝ නිෂ්පාදනය කරන භාණ්ඩවලට අතරමැදියන්ගේ ග්‍රහනය දක්නට ලැබෙන අතර, ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැත. තම නිෂ්පාදනවල මිල නියම කිරීමේ ශක්තියක් ඔවුන්ට නැත. තමන්

අලෙවි කරන දේට මෙන්ම මිලදී ගන්නා දේට ද මිල නියම කරන්නේ අතරමැදි වෙළෙන්දා විසිනි. මේ අයට කේවල් කිරීමේ ශක්තියක් නැත. පවත්නා අලෙවි රටාව දිළිඳු අයට හානිකර ලෙස බලපා ඇත. මොවුන්ගේ පවුල් තුළ මුදල් කළමනාකරණය පිළිබඳව අවබෝධයක් හෝ හැඟීමක් දන්නට නැත. පවුලේ සංවර්ධනය සඳහා වන සැලැස්මක් නැත. එසේම උපයනු ලැබූ ආදායම වියදම් කළ ආකාරය පෙන්නුම් කිරීමට හැකියාවක් නැත. ගෘහස්ථය තුළ දෛනික ආදායම්, වියදම් සිදුවන ආකාරය පිළිබඳව සටහනක් පවත්වාගෙන යාමක් හෝ ඒ පිළිබඳව කතා කිරීමක් බොහෝ විට නැත. මේ නිසාම උපයන ආදායමින් වැඩි ප්‍රමාණයක් විවිධ ඇබ්බැහිවීම් ඔස්සේ පවුල් තුළින් ගිලිහීයාම සිදුවන නිසා ඔවුන් දිළිඳුකම තුළම හිරවී සිටී. අතීතයේ සිට මේ දක්වා පවුලේ ස්වභාවය වෙනස්වෙමින් පවතින අතර, ඒ සමගම වර්තමාන පවුලේ කාර්යභාරය ද සංකීර්ණ වී ඇත.**4**

වර්තමාන සමාජ ආර්ථික වටපිටාව තුළ දැඩි ලෙස පීඩාවට පත්ව සිටින මෙම දිළිඳු ප්‍රජාව ඉන් ගොඩ ඒමේ මූලික පළමු ප්‍රවේශ ක්‍රියාමාර්ගයක් ලෙස පවුලේ ආදායම් වියදම් කළමනාකරණය කර ගැනීමට යොමුවීම ඉතා වැදගත් වේ. ගෘහය තුළ සිටින්නන් සමග සාමූහිකව පවුලේ ආදායම්, වියදම් පිළිබඳව පුළුල්ව සාකච්ඡා කිරීමට යොමුවීම මගින් පළමුවෙන්ම වියදම් වන කාරනා හා ඒවායේ ස්වභාවයන් හඳුනාගත හැකිය. මෙහිදී ආදායම් වියදම් නිසි පරිදි සටහන් පවත්වාගෙන යාමෙන් පමණක් මෙම කාර්යය නිවැරදිව සිදු කළ නොහැකි බව සියලු දෙනා තේරුම් ගත යුතුය. ඔවුන් සටහන් කරන තොරතුරු ඔවුන් විසින්ම නැවත අවධානයට යොමු කිරීම මගින් එහි පවත්නා තත්වය හා ඒවා නිවැරදි කරගත යුතු ආකාරයත් හඳුනාගැනීමට යොමු විය යුතුය. එවිට අත්‍යාවශයෙන්ම සිදුකළ යුතු වියදම්, ඉඳහිට කළ යුතු වියදම්, අනවශ්‍ය වියදම් මෙන්ම වළක්වා ගත හැකි වියදම් ද ලෙස හඳුනා ගත හැකි වේ. මෙහිදී අනවශ්‍ය වියදම් අඩුකරගැනීමටත්, තමන්ගේ නිෂ්පාදනයන්වලට යම් සාධාරණ මිලක් ලබාගැනීමට යොමුවීමත් මගින් යම් ආකාරයක ශක්තිමත් පදනමක් පවුල තුළ ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ. ණයගැති භාවයෙන් මිදීම සඳහා කුඩා ප්‍රමාණයෙන් හෝ නව ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, ඒවා ඔවුන්ට අපහසුවකින් තොරව ක්‍රියාත්මක කළ හැකි ආකාරයට සංවිධානය කර ගැනීම වැදගත් වේ. පවුල තුළ පවත්වා ගෙන යන්නා වූ සාකච්ඡා සම්මන්ත්‍රණය නව යොමුවක් කරා එළඹීමට නව බලයක්, ශක්තියක් ලැබෙන අතර, සංවිධිත ක්‍රියාකාරකම් තුළින් වැඩ පරිසරයක් ගොඩනගා ගැනීමට හැකි වනු ඇත. මෙමගින් දිළිඳුබවෙන් ගොඩ ඒම සඳහා වැඩපිළිවෙලක් ඔවුන් තුළින්ම ගොඩනැගීම සිදුවේ. මෙය ක්‍රියාකාරකමකින් හෝ කිහිපයකින් නොනැවතී අඛණ්ඩව ක්‍රියාවලියක් දක්වා පවුලේ විවිධ පැති ආවරණය කරමින් යම් කාලයක් තුළ ක්‍රියාත්මක කළ යුතු වේ. එහිදී ගෘහයේ කටයුතු පිළිබඳව තීරණ ගැනීම සියලු දෙනාගේ සාමූහික ක්‍රියාදාමයක් තුළ සිදුවිය යුතුය. පවුලේ ආදායම්, වියදම් හා ණයගැතිබව පිළිබඳව ද, ආහාර සපයාගැනීම හා පෝෂණ තත්වය කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, මුළුතැන්ගෙයි කටයුතු සංවිධිත කර ගැනීම ඉතා වැදගත් වේ. පවුලේ සෞඛ්‍ය, අධ්‍යාපන, යහපත් පුරුදු, සිරිත් විරිත් හා ආගමික වටපිටාව මෙන්ම ගෙවත්ත ක්‍රමවත්ව වගා කිරීම ද නිවසේ ඇතුලත හා පිටත ප්‍රියමනාප ලෙස සකස්කර ගැනීම ද මෙම ක්‍රියාදාමය තුළ ඉතා වැදගත් වේ.

දිළිඳු පවුල්, ඔවුන් දිළිඳුබවට පත්වීමට බලපා ඇති හේතු හඳුනාගනිමින්, එහි යථාර්තය දකිමින්, දිළිඳුකමින් ගොඩ ඒම සඳහා සැලසුම් සහගතව විසඳුම් ක්‍රියාකාරකම් ඔවුන් විසින්ම හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. මේ සඳහා අවශ්‍ය කරන දැනුවත් බව එකී ප්‍රජාව තුළ ගොඩනැංවීම සඳහා සහායවීම වගකීම් දරන මැදිහත්කරු පාර්ශවයන්ගේ කාර්යභාරය වේ. මෙමගින් එකී පවුල් සංවර්ධන මාවතට අවතීරණ කරගැනීමට හැකි වන අතර, මෙම උත්සාහය දිළිඳු පවුල් සවිබලගැන්වීම සඳහා ඵලදායී ප්‍රවේශයක් වේ.

*පරිශීලනය :*

*1. ප්‍රජාශක්ති, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකාව, 2005, පි:40*

*2. දික්වැල්ල, ආර්, ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන පරිපාලනය, සූරිය ප්‍රකාශකයෝ, වරකාපොල, 2003, පි: 4,8*

*3. දිසානායක, විමල්, ගෘහකළමනාකරණය හා පවුල් සංවර්ධනය, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, කොළඹ, 2006, පි: 4*

*4. බොටෝමෝර්, ටී. බී., සමාජ විද්‍යාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 1969, පි: 16*

# 02. ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා කාන්තා සවිබලකරණය වැදගත්වන ආකාරය.

පී.ඒ.චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරී.

සංවර්ධනය යනු රටක, ප්‍රදේශයක හෝ ගෝලීය වශයෙන් පුද්ගලයන්ගේ පවතින තත්වයේ සාමාජීය, ආර්ථික, දේශපාලන අංශවල ඇතිවන යහපත් මෙන්ම ප්‍රමාණාත්මක වර්ධනයකි. එමෙන්ම පොදු අදහසක් ලෙස ගත්විට මූලික දරිද්‍රතාවය දුරලීම, ප්‍රමාණවත් පරිදි රැකියා සම්පාදනය, සමාජ අසමානතාවය දුරලීම වැනි අරමුණු මෙහිදී පොදු වන අතර ඇතමුන් මෙම නිර්ණායකයන් නව පුළුල් වූ අදහසක් ලෙස දේශපාලනික නිදහස, සාමාජීය සාධාරණත්වය යන අංශයන් වෙතද සංවර්ධනයේ අරමුණු නැඹුරු කරයි. සාමාන්‍යකරණයට ලක් කිරීමේදී සංවර්ධනය යනු මිනිසාගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය ලෙස හඳුනා ගත හැකිය. සංවර්ධනය යන්නට කුමන අර්ථ නිරූපනයක් ලබා දුන්නද මානව සංහතියේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා ආගමික ප්‍රගතිය ඉන් ගම්‍ය වේ.

2000 වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වූ එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සම්මන්ත්‍රණයේදී රටවල් 192 ක්, ජාතීන් 189 ක් හා ලෝක නායකයින් 147 ක් විසින් පිළිගනු ලැබූ සහශ්‍ර සංවර්ධන අරමුණු **(MDG)** ශ්‍රී ලංකාවේ සංවර්ධනයටද යොදාගෙන ඇත. මෙහිදී සහශ්‍ර සංවර්ධන අරමුණු අතරින් ජාතික සංවර්ධනය සඳහා අරමුණු 17 ක් පවතින අතර එම අරමුණු අතරින් පස්වන අරමුණ වන්නේ "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම" යනුවෙනි. එම අරමුණු මෙන්ම ප්‍රායෝගික තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා කාන්තා සවිබලකරණය ඉතා වැදගත් වේ.

කාන්තා සවිබල ගැන්වීම යනුවෙන් සරලව අදහස් කරනුයේ "**කාන්තාවට සවිය ලබා දීම හෙවත් ඇය ආර්ථික, සාමාජීය, දේශපාලන වශයෙන් ශක්තිමත් කාන්තාවක ලෙස බල ගැන්වීමයි**".

ජාතික සංවර්ධනයේ එක් අරමුණක් වන "ලංකාව දරිද්‍රතාවයෙන් තොරවීම" යන කාරණාවේදීද කාන්තාව සවිබලකරණය ඉතා වැදගත් වේ. දරිද්‍රතාවයේදී වඩාත් පීඩනයට ලක්වනුයේ නිවසේ මවයි. පියා සමග දරුවන් පවතින සබඳතාවය තරමක දුරස්තභාවයක් ඇති හෙයින් අධ්‍යාපනික අවශ්‍යතා, ආහාර පිළිබඳ අවශ්‍යතා, සනීපාරක්ෂක අවශ්‍යතා යන සියල්ල ඉටු කර ගැනීමේදී මවගෙන් එම ඉල්ලීම් ඉල්ලනු ලබන අතර ආර්ථික පීඩාවට ලක්ව සිටින මව්වරුන් එහිදී දැඩි අපහසුතාවයකට මෙන්ම මානසික පීඩනයටද ලක්වේ. මෙහිදී රැකියාවක් නොකරන මව්වරු සැමියා ලබාදෙන සුළු මුදල නිවසේ කාර්යයන් සඳහා ඉතා අරපිරිමැස්මෙන් යොදා ගන්නා අතර, උපයන මුදලින් වැඩි කොටසක් ස්වාමියා විසින් සුරා සූදුවට හා අනෙකුත් අවශ්‍යතා සඳහා වැය කරනු ලබයි. එමෙන්ම ලංකාවේ පවතින සාම්ප්‍රදායික සිරිත් අනුව දේපල අයිතිය හිමි වන්නේද පිරිමි දරුවන්ටය. පවුලකින් බොහෝවිට ගැහැණු දරුවන්ට ස්ථාවර දේපල හිමි නොවන අතර ජංගම වත්කම් පමණක් එනම් ගෘහ භාණ්ඩ, ආභරණ වැනි දේ කාන්තාවන්ට හිමි වේ. මේවා අස්ථාවර වත්කම් වන අතර ස්ථාවර වත්කම් පිරිමි ළමුන්ට ලබා දී ඇත. මෙහිදී වතු පිටි වලින් ලැබෙන ආදායම පිරිමියා විසින් ලබා ගන්නා අතර අනවශ්‍ය කටයුතු සඳහා එම මුදල් වියදම් කරන අවස්ථා බොහෝය. කාන්තාවන් එසේ අනවශ්‍ය වියදම් දරනුයේ ඉතා අල්ප වශයෙන් වන අතර ඉතා අරපිරිමැස්මෙන් එම මුදල් පරිහරණය කරන අතර නිවස ඉදිකිරීම, ළිඳ ඉදිකිරීම, වැසිකිළි පහසුකම් ඇති කිරීම හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා වෙහෙස දරනුයේ මව විසිනි. එනිසා කාන්තාවන්ට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම, වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය හා ක්ෂුද්‍රමූල්‍ය ඇතුලු නව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීම සඳහා සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම සුදුසු වේ. නිවසේදීම ගැහැණු දරුවන්ටද ඒවායේ සමාන අයිතිවාසිකම් පැවරෙන ලෙස ක්‍රියා කළ යුතු අතර ගැහැණු දරුවන් පහත් කර

නොසැළකිය යුතුය. මූල්‍ය සේවාවලදීද ගෘහමූලිකයාට හිමිකම ලබා දෙමින් මුදල් පිරිමියා වෙත ලබා දෙන අතර බොහෝ විට ඔහු ඒවා අනවශ්‍ය වියදම් සඳහා යොදවයි. එහෙත් එම ණය පියවීමේදී බිරිඳ කුස ගින්නේ සිටිමින් එම ණය ගෙවීම් සිදු කරනු ලබයි. දිළිඳුකම අවම කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජන කිරීම වේගවත් කිරීමට කාන්තාවන් වෙනුවෙන්ද සංවේදි ජාතික, කලාපීය සහ අන්තර් ජාතික ප්‍රතිපත්ති රාමු නිර්මාණය කළ යුතු වේ. ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් කාන්තාවන් අසාධාරණයට ලක් නොකර පුනරාවර්ථන වියදම් හා ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය වෙන්කළ යුතු අතර කාන්තාවන්ට ආර්ථික නිදහස ලබා දීම කළ යුතු වේ.

ජාතික සංවර්ධන අරමුණක් වන "සාගින්න තුරන් කිරීම" යන අදහසේදී කාන්තා සවිබල ගැන්වීම ඉතා වැදගත් වේ. ලෝක ජනගහනය දෙස බැලූවිට බිලියන 1.2 ක දෛනික ආදායම ඇමරිකානු ඩොලර් එකකට වඩා අඩුය. මිලියන 800 ක ජනගහනයක් සාගින්නෙන් පෙළේ. අවුරුදු 5 ට අඩු ළමුන් මිටි වීම, ක්ෂය වීම, මන්දපෝෂණය මෙන්ම නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්වයන්ට විසඳුම් ලබාදීම අවශ්‍ය වේ. මෙහිදී කුඩා කලසිටම සාගින්නට ගොදුරු වන්නේ ගැහැණු දරුවන්ය. ලංකාවේ නිවෙස්වල මව ආහාර පිසූ විට ස්වාමියාට හා පිරිමි දරුවන්ට ප්‍රමාණවත් පරිදි ආහාර බෙදා දෙයි. පිරිමින් ආහාර ගෙන ඉතිරිවුවහොත් ආහාර ගන්නා ලෙස ගැහැණු දරුවන්ට උපදෙස් දෙයි. මව ගැබිණියක වුවද භාජනයේ ඇති දංකුඩ පමණක් අනුභවකර කුස පිරෙනතුරු වතුර බී නින්දට යන අවස්ථා බොහෝය. එම ක්‍රියාවන් තම ගැහැණු දරුවන්ටද එලෙසම සිදුකරන ලෙස උපදෙස් දී ඇත. මෙහිදී දරුවන් බිහි කිරීමේදී ගැහැණු දරුවන්ගේ සෞඛ්‍ය තත්වය ඉතා වැදගත් වේ. මාතෘ මරණ ඉහළය. අප්‍රිකානු මහාද්වීපය තුළ දරුවන් බිහිකරන සෑම මව්වරු 13 දෙනෙකුගෙන් එක් අයෙකු මෙම අවස්ථාවේදී මියයයි. එනිසා ගැහැණු දරුවන්ටද පිරිමි දරුවන්ට සේම පවතින ආහාර සමව බෙදාගෙන අනුභව කිරීමට බල ගැන්විය යුතුය. නිරෝගි දරු පරපුරක් බිහිකරනුයේ ඇය විසිනි.

ජාතික සංවර්ධන සැලැස්මේ 3 වන අරමුණ වන "නිරෝගි බව සහ යහ පැවැත්ම ඇති කිරිම" යන කරුණ කාන්තා සවිබලකරණයේදී වැදගත් වේ. මෙහිදී මාතෘ මරණ අනුපාතිකය හා සජීවි දරු උපත් ලක්ෂයකට මරණ 70 දක්වා අඩු කිරීම අරමුණු කර ඇත. මාතෘ මරණ සිදුවන්නේ බොහෝවිට කාන්තාවන්ගේ පෝෂණ තත්වය දුර්වල වීම, සෞඛ්‍ය පහසුකම් නොමැතිව දරු උපත් සිදුවීම ආදි හේතු මත වේ. මෙහිදී මවට අවශ්‍ය පෝෂණය රැකවරණය ලබාදීම පවුලෙන්, ආර්ථිකයෙන්, ආගමෙන් සිදු විය යුතු වේ. ලෝකයේ අවුරුදු 5 ට අඩු ළමුන් මියයාමද කාන්තාවගේ නිරෝගිභාවයේ අඩුපාඩුව මත සිදු වේ. නිරෝගිභාවය දරුවන්ගේ යහපැවැත්මටද හේතු වේ. එනිසා කුඩා කල සිටම ගැහැණු දරුවා පෝෂණීය ආහාර වේලක් ගැනීමට බල ගැන්වීම කල යුතුවේ. එමෙන්ම ඒඩ්ස්, ක්ෂය රෝගය වැනි වසංගත රෝගවලටද කාන්තාව බහුලව ගොදුරු වේ. නිවසේ ලිප ආශ්‍රිතව ගැවසෙන කාන්තාවට ක්ෂය රෝගය, ස්වශන ආබාධ බහුල වේ. එය ජාතික සංවර්ධනයට බාධාවකි. එනිසා දිළිඳු පවුල්වල බිම ඉදිකර ඇති ලිප උස් වේදිකාවක් මත ඉදිකිරීම මගින් ඇයට දුම ආඝ්‍රාහනය නොවීමට කටයුතු කිරීමත් එමගින් ස්වශන ආබාධ වලින් මිදී නිරෝගිභාවය ලබා දීමත් කළ හැකිය. කාන්තාව මාස 3 ක බිළිඳියගේ සිට අවුරුදු 90 දක්වා වූ වයස්ගත කාන්තාව තෙක්ම පුරුෂයන්ගේ දූෂණ වලට ලක්ව ඇති බව වාර්තා පවතී. දූෂණ නිසා මියයන ස්ත්‍රී පරපුර මෙන්ම මානසික අවපීඩනයට සහ ඒඩ්ස් වැනි ලිංගාශ්‍රිත රෝග බෝවීමද බහුලව සිදු වේ. මෙමගින් මුලු මහත් ජාතික සංවර්ධනයටම බලපෑමක් සිදු වේ. එනිසා එවැනි අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් කාන්තාව සවිබල ගැන්වීම ඉතා වැදගත් වේ. එමෙන්ම බෝවන හා බෝ නොවන රෝග සඳහා අවශ්‍ය එන්නත් මගින් ලෙඩරෝග සුව කිරීමට හැකි ආකාරය මෙන්ම තම දරුවන්ට එම එන්නත් ලබාදීමට අවශ්‍ය දැනුම ලබාදීම තුළින් කාන්තාව සවිබල ගැන්වීම වැදගත් වේ.

ජාතික සංවර්ධනයට කාන්තා සවිබල ගැන්වීම සඳහා "ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම" ද වැදගත් වේ. ලෝක ජනගහනයෙන් පාසල් නොයන දරුවන්ගෙන් 60% ක් ගැහැණු දරුවන්ය. කාන්තා පාර්ලිමේන්තුව නියෝජනය 14% කි. එහෙත් කාන්තාවන් පිරිමින්ට සාපේක්ෂව උසස් අධ්‍යාපනයට යොමු වීමක් දක්නට ලැබේ. කාන්තාව දැඩි කැපවීමක් අධ්‍යාපනය සඳහා දරන අතර එනිසා සියලුම කාන්තාවන්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලට ලබාගත හැකි

විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනයට යොමු කිරීම වැදගත් වේ. උසස් තනතුරුවල කාන්තාවන් අධ්‍යාපනය ලබා රැකියා හොබවන අතර රාජ්‍ය සේවයේද වැඩිපුර සේවය කරන්නේ කාන්තාවන්ය. එනිසා ඔවුන්ට පහසුවෙන් හා ආරක්ෂිතව යා හැකි ප්‍රවාහන පහසුකම්, රැකියාවන්හි යෙදෙන මව්වරුන්ගේ දරුවන්ට මව්කිරි දීමට හැකි පරිදි අවස්ථාවන් සැළසීම, දරුවන් රැකබලා ගන්නා දිවා සුරකුම් මධ්‍යස්ථාන ආයතන තුළ ඉදිකිරීම වැනි කාන්තා සවිබල ගැන්වීම් කටයුතු සිදු කිරීමෙන් ජාතික සංවර්ධනයට විශාල දායකත්වයක් ලබාගත හැක. අධ්‍යාපනයේදී ස්ත්‍රීන්ට සියලු අංශයන්ට ප්‍රවේශ වීමේ අවස්ථා ලබා දිය යුතුය. උදාහරණ ලෙස ග්‍රාම නිලධාරි තනතුර සඳහා අතීතයේ පිරිමි නිලධාරි පමණක් බඳවා ගැනීම, කාන්තාවන්ට උසස් අධ්‍යාපනයක් අවශ්‍ය නොවන බවට ඇති මත දුරු කිරීම කළ යුතුය.

එමෙන්ම කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැළකීම් තුරන් කිරීම් කල යුතුය. කාන්තාවන් හා පිරිමින් වතු වැඩ කිරීමේදී කාන්තා ශ්‍රමයට අඩු වැටුපක් ලබා දෙයි. දෙපාර්ශවයටම එක සමාන වැටුපක් ලබා දීම සුදුසුය. ලිංගික හිංසනය, වෙනත් ආකාරයේ දූෂණ, කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව පොදු හා පෞද්ගලික ස්ථානයන්හි සිදුවන ප්‍රචණ්ඩත්වයන්, තම සැමියා වුවද බිරිඳට නිතරම බැන වැදීම්, තාඩන පීඩන කිරීම මෙන්ම මිනීමැරුම්ද අසන්නට ලැබේ. එමගින් කාන්තාවන් බොහෝ මානසික පීඩාවන්ට ලක්වී සිටී. එනිසා දරුවන්ගේ අධ්‍යාපනය විනාශ වීම, දරුවන් තනිවීම ආදි කරුණු තුළින් රටේ ජාතික සංවර්ධනයට බලපෑමක් සිදු වේ. මවට සහෝදරියට ගෞරව කිරීම වැනි යහපත් පුරුදු කුඩාකල සිටම පවුල, පාසල, සමාජ කණ්ඩායම් තුළින්, සංස්කෘතියෙන්, ආගමෙන්, දේශපාලනයෙන් හුරුකළ යුතුය. ඇය බඩුව නොව උත්තරීතර මාතාවක් බව සිහිපත් කර දිය යුතුය. ළමා විවාහයන්, බලහත්කාර විවාහ, කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම් හා හානි කිරීම් ආදි ක්‍රියාවන්ගෙන් ඉවත්විය යුතුය.

මහජන සේවාවන් සැපයීම, යටිතල පහසුකම් සැපයීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සැපයීම, ගෙවීමක් සිදු නොකරන සේවාවන් සහ ගෘහාශ්‍රිත වැඩවල වටිනාකම හඳුනාගත ගැනීම වැනි කරුණු වලදී අගය කිරීම හා නිවසේ හා පවුලේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම කළයුතුවේ. නිවසේ කටයුතු කරන ගෘහනියට නිකන් ඉන්නවා යැයි ප්‍රකාශ නොකර වටිනාකමක් දී ඇය අගය කිරීම කල යුතු වේ. දේශපාලන, ආර්ථික හා සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවල තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය හා ඒ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායි අන්දමින් සහභාගිවීම තහවුරු කළයුතු වේ.

කාන්තාවන්ට ආර්ථික අයිතිවාසිකම් ලබා දීම සඳහා වූ සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම සහ දේශීය නීතිවලට අනුව ඉඩම් හා වෙනත් දේපල, මූල්‍ය සේවාවල, උරුමයන් හා ස්වභාවික සම්පත්වල හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා හා පාලනය සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම වැදගත් වේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුලත්ව තාක්ෂණය ලබා ගැනීම සඳහා කාන්තාවන් බලගැන්වීම සුදුසුය. කාන්තාවන්, ගැහැණු ළමුන් බල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම හා ශක්තිමත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

ගෘහයේ ජල සැපයුම සිදුකිරීම කරනුයේ කාන්තාව විසිනි. උස් කඳු මුදුන්හි සිට පහළ පවතින ජල මූලාශ්‍ර වලින් ජලය නිවසට ගෙන යාම කාන්තාව විසින් සිදු කරයි. මේ සඳහා ඇයට දිගු කාලයක් මෙන්ම දැඩි වෙහෙසක් දැරීමට සිදු වේ. එම කාලය හා ශ්‍රමය ස්වයං රැකියාවකට, ගෙවතු වගාවකට යෙදිය හැකිය. එය ජාතික සංවර්ධනයට දායකත්වයකි. සෑම පවුලකටම ජල පහසුකම් සැලසීමෙන් කාන්තාව බල ගැන්විය හැකිය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පොදු වැසිකිලි පද්ධතිය හා පාසැල්වල වැසිකිලි පද්ධතිය දෙස බලන විට ඒවාට නිසි ජල සැපයුමක් නොවන අතර කාන්තාවන්ගේ විශේෂ අවශ්‍යතා ඉටු කර ගැනීමට සුදුසු නොවන වැසිකිලි පද්ධතියක් වේ. මෙය කාන්තාවන් මෙන්ම පාසල් දැරියන් ඉතා අපහසුතාවයට පත්වීමට හේතු වනවා මෙන්ම මේ නිසා දින කීපයක් පාසැල් නොයා සිටින දරුවන්ද වේ. මෙය ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනයට බාධාවක් වන අතර එය ජාතික සංවර්ධනයටද බාධාවක් වේ. ජලයට විෂ රසායනික ද්‍රව්‍ය මුසුවීමෙන් බොහෝ

නිවෙස්වල වකුගඩු රෝගීන් වේ. නිවසේ ස්වාමියා වකුගඩු රෝගියෙක් වීම නිසා පවුලේ සියලු බර මවට දැරීමට සිදු වේ. මේ සඳහා පිරිසිදු ජල පද්ධතිය රැකගැනීමද කාන්තා බල ගැන්වීමට හේතු වේ.

කාන්තා සවි බල ගැන්වීමට බල ශක්තිය සැපයුමද වැදගත්වේ. නිවසට විදුලිය නොමැතිවීම කාන්තාව කෙරේ විශේෂයෙන් බලපායි. නිවසේ කටයුතු, දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු ඇය විසින් රාත්‍රියේදි සිදු කරනු ලබයි. විදුලිය නොමැතිවීම ජාතික සංවර්ධනයට බලපාන අතර සියලු නිවාස වලට විදුලිය සැපයීම මගින් කාන්තාව බලගැන්විය හැකිය.

ආර්ථික වර්ධනය හා රැකියා ප්‍රවර්ධනය තුළින්ද කාන්තාවන් සවිබල ගැන්විය හැකිය. ශ්‍රමය සම්බන්ධ රැකියා, ඵලදායි ක්‍රියාකාරකම්, ව්‍යවසායකත්වය, නිර්මාණශීලීත්වය, ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ මෙන්ම මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ගොඩනැංවීම සංවර්ධනය සඳහා දිරිගැන්වීමකි. මෙවැනි කාර්යයන් සඳහා කාන්තාව දක්ෂ වන අතර ඇයටද ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතු වේ. කාන්තාවන්ට රැකියා ලබා දියයුතු අතර දරුවන් රැක ගැනීම හා ප්‍රවාහනයේදි ඇයට විශේෂ සහයෝගයක් දියයුතු වේ. කාන්තාවන් වහල් සේවයේ නොයොදා ඵලදායි සේවයකට යොමුකළ යුතුවේ. කුඩා ගැහැණු දරුවන් මුදලක් නොදී වහල් සේවයේ යොදන මව්පියන් හා ධනවත් පවුල් ලංකාව තුළ වේ.

කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින්ද කාන්තාව සබවිබලකරණය කළ හැකිය. කර්මාන්ත නවෝත්පාදනයේදී කාන්තාවන් දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන වියනු ලබන වට්ටි, පෙට්ටි, පැදුරු, මාගල්, බෑග්, පර්ස් ආදියට සාධාරණ මිලක් මෙන්ම තාක්ෂණයද හඳුන්වා දීම තුළින් ඇය බල ගැන්විය හැකිය.

තිරසාර නගර හා ප්‍රජාව ඇති කිරීමද කාන්තා සවිබලකරණයේදී වැදගත් වේ. බොහෝ පවුල්වලට ආරක්ෂාකාරි නිවාස නොමැත. අඩු පහසුකම් සහිත පැල්පත් නිවාස ඇත. ස්ත්‍රීන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට මෙන්ම කුඩා ගැහැණු දරුවන්ගේ සිට මහළු මාතාව දක්වා අනාරක්ෂිතව වෙසේ. එනිසා කාන්තාවන් බල ගැන්විම සඳහා අඩු මුදලට ලබා ගත හැකි නිවාස හා පැල්පත් වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදයකට යැම සුදුසු වේ. දේශීය තාක්ෂණය හා අමුද්‍රව්‍ය යොදාගෙන නිවාස සෑදිම කළ යුතු වේ. මහාමාර්ග වලදී කාන්තාවන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීම කළ යුතු අතර ප්‍රවාහන පද්ධතිය කාන්තාවන්ගේ ආරක්ෂාව සැලසෙන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු වේ.

තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාව සහතික කිරීම කාන්තා සවිබල ගැන්වීමේදි වැදගත් වේ. සිල්ලර හා පාරිභෝජන මට්ටම්වලදී ආහාර අපතේ යන අතර පශ්චාත් අස්වනු හානි මෙන්ම නිෂ්පාදන හා සැපයුම් අවස්ථා වලදී ආහාර බහුල ලෙස අපතේ යයි. ඒවා වළක්වාලීමේ දැනුවත්විමේ වැඩසටහන් කාන්තාව සඳහා පැවැත්විය යුතු අතර නිවසේ මුළුතැන්ගෙයින් විශාල ආහාර නාස්තියක් සිදුවේ. මෙය ජාතික සංවර්ධනයට බලපායි.

සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන ඇතිකිරීමද කාන්තා සවිබල ගැන්වීමේදී වැදගත් වේ. මෙහිදී සියළුම ස්ථානයන්හි සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනේ. මෙහිදී කාන්තා ප්‍රචණ්ඩත්වය කාන්තා මරණ විශාලය. එය තම පවුල තුලින්ම ආරම්භ වේ. සැමියාගෙන් සිදුවන තාඩන පීඩන මෙන්ම කුඩා දරුවන්ට සිදුවන ලිංගික හිංසනයද බහුලය. මෙවන් අවස්ථාවල මව දිවි නසා ගැනීම් හෝ සැමියා අතින් මරණයට පත්වීම් වැනි අවස්ථා නිසා දරුවන් අසරණ වීම මෙන්ම අනාරක්ෂිතද වේ. මෙයින් ජාතික සංවර්ධනයට විශාල විශාල බලපෑමක් සිදු වේ. එනිසා සෑම දෙනාටම නීතියේ සාධාරණත්වය මෙන්ම පවුල තුළින්ම මවගේ, සහෝදරියගේ වටිනාකම වැටහෙන සේ ක්‍රියා කළ යුතුවේ. පවුල තුළ ඇගේ ගෞරවය ආරක්ෂා වන පරිදි සැමියා ඇයව අරක්ෂා කල යුතුය.

මෙම කරුණු අනුව එක්සත් ජාතින්ගේ සහශ්‍ර සම්මන්ත්‍රණයේදී පිළිගනු ලැබූ ඉහත සඳහන් සංවර්ධන අරමුණු ගලපා ගනිමින් කාන්තාව සවිබල ගන්වා එමගින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය කරා පහසුවෙන් ලඟා වීමට උත්සාහ දැරීම වැදගත් වේ. එය සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැංවීමට ඉවහල්වනු ඇත.

# 03. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් බලගැන්වීමේදී ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම.

*සුභානි පියසිංහ*
*සංවර්ධන නිලධාරි*

"යම් ව්‍යාපාර අදහසක් උපදවාගෙන එය ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව" ව්‍යවසායකත්වය ලෙස හඳුන්වනු ලබයි. එහිදී එය නිර්මාණශීලී බව, නවෝත්පාදක බව හා අවදානම් භාරගැනීම යන ගතිලක්ෂණ වලින් යුක්ත වියයුතු වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් බලගැන්වීම ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන මට්ටමෙන් විවිධ දිරිගැන්වීම් ද සිදුකරනු ලැබේ. එසේ වුවත් බොහෝ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් ඉතා ඉක්මනින් බිඳවැටීමට ලක්වීම වර්තමාන ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකත්වය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වේ. මෙලෙස බිඳවැටීමට විවිධ හේතු සාධක බලපානු ලබන අතර ව්‍යාපාර පරිසරය පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, ඒ අතරින් ප්‍රධානම හේතුවක් වී තිබේ.

ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට අභ්‍යන්තරව හා බාහිරව ධනාත්මක හා ඍණාත්මක වශයෙන් බලපෑම් ඇතිකරන සාධක හා බලවේග සියල්ලම ව්‍යාපාර පරිසරය ලෙස හඳුන්වනු ලබයි. ගෝලීයකරණයට ලක්වෙමින් පවතින ගතික පරිසරයක් තුළ, තාක්ෂණික දියුණුවත් සමග ව්‍යාපාර පරිසරය නිරන්තරයෙන් වෙනස්වීම් වලට ලක්වෙමින් පවතී. අතීතයේ පැවති ව්‍යාපාර පරිසරයට වඩා නූතන ව්‍යාපාර පරිසරය තුළ ප්‍රබල වෙනස්කම් රාශියක් සිදුවෙමින් පවතී. අතීතයේදී මිනිස් අවශ්‍යතා හා වුවමනා සරල හා සීමිත වූ අතර ඔවුන් එම අවශ්‍යතා හා වුවමනා අවම මට්ටමෙන් සපුරා ගන්නට විය. නමුත් වර්තමානයේදී එම අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ හා අසීමිත වීමත්, ඔවුන් ඒවා උසස් මට්ටමෙන් සපුරා ගැනීමට උත්සාහ කිරීමක් දක්නට ලැබේ. එසේ ම අතීතයේදී අඩු ජනගහනයකට යැපීමට අවශ්‍ය සම්පත් පැවතුනත් වර්තමානයේ සීමිත සම්පත් ප්‍රමාණයකින් අධික ජනගහනයක අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට සිදුව තිබේ. එකල අඩු තරඟකාරීත්වයක් දක්නට ලැබුණු අතර වර්තමානය වනවිට දැඩි තරඟකාරීත්වයක් දක්නට ලැබේ. අතීතයේ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ ව්‍යාපාරිකයන් බලවත් වූ අතර මූලික අරමුණ ලාභ ඉපයීම විය. නමුත් වර්තමානයේ ලාභ අරමුණ ම පමණක් නොව සමාජ වගකීම වැනි වෙනත් අරමුණුද ඉටුකිරීමට අපේක්ෂා කරනු ලබයි. අතීතයේ කුඩා ප්‍රදේශයකට සීමාවූ ව්‍යාපාර කටයුතු වර්තමානයේ ගෝලීය වශයෙන්ද ව්‍යාප්ත වී ඇත. අතීතයේ ව්‍යාපාර පරිසර වෙනස්වීම ඉතා සෙමෙන් සිදුවූ අතර වර්තමානයේදී ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතී.

එමනිසා මහා පරිමාණ මෙන්ම ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ද එම වෙනස්වීම්වලට අනුගත වෙමින් තම ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එවිට එම ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යාහැකි වනවා මෙන්ම ව්‍යාපාරය දියුණු කර තම වෙළඳපොළ කොටස වර්ධනය කර ගනිමින් වැඩි ලාභ ඉපයීමටද හැකියාව ලැබේ. ඒ සඳහා සෑම ව්‍යාපාරයක්ම තම ව්‍යවසායකත්ව අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකි ආකාරයට

පාරිසරික සාධක නිසි පරිදි අධ්‍යයනය කර ව්‍යාපාරයට ගලපා ගැනීම අත්‍යවශ්‍ය වේ. පරිසර සාධක තුලින් ඇතිවන හිතකර හා අහිතකර බලපෑම් ව්‍යාපාරය අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිරින්ද ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි. ව්‍යවසායකයින්ට තම ව්‍යාපාරය පිළිබඳව නිවැරදි තීරණ ගැනීමට සුදුසු පසුබිම සකසනු ලබන්නේ මෙම ව්‍යාපාර පරිසර සාධක විසිනි. ඒ අනුව හිතකර බලපෑම් හඳුනාගෙන ඒවා තව දුරටත් ශක්තිමත් කර ගැනීමටත් අහිතකර බලපෑම් හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට පිළියම් යෙදීමක් කළ යුතුය. ඒ සඳහා පරිසර සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම සහ නිසි පරිදි අවබෝධ කර ගැනීම හා ඊට අනුගත වෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ඒ තුළින් ,

- ව්‍යාපාරයේ ශක්තීන් හා දුර්වලතා හඳුනාගැනීමට
- ව්‍යාපාරයට පවතින අවස්ථා සහ තර්ජන හඳුනාගැනීමට
- පරිසර වෙනස්වීම් වලට අනුව ව්‍යාපාරයේ සැලසුම් හා උපාය මාර්ග තීරණය කිරීමට .
- පරිසර වෙනස්වීම් වලට අනුව අලෙවිකරණ මිශ්‍රණය පවත්වාගෙන යාමට හා අලෙවි පර්යේෂණ හා සමීක්ෂණ සිදු කිරීමට
- ඉලක්ක වෙළඳපොළ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට

හැකියාව ලැබේ.

**ව්‍යාපාර පරිසරය**

**අභ්‍යන්තර පරිසරය**

- අයිතිකරු
- කළමණාකරුවන්
- සේවකයන්
- සම්පත්

**බාහිර පරිසරය**

**සූක්ෂම පරිසරය**

- පාරිභෝගිකයන්
- සැපයුම්කරුවන්
- තරඟකරුවන්
- ආදේශකයන්
- අනාගත වෙළඳපොළට පිවිසෙන්නන්

**සාර්ව පරිසරය**

- ජන ව්‍යුහාත්මක පරිසරය
- ආර්ථික පරිසරය
- සමාජ හා සංස්කෘතික පරිසරය
- දේශපාලන හා නෛතික පරිසරය
- ස්වභාවික පරිසරය
- තාක්ෂණික පරිසරය

**අභ්‍යන්තර පරිසරය**

ව්‍යාපාරයේ කටයුතුවලට බලපෑම් කරන ව්‍යාපාරය තුළ ඇති සාධක අභ්‍යන්තර පරිසර සාධක වේ. එනම් ව්‍යාපාරයේ අයිතිකරුවන්, කළමණාකරුවන්, සේවකයන්, ව්‍යාපාරය සතුව පවතින වත්කම් (ඉඩම්, ගොඩනැගිලි) හා අනෙකුත් සම්පත් (Money, Machine, Material etc..) ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධක ලෙස හඳුනාගත හැකිය. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යාපාරවල භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියට අදාළ සියලු ව්‍යාපාර කටයුතු සිදු කරනු

ලබන්නේ අයිතිකරු සහ පවුලේ සාමාජිකයන්ගේ ශ්‍රමදායකත්වය මතයි. එහිදී එම ව්‍යාපාරය හා එය පවත්වා ගනිමින් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ඔවුන් සතු නිෂ්පාදනයේ හා මෙහෙයවීමේ දක්ෂතාවය, හැකියාව, ආකල්ප, මූල්‍ය පාලනය ආදිය ව්‍යාපාරයට ශක්තියක් වේ. එය නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප නොමැතිව ව්‍යාපාරය ආරම්භ කිරීම, ඒ සඳහා පළපුරුද්ද හා අත්දැකීම් නොමැතිවීම දුර්වලතාවයක් වේ. එසේම ව්‍යාපාරය සඳහා අවශ්‍ය සම්පත් වන මුදල්, යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍ය, ගොඩනැගිලි , ප්‍රවාහන හා මහාමාර්ග පහසුකම් ප්‍රමාණවත් පරිදි තිබීම ව්‍යවසායකයාට ශක්තියක් වේ. ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම දුර්වලතාවයක් වේ. මෙම සාධක වලින් ඇතිවන බලපෑම ව්‍යාපාරයට පාලනය කළ හැකි වේ. මෙම පරිසර සාධක අධ්‍යයනය කිරීම තුළින් ආයතනයේ පවතින ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිය. ඒ අනුව අභ්‍යන්තර පරිසර සාධකවල පවතින ශක්තීන් තව දුරටත් වර්ධනය කර ගැනීම හා හඳුනාගත් දුර්වලතා මගහරවා ගැනීමට කටයුතු කිරීම තුළින් තම ව්‍යාපාර කටයුතු සාර්ථකව පවත්වාගෙන යාහැකි වේ.

## බාහිර ව්‍යාපාර පරිසරය

### සූක්ෂම ව්‍යාපාර පරිසරය

ව්‍යාපාර කටයුතු කෙරෙහි පිටතින් බලපෑම් ඇති කරන ව්‍යාපාරයට ඍජුව පාලනය කළ නොහැකි සාධක බාහිර පරිසර සාධක ලෙස හඳුන්වනු ලබයි. මෙම සාධක අතර, ව්‍යාපාරයට ඉතා සමීපව ක්‍රියාත්මක වන සාධක සූක්ෂම පරිසර සාධක ලෙසද, ව්‍යාපාරයට සමීප නොවන පරිසර සාධක සාර්ව පරිසර සාධක ලෙසද හඳුන්වනු ලබයි. මෙම සාධක ඉතා පුළුල්ව පැතිර පවතී.

සූක්ෂම පරිසර සාධක ලෙස ව්‍යාපාරයේ ගණුදෙනු කරුවන්, සැපයුම්කරුවන්, තරඟකරුවන්, ආදේශක නිෂ්පාදන සපයන්නන්, අලුතින් වෙළඳපලට පිවිසීමට බලාපොරොත්තුවන්නන් හැඳන්විය හැකිය. පරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන අයුරින් භාණ්ඩ හා සේවා සැපයීම, පිරිවැය අවම කිරීම, ගුණත්වයෙන් යුත් අමුද්‍රව්‍ය නිසි පරිදි ලබා ගත හැකිවීම හා සුලභව තිබීම, තරඟකරුවන්, ආදේශක නිෂ්පාදන හා නව නිෂ්පාදකයින් අතර, තම වෙළඳපොළ කොටස රැකගැනීමට හා පවත්වාගෙන යාමට හැකිවීම ව්‍යාපාරයට අවස්ථාවක් වන අතර, ඒවා නිසි පරිදි සිදු කර ගැනීමට නොහැකිවීම තර්ජනයක් වේ. මෙම බලවේග සම්පූර්ණයෙන් පාලනය කිරීමට නොහැකි වුවත්, ව්‍යාවසායකයාට එය තරමක් දුරට පාලනය කිරීමේ හැකියාවක් ඇත.

### සාර්ව ව්‍යාපාර පරිසරය

පාරිභෝගිකයන්, ප්‍රමාණය, වයස, ජාතිය, ආගම, රැකියාව, අධ්‍යාපන මට්ටම යනාදිය ජන ව්‍යුහාත්මක පරිසර සාධකවලට අයත් වන අතර මෙය ව්‍යවසායකයන්ට ඉතා වැදගත් වේ. මෙම සාධක මත පාරිභෝගිකයන් වෙළඳපොළට පිවිසීම සිදුවේ. රටක ආර්ථික සංවර්ධනය හෝ පරිහානිය ව්‍යවසායක කටයුතු කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. උද්ධමනය, අවධමනය, රැකියා නියුක්තිය, රැකියා ව්‍යුක්තිය, ආර්ථික වර්ධනය, පාරිභෝගික ආදායම ආදිය ආර්ථික සාධකවලට අයත් වේ. මෙම සාධකවල වෙනස්වීම් ව්‍යාපාර කෙරෙහි හිතකර හා අහිතකර ආකාරයෙන් බලපානු ලබයි. ව්‍යවසායකයන් විසින් තම වෙළඳපොළ කටයුතු ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශයේ සමාජ, සංස්කෘතික පරිසරය කෙරෙහි දැඩි අවධානයක් යොමුකළ යුතුය. මෙයට

මිනිසුන්ගේ ඇදහීම්, විශ්වාස, සාරධර්ම. සිතැඟියාව (Perception) ආදිය ඇතුළත් වන අතර මෙම සංස්කෘතික සාධකවලට අදාළ වන ආකාරයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කළ යුතුය. රජයේ දේශපාලන ප්‍රතිපත්ති, ඒවා ක්‍රියාවේ නැංවීමට අවශ්‍ය නීතිරීති, දේශපාලන ස්ථාවරත්වය යනාදිය දේශපාලන හා නෛතික සාධක යටතට ගැනෙන අතර මෙම සාධක ද ව්‍යාපාර කෙරෙහි හිතකර හා අහිතකර අන්දමින් බලපෑම් ඇතිකරනු ලබයි. ස්වභාවික පරිසර සාධක ව්‍යවසායකත්වය සඳහා ඉතා වැදගත් වන අතර තම නිෂ්පාදන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය යෙදවුම් (ජලය, වාතය, ඛනිජ ද්‍රව්‍ය, දැව යනාදිය) මෙම ස්වභාවික පරිසරයෙන් ලබාගැනීමට සිදුවේ. වර්තමානයේ පරිසර දූෂණය, ජල දූෂණය ආදි වශයෙන් පරිසර දූෂණය ඉහළ යාම, වනාන්තර ක්ෂය වීම, අමුද්‍රව්‍ය හිඟවීම, ආදිය හේතුකොට ගෙන අමුද්‍රව්‍ය හා බලශක්ති පිරිවැය ඉහළ යාම වැනි ස්වභාවික පරිසර ගැටළු සහ තර්ජන රාශියකට මුහුණපා ඇති අතර එය ව්‍යවසායක කටයුතු කෙරෙහි ඉතාමත් අහිතකර ලෙස බලපානු ලබයි. තාක්ෂණික දියුණුවත් සමග නව නිෂ්පාදන සහ නව ක්‍රියාවලි සඳහා ව්‍යවසායකයන් පොළඹවනු ලැබේ. වර්තමානයේ පාරිභෝගිකයන් තොරතුරු සමාජයක් තුළ ජීවත් වන අතර දියුණු පණිවුඩ හුවමාරු ක්‍රම සහ බෙදාහැරීමේ ක්‍රම මගින් ව්‍යවසායකයන්ට තම අලෙවි ප්‍රදේශය පුළුල් කර ගැනීමට අවස්ථා සලසා දෙන අතර අභියෝග ද එල්ල කරනු ලබයි. මෙම සාර්ව පරිසර සාධක ව්‍යවසායකයන් සඳහා අවස්ථා සහ තර්ජන ඇතිකරනු ලබන අතර ව්‍යවසායකයන් සඳහා මෙම සාධක පාලනය කිරීමේ හැකියාක් නොමැත.

ඉහත සඳහන් අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක ව්‍යවසායකයන් කෙරෙහි ශක්තීන් හා දුර්වලතා මෙන්ම අවස්ථා හා තර්ජන ඇතිකරනු ලබයි. මේ හේතුවෙන් දැනට පවතින ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් මෙන්ම නව ව්‍යවසායකයන් ද තම ව්‍යාපාර සැලසුම් කිරීමේදී මෙන්ම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී ව්‍යාපාර පරිසර සාධක අධ්‍යයනය කරමින් ඊට අනුගත වෙමින් කටයුතු කිරීම ඉතාමත් වැදගත් වේ.

# 04. සෞභාග්‍යයේ දැක්ම හා සංවර්ධනය.

පී.පී.යමුනා කුමාරි
සංවර්ධන නිලධාරි

රටක සංවර්ධන ක්‍රියාදාමය තුළ එරට ජාතික ප්‍රතිපත්තිය අත්වැල් බැඳ ගමන් කරන බව රහසක් නොවේ. ලෝකයේ සෙසු රටවල් හා සැසඳීමේ දී මෙයට උදාහරණ රාශියක් අපට පෙන්වා දිය හැකිය. ඉන්දියාව හා චීනය වැනි රටවල් ඒවාට කදිම නිදසුන් වේ.

1948 වසරේ නිදහස අප රටට ලැබීමත් සමඟම සංවර්ධනය සඳහා විවිධ ප්‍රවේශයන් ලංකාව තුළ ක්‍රියාත්මක වූ බව අපට රහසක් නොවේ. ගොවිජනපද ව්‍යාපාරය, සමුපකාර ක්‍රමය, විවෘත ආර්ථිකය, මහවැලි ව්‍යාපාරය, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත, ධර්මය විශිෂ්ට සමාජයක්, ජන සවිය, ගම් උදාව, සමෘද්ධි ව්‍යාපාරය සහ දිවි නැඟුම, යහපාලනය හා සෞභාග්‍යයේ දැක්ම වැනි සංවර්ධන ක්‍රියාමාර්ග වරින්වර බලයට පත් වූ දේශපාලන ප්‍රවාහය විසින් අපට හඳුන්වා දී ඇත. නමුත් මෙවැනි සංවර්ධන ප්‍රවාහයන් රාශියක් අප රට තුළ ක්‍රියාත්මක වුවද අපිට සංවර්ධනය කරා යාමට නොහැකි වූයේ මන්ද යන්න අදටත් පවතින ප්‍රහේළිකාවක් බව නම් අමුතුවෙන් කිවයුතු කරුණක් නොවේ.

මෙවැනි පදනමක් මත පිහිටා අප රටේ සංවර්ධන ප්‍රවාහයන් ගැන කතා කිරීම කාලෝචිත ක්‍රියාදාමයක් ලෙස පෙන්වා දිය හැකිය. බලයට පත් වූ විවිධ ආණ්ඩු තම දේශපාලන ගමන්මග තරණය කිරීම සඳහා ජනතාවගේ හදවතට ආකර්ෂණය වන පරිදි විවිධ වචන මැතිවරණ ප්‍රතිපත්තිවලට යොදා ගනිමින් සිය ජයග්‍රහණ ලබාගැනීමට උත්සුක වූ බව පෙනේ.

දේශීයත්වය රැක ගනිමින් සංවර්ධනය සඳහා ජාතික නිෂ්පාදනය වෙනුවෙන් යමක් බිහි කිරීමට නොහැකි වීම තුළ අද අප රට බරපතල අර්බුදයකට මුහුණ පා ඇත. අතීතයේ ලෝකයේ පෙරදිග ධාන්‍යාගාරය වශයෙන් නම් දරා පැවති අප රටට මේ වන විට විදේශීය රටවලින් සහල් ආනයනය කිරීම තුළ අපේ සංවර්ධනය ගැන අමුතුවෙන් කිව යුතු නොවේ.

වරින්වර බලයට පත් වූ ආණ්ඩු අප රටට විවිධ සැලසුම් හා යෝජනා ඉදිරිපත් කළ ද ඒවා කාලානුරූපීව වෙනස් වෙමින් ජාතික ප්‍රතිපත්තියක් ලෙස ඉදිරියට ගෙන යාමට කිසිවකු උත්සාහය දැරුවේ නැත. ඔරුවල යකඩ කම්හල, ඇඹිලිපිටිය කඩදාසි කම්හල, ගල්ඔය සීනි කර්මාන්ත ශාලාව හා තුල්හිරියේ පෙහෙකම්හල අපට අහිමි වූ ජාතික වස්තූන් ලෙස දැක්විය හැකිය. විවෘත ආර්ථිකය බිහි වීමත්, විදේශීය වෙළෙඳපොළ හරහා ලැබුන කොමිස් වලට යටවී අපි අපේ දේශීය කර්මාන්ත රැසක් අපේ රටට අහිමි කරගත්තේ අපේම අවාසනාවට බව කිව යුතුය. කවර ආණ්ඩුවක් බලයට පත් වුවත් රටට යෝග්‍ය සංවර්ධන ප්‍රවාහයන් අඛණ්ඩව ඉදිරියට ගලායාම තුළ රටට සංවර්ධනය සිදු වන්නේ නිරායාසයෙනි. මෙම තත්ත්වය පාලකයන් අවබෝධ කර නොගැනීම තුළ සංවර්ධනයේ ගමන්මග තව තවත් ඇහිරී ගියේය. මෙහි වගකීම එක් අයෙකු අනිකාට පවරා අත සෝදා ගැනීමට උත්සාහ දැරුවද බලයට පත් වූ කිසිම රජයකට එයින් මිදීමට නොහැක. එයට සැමදෙනාම වග කිව යුතුය.

2019 වර්ෂය ලෝකයාට මෙන්ම ශ්‍රී ලංකාවට ද මුහුණ පෑමට සිදු වූ කොවිඩ් වසංගතය නිසා රටේ සංවර්ධන ප්‍රවාහය තව තවත් ආපස්සට තල්ලු වන්නට විය. රට තුළ සංචරණ සීමා, කොවිඩ් ඇඳිරි නීතිය නිසා විවිධ වකවානුවල ජනතාව නිවසට වී කාලය ගත කිරීම තුළ දේශීය නිෂ්පාදනයට දායක වීම සිදු වූයේ ඉතාමත් මන්දගාමී ස්වරූපයකින් බව කිව යුතු වේ. මේ නිසා ජනතාවගේ ආදායම අඩු වූ අතර ආදායම අඩුවීම රට තුළ විවිධ ගැටලු ගණනාවක් නිර්මාණය කිරීමට සමත් විය. ආහාර හිඟකම, සෞඛ්‍ය ගැටලු හා සාමාජීය වශයෙන් ප්‍රජාව දැඩි ලෙස පීඩා කාරී තත්වයකට පත්වූ බව පෙන්වා දිය හැක. ලෝක බැංකුවේ ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව අනුව (2011 PPP) ගත් කල ලංකාවේ දරිද්‍රතාවය 2012/13 වසරේ වාර්තා වූ 16.2% සිට 2016 වන විට එය 11 % දක්වා අඩුවී එය තවදුරටත් 2019 දී 9.2% දක්වා අඩුවී ඇත.

පශ්චාත් කොවිඩ් අර්බුදයෙන් රට යළි ගොඩනැගීමට නම් ලෝක බැංකුව පෙන්වා දෙන ආකාරයට කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම ඉහළ නැංවීම සිදු කළ යුතුය. අපේ රටේ ව්‍යුහාත්මක වෙනස්කමක් සිදු වන නමුත් මේ සිදුවන්නේ ඉතා සෙමිනි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් විශාල පිරිසක් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති අතර ප්‍රධාන සාධකයක් බවට පත්වූයේ කෘෂිකර්මය සඳහා රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර වගාවට ජනයා අනුගත කිරීමයි. මෙය කාලෝචිත ක්‍රියාවකි. වර්තමානය වන විට රසායනික පොහොර ශ්‍රී ලංකාව තුළ භාවිත වීම නිසා වකුගඩු රෝගයට ජනතාව මුහුණ දී ඇත. මේ ආකාරයට වස විසෙන් තොර ආහාර පරිභෝජනය කිරීමට අපට හැකි වේ යැයි අප මෙයින් සතුටට පත්වීමු. නමුත් මේ තත්ත්වය අප සිතූ තරම් සුබවාදී නොවුණ බව අපට පැහැදිලිව පෙන්නුම් කරයි. ජනතාවට කාබනික පොහොර භාවිතය අලුත් අත්දැකීමක් නොවුවද අපේ රට කාලාන්තරයක් තිස්සේ භාවිතා කළේ රසායනය පොහොර ය. එය අප රටේ පසට පවා කා වැදී තිබීම නිසා අප අපේක්ෂා කළ ප්‍රතිඵල ලබා ගැනීමට අපොහොසත් විය. මේ තත්ත්වය අප රටේ විවිධ අර්බුද ගණනාවක් නිර්මාණය කළේය. අවුරුදු 30කින් නිම කිරීමට සැලසුම් කළ මහවැලි ව්‍යාපාරය අවුරුදු 5 දක්වා කඩිනම් කිරීමේ අනිසි ප්‍රතිඵලවලට අදටත් අප මුහුණ දී සිටිමු. කාබනික පොහොර භාවිතය ද එසේ කඩිනම් කිරීම තුළ මෙවැනි අර්බුදකාරී පරිසරයක් නිර්මාණය වූවාට සැකයක් නොමැත.

2019 බලයට පත්වූ නව ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රතිපත්ති අතර රට ගොඩනැගීම සඳහා යෝජනා මාලාවක් ඉදිරිපත් කරන ලදී.

මේවා දස වැදැරුම් ප්‍රතිපදා ලෙස පෙන්වාදී ඇත එනම්,

1. ජාතික ආරක්ෂාවට මුල්තැන දීම.
2. මිත්‍රශීලී සහ නොවැදුනු විදේශ ප්‍රතිපත්තීන්.
3. පිරිසිදු රාජ්‍ය පාලනයක්.
4. ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්.
5. ඵලදායි පුරවැසියෙක්-සක්‍රීය මානව සම්පතක්.
6. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්
7. තාක්ෂණය මත පදනම් වන සමාජයක්
8. භෞතික සම්පත් සංවර්ධනය
9. තිරසාර පරිසර කළමනාකරණය
10. විනයගරුක, නීතිගරුක, ගුණගරුක සමාජයක්

සත්‍ය වශයෙන්ම මෙම මැතිවරණ ප්‍රතිපත්ති රටක සංවර්ධනයේ ගමන්මග වර්ධනය කර ගැනීමට උපකාරී වන බවට කිසිදු සැකයක් නොමැත. ජනතාවගේ සිතුම් පැතුම්වලට අනුගත වෙමින් ඔවුන්ගේ ජන ජීවිතය සුඛිත මුදිත කිරීම පාලකයාගේ වගකීමක් හා යුතුකමකි. නමුත් මෙම තත්ත්වය උදාකර ගැනීමට නොහැකිව අද වන විටත් අප සිටින්නේ ඉතාමත් කටුක අවධියක බව කණගාටුවෙන් වුවද ප්‍රකාශ කළ යුතුය.

සංවර්ධන ඉලක්ක කරා යාමේදී භෞතික සංවර්ධනය කෙරෙහි අවධානයක් යොමුකළ යුතු අතර එය අප රටට කෙතරම් උචිතද යන්න ගැන පුළුල් අවබෝධයක් තිබිය යුතුය. සංවර්ධනයේදී මහා මාර්ග අනිවාර්යෙන්ම ඉදි කළ යුතුය. ඒ ජනතාවගේ යහපත සඳහා මෙන්ම නිෂ්පාදනය අනු ප්‍රවාහනය සඳහා බෙහෙවින් උපකාර වනු ඇත. ලංකාව තුළ මේ වන විට විශාල වශයෙන් අධිවේගී මාර්ග ඉදි කරගෙන යමින් සිටිනු දක්නට ලැබෙමින් පවතී. මේ සඳහා විදේශීය ආයෝජකයන්ගේ දායකත්වය අප රටට නොඅඩුව ලැබෙන අතර ශ්‍රමය සඳහා විශාල වශයෙන් ඉල්ලුමක් ලැබෙමින් පවතී. මෙය හොඳ ප්‍රවණතාවයක් වුවත් මෙයින් නුදුරු අනාගතය තුළ අපට අත්විඳීමට සිදුවන දෑ පිළිබඳව විමසිලිමත් වීම ඉතාම වැදගත් කරුණකි. මේවා ණය මෙන්ම ආධාර ලැබෙන අතර මේවා පිළිබඳවද අප මනා අවබෝධයෙන් කටයුතු කළ යුතු ය. සංවර්ධනය මුවාවෙන් සිදුකරන ඇතැම් කාර්යයන් රටට ඉතාමත් අහිතකර අන්දමින් බලපාන බව කිව යුතු කරුණකි. ලෝකයේ බොහෝ රටවල් නගර නිර්මාණය හා භෞතික සංවර්ධනයට මුල පිරුවේ දේශීය නිෂ්පාදනය ඉහළ නංවා ළමයින් ජන ජීවිතය තුළ ඉහළ ආදායම් මට්ටම ලඟාකර සිටි අවධියක වන අතර අපේ රටේ මෙම තත්ත්වයට ළඟා වීමට කුමන කාලයක් ජනතාවට බලා සිටීමට සිදුවිය ද යන්න පවතින ගැටළුවකි.

වරින්වර බලයට පත්වන විවිධ දේශපාලන ප්‍රවාහයන් ඔවුන්ගේ අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා විවිධ වාග් මාලාවන් ඉදිරිපත් කර ජනතාවගෙන් බලය ලබා ගනී. ඉන් පසු ඔවුනට ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ යන්තම් හෝ මතකයක් දක්නට නොමැත. 1948 පසු බලයට පත් වූ විවිධ දේශපාලන බලවේගවල ප්‍රතිපත්ති අප රට තුළ ක්‍රියාත්මක වූවානම් අප රට සිංගප්පූරුවක් වනු නොඅනුමානය. සංවර්ධනයේදී දේශපාලකයා, රාජ්‍ය යාන්ත්‍රණය හා ප්‍රජාවගේ සහයෝගය නිරන්තරයෙන් තිබිය යුතුය. එය දම්වැලක පුරුක් මෙන් එකිනෙක අතර මනා සුසංයෝගයක් පැවතිය යුතුය. ඉන් එක පුරුකක් ගැලවී ගියහොත් දම්වැල එකින් එක ගැලවී යන්නාක් මෙන් සංවර්ධන ක්‍රියාමාර්ග ද අඩාල වනු ඇත. මෙම තත්ත්වය ජනතාව, රාජ්‍ය යාන්ත්‍රණය හා දේශපාලකයා තේරුම් නොගතහොත් සෞභාග්‍යයේ දැක්ම ද මෙරටට වරින් වර හඳුන්වා දුන් සෙසු ප්‍රතිපත්ති මෙන් සිහිනයක් වනු ඇත. මෙය යථාර්ථයක් කරගැනීමට හැමගේම සහයෝගය උනන්දුව හා කැපවීම අතිශයින්ම අවශ්‍ය බව පෙන්වා දීම යුක්ති යුක්තය.


ආශ්‍රිත ග්‍රන්ථ -

2019 ශ්‍රී ලංකා මහ බැංකුව

2019 ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන

# 05. සෞභාග්‍යමත් දේශයක පැවති මහනුවර යුගයට අයත් නිර්මාණ තාක්ෂණය (යටිනුවර කලාපයේ දේවාල කිහිපයක් ඇසුරින්).

එච්.එම්.ජී.කේ .නවරත්න
සංවර්ධන නිලධාරී

සෞභාග්‍යය යනු සශ්‍රීකත්වයයි. ඉපැරණි ශ්‍රී ලංකාවේ පැවති නිර්මාණ තාක්ෂණය අධ්‍යයනය කරලමින් වර්තමානයේ සෞභාග්‍යමත් රටක් ගොඩනැගීමටත්, සිදුව ඇති පරිහානිය අවම කරලීම මූලික කරගනිමින් මෙම අධ්‍යයනය කිරිමට බලාපොරොත්තු වෙමි. මෙහිදි යටිනුවර කලාපයට අයත් දොඩම්වල ශ්‍රී නාථ දේවාලය, දොඩම්වල පත්තිනි දේවාලය, පැලව අමරාපති දේවාලය, කැටකුඹුර කුමාරකන්ද දේවාලය නිදසුන් ලෙස භාවිතා කර ඉපැරණි නිර්මාණ තාක්ෂණය පිළිබඳව ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කරමින් විමර්ෂණයේ යෙදීමට නියමිත ය.

මෙම දේවාල සතර ඉපැරණි ඓතිහාසික කාලපරිච්ඡේදයකට අයත් මෙන්ම පුරාවිද්‍යාත්මක වශයෙන් සුවිශේෂිවූත්, දැනට වසර 400කට වඩා ඉපැරණි වුවකි. දේවාල සතරෙහිම තාක්ෂණය එක සමාන ය. මහනුවර අවධියට අයත් ගොඩනැගිලි තාක්ෂණය භාවිතා කර ඇත. මෙහිදි මහනුවර ශිල්පියා විසින් භාවිතා කළ තාක්ෂණය ප්‍රධාන වශයෙන් කොටස් 02ක් යටතේ හඳුනා ගත හැකි ය. එනම් ද්‍රව්‍යාත්මක හා ව්‍යුහාත්මක තාක්ෂණය යි.

ද්‍රව්‍යාත්මක තාක්ෂණය පිළිබඳව අවධානය යොමු කරලිමේදි මහනුවර යුගයට අයත් සෑම ගොඩනැගිල්ලක්ම ඉදි කර ඇත්තේ පොළොවෙන් ඉහළට නගින ලද පාදමක් මතය. ශ්‍රී නාථ දේවාලයේ මුළුතැන්ගෙය, දිග්ගෙය, රිට්ටාගෙය, ඉඩන්ගෙය, පත්තිනි දේවාලය, කුමාරකන්ද දේවාලය, පැලව අමරාපති දේවාල මෙයට නිදසුන් ය. මහනුවර ශිල්පියා ගොඩනැගිල්ලක අත්තිවාරම දැමීමේ ක්‍රම 02ක් භාවිතා කර ඇත. එනම් ගොඩනැගිල්ල පොළොව මත රඳවා තබා ගැනිම සඳහා අත්තිවාරම දැමීම හා ගොඩනැගිල්ලේ බර භූමියේ විශාල ක්ෂේත්‍රයක් මත සමසේ බෙදා හැරීම සඳහා අත්තිවාරම දැමීම යනුවෙනි. දේවාලවල මූලික පදනම වන අත්තිවාරම සඳහා කළුගල්, හුණු, බදාම භාවිතා කර ඇති බව නිරික්ෂණයේදි හඳුනා ගත හැකි විය. දොඩම්වල ශ්‍රී නාථ දේවාලය, රිට්ටාගෙය, දිග්ගෙය යනාදිය ගොඩනැගිලි සඳහා කළුගල් භාවිත කර ඇත. බාහිර හා අභ්‍යන්තර වශයෙන් මැටි භාවිතා කර දේවාලවල කපරාරුව නිර්මාණය කර ඇත.

ගෙබිම සඳහා ගොම මුල්කාලීනව භාවිතා කළද, පසුකාලීනව සිමෙන්ති භාවිතා කර සංරක්ෂණය සිදු කර ඇත. මේ බව අමරාපති හා කුමාරකන්ද දේවාලයේද දැක ගත හැකි ය. මහනුවර අවධියේදි බිත්ති සකස් කර ඇත්තේ මැටියෙනි. එම බදාමයට නොයෙකුත් අමුද්‍රව්‍ය මිශ්‍ර කර ගන්නා ලදි. හුඹස් මැටි, බොර පස්, දහයියා අළු, හීන් වැලි, ඉඹුල් පුළුන්, රොන්මඩ, ගල්හුණු, ගොඩපර ඉස්ම, දවුල් කුරුදු කොළත් ගත්තේ ය. මී පැණි, පොල් පැණි ආදියත් සමහර බදාම සෑදිමේදි භාවිතා කරන ලදි. (චාර්ල්ස්,1991:31.)

බිත්ති නිර්මාණය කිරිමට යොදා ගන්නා අමුද්‍රව්‍යයක් ලෙසට බදාම හැදින්විය හැක. මේවා මැටි බදාම, හුනු බදාම යනුවෙන් වර්ග කරනු ලැබේ. (පියරත්න,1982:28.)

මෙම දේවාල සඳහා මැටි බදාම භාවිතා කර ඇත. පිරිසිදු පොළොවෙන් ලබා ගත් මැටි ජලය දමා මිශ්‍ර කර, හොදින් පදම් කරගත් පසුව බිත්තිවල හුඹස් බැදිම ආදියෙන් වන අනතුරු වැළැක්විම සඳහා හැකිතාක් දුරට මැටි වල තිබෙන ලී කැබලි, කොළරොඩු, මුල් කැබලි ආදිය ඉවත් කිරිම කළ යුතු ය. එම නිසා මෙම දේවාල අදටත් ශක්තිමත්බවින් හා කල්පැවැත්මෙන් අනූන වේ. බිත්ති නිර්මාණයේදි කෙටි හා සණකම් බවින් අනූන වේ.

ගොඩනැගිල්ලක් තැනිමේදි බිත්ති වහළ මට්ටම දක්වා ඉදි නොකරනු ලබන අවස්ථාවන්හිදි වහළයේ බර ඉසිලිම සඳහා යොදා ගනු ලබන පරිමාණය 'කුළුණු' වශයෙන් හැඳින්විය හැකි ය. තනි කුළුණු හා බැඳි කුළුණු යනුවෙන් කුළුණු නිර්මාණය කිරිමේ ක්‍රම දෙකකි. (පියරත්න,1982:25,26.) දොඩම්වල නාථ හා පත්තිනි දේවාලයන්වල හා පැලව අමරාපති දේවාලය නිර්මාණයේදි කුළුණු භාවිතා කර ඇත. මේවා ෂඩස්‍රාකාර හා චතුරස්‍රාකාර යන විවිධ හැඩයන්වලින් නිර්මාණය කර ඇත. නාථ දේවාලය හා අමරාපති දේවාලයේ නිර්මිත කුළුණු සඳහා ශිල්පියා භාවිතා කළ අමුද්‍රව්‍ය මැටි හා ගඩොල් ය. එම නිසා ශක්තිමත් බවෙන් අනූන ය.

දේවාලයන්හි දොර, උළුවහු නිර්මාණය සඳහා භාවිතා කර ඇත්තේ ද දැව ය. අලංකාර කැටයමින් අනූන ශෛලමය උළුවහු දොඩම්වල නාථ දේවාලයේ ප්‍රධාන දේවාල ගෘහයට පිවිසුම් දොරටුව අසළ පිහිටා ඇත. කුමාරකන්ද හා පැලව අමරාපති දේවාලයෙහි උළුවස්ස සඳහා කළුවර ශාකයේ කඳ භාවිතා කර ඇත. මහනුවර අවධිය තුළ ශිල්පියා බහුලව දැව භාවිතා කිරිමක් දැක ගත හැකි ය. ආනන්ද කුමාරස්වාමි මහතා විසින් රචිත මධ්‍යකාලීන සිංහල කලා කෘතියෙහි සඳහන් ආකාරයට 'උඩරට වාස්තු විද්‍යාවේ ප්‍රධාන නිර්මාණ ද්‍රව්‍ය ගල් නොව දැවයි. භාරතයේ ගෙවල් තැනීම සඳහා දැව පරදවා ගල් යෙදුනු නමුදු ශ්‍රී ලංකාවේ දේශිය සම්ප්‍රදාය අවසානය දක්වාම යෙදුනේ දැවමුවා බවත් පැහැදිළිය.' (කුමාරි,2003:24,25.)

දේවාලවල වහළය පිළිබඳව අවධානය යොමු කිරිමේදි ශක්තිමත් හා කල්පැවැත්ම මූලික කරගෙන සෑම කොටසක් සඳහා දැව භාවිතා කර ඇති බව හඳුනා ගත හැකි ය. වහළ නිර්මාණය කර ඇත්තේ එක සමාන අයුරින් වීම සුවිශේෂිත ය. වහළය පැතළි හා හැඩ වහළය යනුවෙන් දෙආකාර වේ. වහළ රාමුව, යට ලී, කැණිමඩල, බාල්ක, කුරුපා, පරාළ, හී ලීය, උළු රැඳවුම් ලෑල්ල, රීප්ප, මුදුන් යටලීය, මූල පරාළය, වඩිම්බු ලෑල්ල, අගුව යනාදි වහළය සතු දැවමය අංගයන් ය. දේවාල සෙවිලිකරණය කිරිම සඳහා පෙති උළු, සිංහල උළු ද භාවිතා කළ අතර මේ සඳහා මැටි භාවිතා කර ඇත. වහළ ඉහළ පිත්තල හා මැටි අමුද්‍රව්‍ය ලෙසට භාවිතා කර කොත නිර්මාණ කර ඇත. දොඩම්වල නාථ දේවාලයේ කොත පිත්තලය. පත්තිනි හා අමරාපති දේවාලයේ කොත සඳහා මැටි භාවිතා කර ඇත.

සිතුවම් තාක්ෂණය පිළිබඳව අවධානය යොමු කිරීමේදි මෙම දේවාලවල සිතුවම් තාක්ෂණය එක සමාන ය. මහනුවර අවධියෙහි සිත්තරුන් තම සිතුවම් තාක්ෂණය නිර්මාණය කිරීම සඳහා තලය සදා ගත් ආකාරය පිළිබඳව විවිධ මූලාශ්‍රවල තොරතුරු සඳහන් වේ. මහනුවර සිත්තරා තම සිතුවම් ඇඳීම සඳහා හුණු, හුඹස් මැටි, ශාකවල මැලියම් ද මිශ්‍ර කරමින් එක ලේයර් එකක් සදා ගනී. මතුපිට ස්ථිර සිනිඳු තුනී ස්ථරයක් සකස් කිරිම සඳහා මකුළු ස්ථරය යොදනු ලබයි. (වගාච්චි,2003:28.) පසුව මකුළු මැට්ටෙන් ඉතා සියුම්ව මැද පසුව සිතුවම් ඇඳීම කරන ලදි. වරිච්චි බිත්ති මත සිතුවම් ඇඳීමට පෙර පුවක් පත්තිරු වශයෙන් ගෙන හෝ කිතුල් පටි භාවිතා කර මැටි දමා වරිච්චි ගසා බිත්ති සකසා ගෙන පසුවමෙහි සිතුවම් කරන ලදි. සෑමවිටම කලාකරුවා ස්වාභාවික පරිසරයට මූලිකත්වය දෙමින් වර්ණ රටා භාවිතා කර සිතුවම් නිර්මාණය කර ඇත. දොඩම්වල පත්තිනි දේවාලයේ සිතුවම් එයට නිදසුන් ය. සිතුවම් සඳහා ශාක මෝස්තර බහුලව භාවිතා කර ඇත. සියපත් රටා, ලියවැල් රටා, ශෛලමය හා දැව පෘෂ්ඨ මත චිත්‍රණය කර ඇත. එමෙන්ම මෙහි ප්‍රධාන වර්ණ ලෙස භාවිතා කරනුයේ රතු සහ කහ වර්ණයන් ය. තද වර්ණ කිහිපයක් සුළු වශයෙන් භාවිතා කරනු ලැබේ. (මධුමාලි,2016:17,18.)

මහනුවර යුගයට අයත් ව්‍යුහාත්මක තාක්ෂණය පිළිබඳව අවධානය යොමු කිරීමේදි දේවාල භූමියෙහි ස්වාභාවික පිහිටීම මූලික කරගෙන සියලුම අංග නිර්මාණය කර ඇත. පොළොව මට්ටමේ සිට ඉහළ සරල බොරදම් සහිත ශිලාමය තාප්පයක් හා පියගැටපෙළක් ද දක්නට ලැබේ. පාංශු ස්ථරය තුළින් කුඩා මළුවක් නිර්මාණය කර

ඇත. පසුව ගඩොල් හා සිමෙන්ති භාවිතා කර තැනූ පාදමක් මත සිලින්ඩාකාර ගල් කණු වලින් යුක්ත වූ ආලින්දයක් ද නිර්මාණය කර ඇත. මෙතැන් සිට උස්ව තනන ලද කෙටි වේදිකාවක් මත දේවාලය තුළට පිවිසීම සඳහා දොරටුවක් නිර්මාණය කර ඇත. පිවිසුම් දොරටුව අසළ ඉහළ මකර තොරණකින් හා මහනුවර යුගය නියෝජනය කරනු ලබන සිතුවම් පෙළක් ද අන්තර්ගත වේ. පසුව දේවාලයෙහි අභ්‍යන්තර ගෘහ දෙකකින් යුක්ත වේ. මේ වූ කලී දිගු බිත්ති සහිත වේ. දේවාලයට ප්‍රවිෂ්ඨ වන ස්ථානයේම ඇති ගෘහය දේවාලයට පැමිණෙන බැතිමතුන් හට රැඳී සිටිමට නිර්මාණය කර ඇත. මුළුතැන්ගෙය දේවාලයට බද්ධ කර දක්නට ලැබෙන අතරම එය පෙති හා සිංහල උළු භාවිත කර සෙවිලි කර ඇත. දේවාලය සමීපයෙහි බුදු කුටියක් ද නිර්මාණය කර ඇත. නිදර්ශන ලෙස පත්තිනි හා අමරාපති දේවාලය හඳුනා ගත හැකි ය. මෙම සියලුම දේවාලවල භූමිය නිසි භූමි කළමණාකරණයකින් යුක්තව අවබෝධාත්මකව නිර්මාණය කර ඇති බවට අධ්‍යයනයේදි මනාව හඳුනා ගත හැකි ය.

දේවාලවල වර්තමාන තත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදි අතීතයේ තිබූ පෞරාණිකත්වයට හා දේශීය අලංකරණයට හානි වී තිබිම ප්‍රබල දූර්වලතාවයකි. සෞභාග්‍යමත් දේශයක පවතින ඓතිහාසික අගය හා පුරාවිද්‍යාත්මක අගය අද දක්නට නොලැබිම අභාග්‍යයකි. ස්වාභාවික විනාශවිම් හා විශාල වශයෙන් මානව මැදිහත්විම මත විනාශ වීම දක්නට ලැබේ.

ස්වාභාවික විනාශවිම් යනු කාලයාගේ ඇවෑමෙන් සිදුවන වර්ෂාව, පතිත වන දැඩි හිරුඑළිය වැනි තත්වයන් ය. නාථ දේවාලයේ වහළ තැනින් තැන දිරාපත් වි ඇත. වහළ රිප්ප දිරා ගොස් පවතී. පත්තිනි වහළයේ අබලන් තත්වය නිසා බොහෝ කොටස් දිරාපත් වි බිම ඇද වැටීමකට ලක් වී ඇත. නිසි බලධාරියකුගේ අවධානයට ලක් වී නැත. පවතින ලද COVID – 19 වසංගත තත්වය යටතේ හා දේශපාලනික අස්ථාවරත්වය මත ද මේවා නිසි නඩත්තු ක්‍රමවේදයකට ලක් වි නැත. දොඩම්වල නාථ දේවාලය හා පැලව අමරාපතී දේවාලයේ සිතුවම් කොටස් ඉවත්ව යාම හා දුර්වර්ණ වීම ද බහුලව දැකගත හැකි ය.

මානව ක්‍රියාකාරකම් මත ද සිදු වන හානිය අතිමහත් ය. එනම්,

01. ස්වාභාවික පරිසරය වෙනස් කිරිම් - නාථ දේවාලයේ සතු නා වැටිය සංවර්ධන කටයුතු නිසා මුල් ඇද වැටී විනාශයට පත් වී ඇත.

02. විනාශ කිරිම් - නාථ දේවාලයේ මළුව වර්තමානයේ රිය පුහුණු වන පුද්ගලයන්ගේ පුහුණු කලාපයක් බවට පත් වීම හා දේවාලය අසළින් වර්තමානයේ කඩයක් ඉදි කර තිබිම.

03. නව ඉදි කිරිම් - දොඩම්වල නාථ දේවාලයේ දිග්ගෙයට ආසන්නයේ බස්නායක නිලමේවරයාගේ කාර්යාලයක් නිර්මාණය කර ඇත. මෙම නිසා මුල් ස්වරූපයට මුළුමනින්ම හානි දායක වී ඇත.

04. සොරකම් කිරිම් - දේවාලය සතුව පවතින ඉපැරණි භාණ්ඩ විනාශ වී තර්ජනයකට ලක් වී ඇත. පත්තිනි දේවාලය සතු ඉපැරණි විසිතුරු උපකරණ සොරුන් විසින් සොරකම් කර ඇත.

05. නවීන සිතුවම් එකතු කිරිම - වර්තමානයේ පත්තිනි හා පැලව අමරාපතී දේවාලයේ නවීන සිතුවම් චිත්‍රණය කර ඇත. මෙමගින් මුල් ස්වරූපයට හානි වී ඇත.

06. නවීන කැටයම් එකතු කිරිම.

07. නවීන අංගයන් එකතු කිරිම .

08. වර්ණ ගැන්වීම් - කිසිදු අවබෝධයකින් තොරව සිතුවම් වර්ණ ගන්වා ඇත. නාථ දේවාලයේ පිවිසුම් මාර්ගයෙහි දෙපසින් නිර්මාණය කර ඇති ඇත් රූප ද්විත්වය සිතුවම් කර ඇති නිසා හානි වී ඇත.

**මෙම විනාශය අවම කිරිම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග.**

01. නව ඉදිකිරීම් සිදු කිරීමේදී දේවාලයේ පුරාවිද්‍යාත්මක අගයට හා ඓතිහාසිකත්වයට හානි නොවන පරිදි ඉදිකිරීම් සඳහා පුරාවිද්‍යා නිලධාරින්ගේ උපදෙස් මත සිදු කිරිම.

02. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මසකට වරක්වත් විනාශ වි ඇති ස්ථාන අධික්ෂණය කර විනාශකර ඇති තත්වයන් පවතී නම් අවම මැදිහත්වීම යටතේ විනාශය අවම කිරීම සඳහා සංරක්ෂණය කිරිම.

03. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් දැනුවත් කිරීමකින් තොරව පෞරාණිකත්වයට හානි නොවන පරිද්දෙන් කටයුතු නොකිරීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරිම.

04. දේවාල සතුව පවතින පුරාවස්තු සඳහා ආරක්ෂක විධිවිධාන ඇති කිරිම.

**ඉපැරණි පෞඪ ඉතිහාසයක් හිමි මහනුවර සම්ප්‍රදායට අයත් නිර්මාණ තාක්ෂණය සෞභාග්‍යමත් දේශයක් ගොඩනැංවීම සඳහා නව යෝජනා.**

01. දේශිය හා විදේශීය සංචාරකයින් බහුලව ගැවසෙන ස්ථානයක් වන දුම්රිය නැවතුම්පලවල් ආදි ස්ථානවල තොරතුරු රැගත් පුවරු, මාර්ග සිතියම් පුවරු හා මගපෙන්වීම් පුවරු සවි කිරීම. මෙමගින් රටේ සංචාරක කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක කර වර්තමානයේ තිබෙන ආර්ථික අර්බුදයට ද විසඳුම් ලබා දිය හැකි ය.

02. දෙස් විදෙස් ප්‍රජාව දැනුමෙන් හා ආකල්ප, අදහස්වලින් පිරිපුන් පිරිසක් බවට පත් කිරිම.

03. දේවාලවල පෞරාණිකත්වය විදහා දක්වන ලද ඉපැරණි පුරාවස්තු පිළිබඳව ජනතාව දැනුවත් කිරිම හා ජනතා ප්‍රදර්ශනයට නතු කිරිම.

මෙමගින් දේවාලවල පෞරාණිකත්වය විනාශවිම වලක්වා ගනිමින් ලංකාවේ ප්‍රධාන ආර්ථික උත්පාදන මාර්ගයක් වන සංචාරක කර්මාන්තය වර්ධනය කර ගත හැකි ය. මෙහි ප්‍රතිඵලයක් ලෙසට රටට මුල්‍යාධාර ලැබී වර්තමානයේ පවතින මුල්‍ය හිගයට ද විසඳුම් ලබා දිය හැකි ය.

ලක්දිව මහගු සම්පතක් වන මෙම ඓතිහාසික උරුමය සුරක්ෂිතව මීළඟ පරම්පරාවට සුරක්ෂිතව දායාද කිරිම අප සැමගේම යුතුකමකි. එවිට සෞභාග්‍යමත් රටකට අවශ්‍ය ආකල්ප වලින් හෙබි පරිපුර්ණ වු අනාගත පරපුරක් බිහිවිම නොඅනුමාන ය.

ආශ්‍රිත ග්‍රන්ථ

01.පියරත්න,සුගත්. (1982). ගෘහ නිර්මාණ ශිල්පය. කුරුණෑගල: සරසවි මුද්‍රණ ශිල්පින් සහ ප්‍රකාශකයෝ

02.චාර්ල්ස්, ඇස්.පී. (1991 මාර්තු). 'මහනුවර යුගයේ විහාර බිතුසිතුවම් සඳහා ගැණුනු සායම් තෙලිකුරු හා බදාම'. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ කලා සගරාව . 31.

03.කුමාරි, මානෙල්. එම්.ආර්. (2002.08.07). 'ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ සඳහා දැව භාවිතයේ ඓතිහාසික පසුබිම'. ජාතික පුරාවිද්‍යා සමුළුව. 24,25.

04.වගාච්චි, ඩයස්. (2002.08.07) . 'මහනුවර අවධියේ මැටි බදාම පිළිබඳව විශ්ලේෂණය'. ජාතික පුරාවිද්‍යා සමුළුව.28.

05.මධුමාලි, රංගිකා ඒ.කේ. (2016). ‘පහතරට බිතුසිතුවම් කලාව හා සිත්තරුන්’ . Proceeding of the National archaeology Symposium . 17,18.

# 06. ඉන්දියාවේ ග්‍රාමසංවර්ධන උපාය මාර්ග.

එස්. එම්.යූ.බී. සමරකෝන්

පුහුණු හා පර්යේෂණ නිලධාරී

ප්‍රමාණය අතින් ලොව සත්වන තැන භාරතයට හිමිවෙයි. බිලියන 1.18 ක ජනගහනයක් සහිත මෙම රට චීනයට පසුව වැඩිම ජනතාවක් වෙසෙන රට වන අතර ප්‍රජාතන්ත්‍රවාදී රටවල් අතුරින් වැඩිම ජනගහනයක් සහිත රටයි. දකුණෙන් ඉන්දියන් සාගරයෙන් ද, බටහිරින් අරාබි මුහුදින් ද, නැගෙනහිරින් බෙංගාල බොක්කෙන් ද වට වී ඇති භාරතය බටහිරින් පකිස්තානයෙන් ද, උතුරින් චීනය, නේපාලය සහ භූතානය යනරටවලින්ද, නැගෙනහිරින් බංගලාදේශයෙන් සහ බුරුමයෙන් ද මායිම් වී ඇත. ඉන්දියන් සාගරයේ පිහිටි ශ්‍රී ලංකාව සහ මාලදිවයින ද භාරතයට ආසන්න ව පිහිටයි. භාරතයට අයත් අන්දමන් සහ නිකොබාර් දූපත් ඉන්දුනීසියාවේ සුමාත්‍රා දූපතට ආසන්නව පිහිටා ඇත. භාරතය සතුව කිලෝමීටර් 7,517ක මුහුදු තීරයක් පවතියි.

18 වන සියවස මුල්භාගයේදී බ්‍රිතාන්‍යය හා නැගෙනහිර ඉන්දීය වෙළෙඳ සමාගම මගින් එක්සත් රාජධානියට අයත් කොළණියක් ලෙස ඇදා ගන්නා ලද ඉන්දියාව අවිහිංසාවාදී අරගලයකින් 1947 නව නිදහස් දුප්පත් ඌණ සංවර්ධිත රටක් ලෙස නිදහස ලැබීය. ඒ වන විට ආදායම, වත්කම් හා සම්පත් අයිතිය අතින් ලෝකයේ ඉතා දිළිඳු රටක් වූ අතර බ්‍රිතාන්‍ය කිරුලේ මුදුන් මිණ ලෙස සැලකනු ලැබීය.

ඉන්දියාවේ ජනගහනයෙන් 67%ක් දුගී භාවයෙන් පෙළෙන අතර වසරකට ඉන්දියානු රුපියල් 10,000 කට අඩුවෙන් උපදවයි. මෙම 67% දුප්පතුන් මිලියන 899 (899,483,513) ක්. එනම් ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය වූ මිලියන 20 සේ 43 ක ගුණයක් දුප්පතුන් ලෙස ඉන්දියාවේ ජීවත් වේ.

වර්තමාන ඉන්දියාවේ ආර්ථිකය තුළ ඉතා විශාල පිම්මක් ඇති වී ඇති අතර වර්තමාන ලෝකයේ මිලදී ගැනීමේ ශක්තියේ ප්‍රභේදයට සාපේක්ෂව ලෝකයේ සිව්වන සහ ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය ඇති රට බවට පත් වී ඇත. එහි ආර්ථික ක්‍රියාකාරකම් විවිධාකාර වේ. කෘෂිකර්මාන්තය, ශිල්පීය කර්මාන්ත, රෙදිපිළි, සේවා යනාදිය ප්‍රධාන තැනක් උසුලයි. ඉන්දියානු ආර්ථිකයේ වර්තමාන ක්‍රියාකාරිත්වයට බොහෝ දුරට හේතු වී ඇත්තේ 1991 දී ලිබරල්කරණය, පුද්ගලීකරණය සහ ගෝලීයකරණය වැනි ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමයි. සුදුසුකම් ලත් ශ්‍රම බලකායක්, ස්වාභාවික සම්පත්, දේශීය වෙළඳපොළක් සහ ආර්ථික ශක්තියක් ඇති බැවින් ඉන්දියාව ආයෝජනය කිරීමට හා ව්‍යාපාර කිරීමට වඩාත් ආකර්ශනීය ගමනාන්තයක් ලෙස සංලක්ෂිත වේ. මෙරට වැදගත් ආර්ථික ක්‍රියාකාරකමක් වන්නේ කාර්මික අංශය ඉංජිනේරු, මෝටර් රථ, වානේ, ජෛව තාක්‍ෂණය, ඖෂධ නිෂ්පාදන, ආහාර සැකසීම, පතල් හා ඛනිජ ලවණ, පොහොර යනාදියයි. මෙයින් මෝටර් රථ කර්මාන්තය කැපී පෙන්. එය ලොව දෙවන විශාලතම යතුරුපැදි නිෂ්පාදකයා වන අතර පස්වන විශාලතම වාණිජ වාහන නිෂ්පාදකයා මෙන්ම විශාලතම ට්‍රැක්ටර් නිෂ්පාදකයා ද වේ.

එසේම ඖෂධ කර්මාන්තය, යනු ලොව විශාලතම හා වඩාත්ම දියුණු එකකි. එය ලොව පුරා සමාගම් විසින් කරනු ලබන ආයෝජන සඳහා ව්‍යාපාරික අවස්ථා ද ලබා දෙයි.

ඉන්දියාවේ සිත්ගන්නා සුලු ලක්ෂණයක් වන්නේ එහි විදුලි සංදේශ ජාලයයි, ලෝකයේ තුන්වන විශාලතම සමාගම ලෙස සලකනු ලබන අතර, ඒ අතරම, ඔවුන් සතුව ඇති වඩාත්ම සම්පූර්ණ තාක්‍ෂණික උපකරණ හේතුවෙන් ආසියාවේ නැගී එන දෙවන විශාලතම ආර්ථිකය වේ.

**ග්‍රාමසංවර්ධනය උදෙසා ඉන්දියාවේ ක්‍රියාත්මක වූ වැඩසටහන්.**

ග්‍රාමසංවර්ධනය යනු ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය සහ ආර්ථික යහ පැවැත්ම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියයි. 2011 සංගණනයට අනුව ජනගහනයෙන් 68.84%ක් ජීවත් වන්නේ ගම්වලය. ග්‍රාමීය අංශයේ පසුගාමීත්වය ආර්ථිකයේ සමස්ත ප්‍රගතියට විශාල බාධාවක් වනු ඇත. ඉන්දියාව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික රටක් වන අතර ගොවිතැන ඔවුන්ගේ ප්‍රධාන රැකියාවයි

සංකල්පයක් ලෙස ග්‍රාමසංවර්ධනය විස්තීර්ණ සහ බහුමානවේ. එනම් කෘෂිකර්මාන්තය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. මෙය විවිධ භෞතික, තාක්ෂණික, ආර්ථික, සමාජ-සංස්කෘතික සහ ආයතනික සාධක අතර අන්තර් ක්‍රියාවල ප්‍රතිඵලයකි.

1.ආර්ථික මානය (Economic Dimension)

දුප්පත් සහ අඩු ආදායම්ලාභී කුටුම්භ සඳහා ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සහ ධාරිතාව ලබා දීම.

2.සමාජ මානය (Social Dimension)

දිළිඳු සහ අඩු ආදායම්ලාභී පවුල්වල සමාජ සංවර්ධනයට සහාය වීම.

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය.
- කාන්තා සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම.
- අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (Vulnerable Group) සඳහා සමාජ ආරක්ෂණය.

3.දේශපාලන මානය (Political Dimension)

ග්‍රාමීය ප්‍රදේශවල දුප්පත් සහ අඩු ආදායම්ලාභී ජනතාවට ග්‍රාමීය මට්ටමේ දේශපාලන ක්‍රියාවලීන්ට ඵලදායී හා සමානව සහභාගී වීමේ අවස්ථා වැඩි දියුණු කිරීම.

ඉන්දියාවේ ග්‍රාමසංවර්ධන ප්‍රතිපත්ති.
(Rural development policies in India)

ඉන්දියාවේ ප්‍රධාන ග්‍රාමසංවර්ධන ප්‍රතිපත්ති හතක් (The seven major rural development policies) ක්‍රියාත්මක වේ.ඒවානම්,

1. ඉඩම් ප්‍රතිපත්තිය -Land Policy
2. තාක්ෂණ ප්‍රතිපත්තිය -Technological Policy
3. කෘෂිකර්ම ප්‍රතිපත්තිය -Agricultural Policy
4. රැකියා ප්‍රතිපත්තිය -Employment Policy
5.අධ්‍යාපන, පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ප්‍රතිපත්තිය -Education, Research and Extension Policy
6. ග්‍රාමීය කර්මාන්ත ප්‍රතිපත්තිය -Rural Industries Policy

7. මිල ප්‍රතිපත්තිය -Price Policy

යනාදියයි. ඒ අනුව මෙම ප්‍රතිපත්ති ඔස්සේ ග්‍රාමසංවර්ධන වැඩසටහන් හරහා ඉන්දියාව සංවර්ධනයේ නිම්වළලු පසුකරමින් සිටී.

# 07. සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීමේ දී බලශක්තිය භාවිතයේ ප්‍රජා වගකීම.

*ජී.ජී.එස් බණ්ඩාර*
*පුහුණු හා පර්යේෂණ නිලධාරි*

රටක සංවර්ධනයේදී එරට බලශක්ති භාවිතය තීරනාත්මක සාධකයක් ලෙස හඳුනාගත හැකිය. ලෝකයේ සංවර්ධිත යැයි හඳුනාගන්නා බොහෝමයක් රටවල් තම බලශක්ති අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන නිසි කළමනාකරණයකින් යුතුව භාවිත කරන බව කිව හැකිය. නමුත් සංවර්ධනය වෙමින් පවතින බොහෝමයක් රටවලට බලශක්තිය කළමනාකරණය ගැටලුවක්ව පවතී.

තරඟකාරි ලෝකයේ රටක නිෂ්පාදන ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාව රදා පවතින්නේ බලශක්තිය භාවිතය මතයි. නවීන තාක්ෂණය භාවිතයේ දී බලශක්තිය තීරනාත්මක සාධකයක් ලෙස හඳුනාගත හැකිය. වර්ථමාන ශ්‍රී ලංකාවේ බලශක්ති නිෂ්පාදනයේ දී වැඩි ප්‍රතිශතයක් ඛනිජ තෙල් සහ ගල්අඟුරු භාවිතයෙන් සිදුකරනු ලබන අතර, මෙම තත්වය සෘජු ලෙසම ආනයන වෙළදාම හා රඳා පවතී. එලෙසම ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් ඛනිජ තෙල් ආනයනය සඳහා වැයකරයි. මීට අමතරව බලශක්ති ප්‍රභවයක් ලෙස ගල් අඟුරු වැනි බලශක්තිය නිෂ්පාදනයට යොදා ගන්නා ද්‍රව්‍ය ගෙන්වීම සඳහා ද සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරයි.

සූර්ය ශක්තිය, සුලං බලය, සාගර තරංග, ආදී පුනර්ජනනීය ප්‍රභවයන් මගින්ද බලශක්තිය නිපදවන අතර මෙහිදී ඉතා ඉහළ තාක්ෂණික ක්‍රම භාවිත කිරීමට සිදුවන බවද, කිව හැකිය. ඒ අනුව අප රට සතු බලශක්ති ප්‍රභවන් මොනවාද ? අප රටට වඩා වාසිගෙන දෙන බලශක්ති ප්‍රභවයන් මොනවාද ? ඒවා ප්‍රයෝජනයට යොදා ගැනීමේදී මුහුණ දීමට සිදුවන ගැටලුකාරී තත්වයන් මොනවා ද ? එම ගැටලුකාරී තත්වයන් අවම කරගන්නේ කෙසේද ? යන්න සොයා බැලීම මෙහිදී වැදගත්ය.


විශේෂයෙන්ම බලශක්තිය කළමනාකරණය පිළිබඳව සැලකීමේදී නිපදවීම, බෙදාහැරීම, පරිභෝජනය යන අංශ පිළිබඳව වැඩි අවධානයක් ගත යුතු අතරම බලශක්තිය කළමනාකරණය මෙහිදී ඉතා වැදගත් සාධකයක් ලෙස හඳුනාගත හැකිය. රටේ බලශක්ති පරිභෝජනය ක්‍රමිකව ඉහළ යන අතර, වාර්ෂිකව විශාල ලෙස මෙය ඉහළ යන බව විදුලි බල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන දෙස බැලීමේදී පෙනී යයි. 2018 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ බලශක්තිය පරිභෝජනය කරන පවුල් ඒකක 6354000 ක් වූ අතර එම සංඛ්‍යාව 2019 වර්ෂයේදී 6501000 දක්වා වැඩි වූ අතර, ඒ අනුව වාර්ෂිකව බලශක්තිය පරිභෝජනය ඉහළ යන බව කිව හැකිය. විවිධ ක්ෂේත්‍රවල විවිධ කටයුතු සඳහා බලශක්තිය පරිභෝජනය කරන අතර, උදාහරන ලෙස ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ 2018 සහ 2019 වර්ෂවල බලශක්තිය අලෙවිය පහත පරිදි සාරාංශකොට දැක්විය හැක.

## මුලු අලෙවිය (ලංවිම ගිගාවොට් පැය) ලංවිම.


| අනු අංකය | විස්තරය | 2018 | 2019 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| 01 | ගෘහස්ථ හා ආගමික | 4,641 | 4,863 | 640 | 692 |
| 02 | කර්මාන්ත | 4,290 | 4,392 | 288 | 292 |
| 03 | පොදු සේවා හෝටල් | 3,412 | 3,563 | 617 | 640 |
| 04 | වීදි ආලෝක කිරීම. | 108 | 109 | 21 | 21 |
| 05 | ලංකා විදුලිබල සමාගම | 1,640 | 1,684 | | |

මෙ අනුව සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ බලශක්තිය අලෙවියේ වැඩි ප්‍රමාණයක් පරිභෝජනය කරන්නේ ගෘහස්ථ සහ ආගමික ස්ථාන සඳහාය. ඒ අනුව බලශක්ති පරිභොජනය පිළිබඳව ගෘහස්ථ පරිභෝගික හැසිරීම එසේ නැතිනම් ගෘහස්ථ බලශක්ති ඉල්ලුම රටේ බලශක්තිය කළමනාකරණය කිරීමේදී සෘජු බලපෑමක් ඇති කරයි. ඒ අනුව කළමනාකරණයකින් යුතුව ගෘහ ඒකකවල බල ශක්තිය පරිභෝජනය සමස්ත බලශක්ති ඉල්ලුම අඩුකර ගැනීමට විශාල පිටුවහලක් සපයයි. එක් අතකින් එය රටේ විදේශ විනිමය ඉතිරි කර ගැනීමට සෘජුවම බලපෑමක් ඇති කරයි. එයට හොඳම උදාහරණය වන්නේ දැනට ශ්‍රී ලංකාවේ අයවැයෙන් 45% ක් වැය වන්නේ බලශක්තිය ආනයනය කිරීම සඳහාය යන්නයි. ඊට හේතුව වර්තමානය වනවිට බලශක්ති නිෂ්පාදනයෙන් විශාල ප්‍රතිශතයක් ඩීසල්, ගල්අඟුරු, ඇඩි තෙල් , ආදී ආනයනික ඛනිජ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවීමයි.

## 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදන සංයුතිය.



**2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදන සංයුතිය.**




ඉහත 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේ විදුලිබල උත්පාදන සංයුතිය පිළිබඳව සලකා බැලීමේදී 2018 වර්ෂයේ 33.5% ක ජලවිදුලි උත්පාදන දායකත්වයක් මේ සඳහා සැපයු නමුත් 2019 වර්ෂයේදී එම තත්වය 23.8% දක්වා පහත වැටී ඇති බව පෙනේ. ඒ සමගම ද්‍රව ඉන්දන භාවිතය 23.6% සිට 31.6% දක්වා ඉහළ ගොස් ඇතිබව පෙනීයයි. තවද ගල් අඟුරු භාවිතය 31% සට 33.8 % දක්වා ඉහළ ගොස් ඇති බව පෙනී යයි. මේ අතර සාම්ප්‍රදායික නොවන ඉන්දන භාවිතය 11.9% සිට 10.8 දක්වා පහළ ගොස් ඇත. මේ අනුව සමස්තයක් ලෙස ගත් කල ඉතා ඉහළ විදේශ විනිමයක් වැය කරන ද්‍රව ඉන්ධන සහ ගල් අඟුරු භාවිතයේ ඉහළ යාමක් සිදු වී ඇත. ඊට සමානුපාතිකව ජල විදුලිය භාවිතය සහ සාම්ප්‍රදායික නොවන ඉන්ධන භාවිතය අඩු වී ඇත.

මෙහිදී සම්ප්‍රදායික නොවන බලශක්තිය ලෙස සුලං, සූර්යය, සාගර තරංග, ආදී ප්‍රභවයන් පරිභෝජනය සඳහා ප්‍රජාව අවධි කිරීමත් ඒ සඳහා පෙලඹවීමත් , ඒ සඳහා ගෘහ ඒකක වෙත පහසුකම් සැපයීම හා අභිප්‍රේරණ ක්‍රම භාවිත කිරීම තුළ සාම්ප්‍රදායික නොවන ක්‍රම සඳහා ප්‍රජාව යොමු වීමට රුකුලක් වේ. මේ සඳහා ප්‍රජාව සතු අවබෝධය සහ දැනුම වර්ධනය කිරීම ඉතාම වැදගත් සාධකයක් ලෙස සැළකිය හැකි අතර ග්‍රාමීය මට්ටමේ, වසම් මට්ටමේ, මේ සඳහා යොමුවිය හැකි විභවයන් ඇති පිරිස් හඳුනා ගැනීම හා ඒ සඳහා නිසි සැලැස්මකින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින්, වැඩසටහන් සිදු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

තවද දැනට බලශක්තිය නිසි කළමනාකරණයකින් යුතුව ඉතාම කාර්යක්ෂමව හා ඵලදායීව පරිභෝජනය කරන්නේ කෙසේද ? යන්න පිළිඳව ප්‍රජාව දැනුවත් කිරීමේ හා පෙළඹවීමේ ක්‍රමයක් ග්‍රාමීය මට්ටමින් සිදු කිරීම මගින් බලශක්තිය උපරිම වාසිසහගත ලෙස පාරිභෝජනයට ප්‍රජාව හුරුකිරීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ගෘහ ඒකක ලෙස බලශක්තිය පරිභෝජනයේදී අත්කරගත හැකි වාසි පිළිබඳව අවබෝධකර ගැනීමට ඒ අය පෙළඹවීමත් සිදු කිරීම කල යුතුව ඇත. ඒ සඳහා ග්‍රාමීය ප්‍රජා සංවිධානවල දායකත්වය ලබා ගතහැකි අතර ග්‍රාමීය මට්ටමේ ප්‍රජා නායකයින් මෙන්ම බිම් මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහයෝගයද ලබා ගත හැකිය. මේ අනුව මේ අයගේ දැනුම සහ ආකල්ප වඩාත් සුභදායක ලෙස වෙනස් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම වඩාත් ප්‍රතිඵල දායකවනු ඇත. ඊට අමතරව මෙහිදී මාධ්‍ය භාවිතය ද ඉතා ඵලදායි ලෙස යොදාගත හැකි අතර, ඒ සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙලක අවශ්‍යතාවය කඩිනමින් අවශ්‍ය වී ඇත.

# 08. රට නගන පෙර දැක්ම හා ජනතා කේන්ද්‍රීය ස්වයංපෝෂිත ආර්ථිකයක්.

*තිලක් ගංගොඩ*
*සංවර්ධන නිලධාරී.*

"ඔබ ඔබේ යුතුකම ඉටුකරන්න. මම මගේ යුතුකම ඉටුකර සුරක්ෂිත රටක් හා සෞභාග්‍යමත් දේශයක් ගොඩනගන්නෙමි."

අද වන විට ලොව සියලු රජයන්ගේ ප්‍රධාන වගකීම වී ඇත්තේ දුප්පත්කම හා ඇති නැති පරතරය නැති කිරීමයි. වස විෂ නැති ගොවිතැන සුලභ කර නිරෝගී ජනතාවක් බිහිකිරීම, සැමට හොඳ අධ්‍යාපනයක් ලබාදීම, පිරිසිදු වතුර සහ පිරිසිදු බලශක්තිය සැමදෙනාටම ලබාදීම, තරුණයන්ට හරිත කර්මාන්ත හරහා හරිත රැකියා ලබාදීම, මිනිස් වාසයට සුදුසු හරිත නගර ඉදිකිරීම, සකසුරුවම්කමට හුරු ජනතාවක් බිහිකිරීම, කාන්තාවන්ට සාධාරණ ඉඩක් ලබාදීම, දේශගුණ විපර්යාස හා සාගර දූෂණය වැළැක්වීම, ජෛව විවිධත්වය රැකගැනීම සහ සාමය රජයන සමාජයක් බිහිකිරීම ආදී එක්සත් ජාතින්ගේ තිරසාර ඉලක්ක 17 සපුරාගැනීමය.

ඒ සඳහා දසවැදෑරුම් ප්‍රතිපත්තිය යොදා ගනී.

1. ජාතික ආරක්ෂාවට මුල්තැන.
2. නොබැඳුනු විදේශ ප්‍රතිපත්තිය.
3. පිරිසිදු රාජ්‍ය පාලනය.
4. ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය.
5. ඵලදායි පුරවැසියෙක්.
6. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්.
7. තාක්ෂණය මත පදනම්වන සමාජයක්.
8. භෞතික සම්පත් සංවර්ධනය.
9. තිරසාර පරිසර කළමනාකරණය.
10. විනයගරුක ,නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

යනාදියයි.

**ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්.**

පොදුජනතාවට බරක් නොවූ දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් කර ආර්ථිකය කඩා විනාශ කිරීම බොහෝ විට වත්මනෙහි සිදුව ඇත. දේශීය ව්‍යාපාරිකයා ගොඩගැනීම සඳහා අවශ්‍යවන්නේ වේගයෙන් වැඩකරන රටකි. ඒ සඳහා වන නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති රජය සතු විය යුතුය. එම වැඩපිළිවෙල දැනටමත් සකස්කර අවසන්ය. එහෙත් ඒ සඳහා පළමුව දේශීය ව්‍යාපාරිකයන් මුහුණදී ඇති අර්බුදයෙන් ඔවුන් ගොඩගත යුතුය. ඒ සඳහා ඔවුනට අවශ්‍ය සියලු පහසුකම් මුල් වසර කිහිපය තුළ ලබා දී ඇත. සැම පුරවැසියෙකුටම නිශ්චිත ආර්ථික ස්ථාවරත්වයක් දියුණුවීමේ සමාන අවස්ථා සහ ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අයිතිය ස්ථාවර කිරීම සඳහා ජනතා කේන්ද්‍රීය ආර්ථික සංකල්පය මත නිබඳව පෙනී සිට ඇත. ඒ සඳහා වන කඩිනම් ජීවන වැඩසටහනට අමතරව අරමුණ ධනපතීන්ට වඩා පොදුජනතාව නගාසිටුවීමය. ඒ සඳහා සූදානමය.

මේ යටතේ පහත අංශ කෙරෙහි අවධානය යොමුකරයි

1. සැලසුම්කරණය සහ ගබඩාකිරීම
2. අලෙවිය සහ ප්‍රවාහනය
3. කෘෂි නවෝත්පාදන පර්යේෂණ
4. අපනයන භෝග වගාව
5. කුරුඳු වගාව
6. ගම්මිරිස් වගාව
7. පොල් වගාව
8. ධීවර කර්මාන්ත සවිබලගැන්වීම
9. මස් සහ බිත්තර අපනයන කර්මාන්තයන් ලෙස සංවර්ධනය කිරීම
10. කිරෙන් සපිරෙන රටක්

**ගම්මිරිස් වගාව.**

සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්තිය යටතේ ස්වයංපෝෂිත ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් යන මැයෙන් විවිධ අපනයන භෝග ගැන කතාකරයි. මෙහිදී ස්වයංපෝෂිත ආර්ථිකයක් සඳහා ගම්මිරිස් වගාව පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරමි. ගුණාත්මක තත්වයෙන් ඉහළ ගම්මිරිස් නිෂ්පාදනයට අවශ්‍ය තාක්ෂණික දැනුම ගොවියාට ලබාදීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු අතර ගම්මිරිස් වගාව පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ

**ගම්මිරිස් වගාවේ ඉතිහාසය.**

“කුළුබඩු වල රජ” ලෙස හැඳින්වෙන ගම්මිරිස් ලෝකයේ බහුලවම භාවිතා වන කුළුබඩු වර්ගයක් වේ. ගම්මිරිස් වගාව දකුණු ආසියාවට ඒකදේශික වන අතර ඓතිහාසික වාර්තාවලින් හෙළි වන්නේ ගම්මිරිස් දකුණු ඉන්දියාවේ සම්භවය වූ බවයි. “කළු රත්රන්” ලෙසද නිතර හැඳින්වූ ගම්මිරිස් කරල් ඉතා වටිනා වෙළඳ භාණ්ඩයක් වූ අතර එය බොහෝ විට මුදල් ලෙසද භාවිතා විය. මධ්‍යතන යුගයෙන් පසුව යුරෝපයේ, මැදපෙරදිග හා උතුරු අප්‍රිකාවේ දක්නට ලැබෙන කළු ගම්මිරිස් සියල්ලම පාහේ පැමිණියේ ඉන්දියාවේ මලබාර් ප්‍රදේශයෙන් ය. ඉන්දියාවට මුහුදු මාර්ගයක් සොයා ගැනීමට යුරෝපීය ප්‍රයත්නවලට තුඩු දුන් හේතුව වූයේ මෙම කුළුබඩුවේ ඉහළ වටිනාකම වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාව යුරෝපීය යටත් විජිතකරණයට ලක්වීම ද යුරෝපීයයන් ඇමරිකා එක්සත් ජනපදය සොයා ගැනීම සහ ඒවා යටත් විජිත බවට පත්කර ගැනීම ද සිදුවිය. වියට්නාමය, ඉන්දුනීසියාව, මැලේසියාව, ඉන්දියාව සහ බ්‍රසීලය ලෝකයේ ප්‍රධාන ගම්මිරිස් නිෂ්පාදකයින් වේ..

**ගම්මිරිස් නිෂ්පාදන සහ ප්‍රයෝජන.**

මුළු ඵලයම වියළීම මගින්, ගම්මිරිස් බොහෝ දුරට කළු ගම්මිරිස් ලෙස නිපදවනු ලැබේ. පිටත ගම්මිරිස් ඵලාවරණය ඉවත් කිරීමෙන් සුදු ගම්මිරිස් නිපදවන අතර කැබලි කරන ලද හා ඇඹරූ ආකාරවලින් ද ලබා ගත හැකිය. හරිත හා ඉදුණු ගම්මිරිස් කුඩා ප්‍රමාණයක් ලුණු අච්චාරු දැමීම සිදු කරන අතර, විජලනය කළ අමු ගම්මිරිස්

සහ කල්තබා ගැනීමට සකස් කළ ඉදුණු ගම්මිරිස් ද වෙළඳාම සඳහා භාවිතා කරයි. ගම්මිරිස් තෙල් සහ ඔලියෙරොසින් ද අගය එකතු කළ නිෂ්පාදන ලෙස අලෙවි කරනු ලැබේ.

ගම්මිරිස් ප්‍රධාන වශයෙන් ආහාර කර්මාන්තයේ දී කුළුබඩුවක් සහ රසකාරකයක් ලෙස භාවිතා කරයි. තවද එය සුවඳ විලවුන් හා ඖෂධ කර්මාන්තවල භාවිතයක් ද ඇත.

**ප්‍රධාන වගා කරන ප්‍රදේශ.**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් ගම්මිරිස් වගා කරනු ලබන්නේ පහතරට හා මැදරට තෙත් සහ අතරමැදි කෘෂි දේශගුණික කලාපවල ය. ශ්‍රී ලංකාවේ ගම්මිරිස් ප්‍රමාණය හෙක්ටයාර 42,989 ක් පමණ වන අතර මාතලේ, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර, මොණරාගල සහ කුරුණෑගල ගම්මිරිස් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වේ.

**ගම්මිරිස් ප්‍රභේද.**

කළු ගම්මිරිස්වල සම්භවය ඉන්දියාවේ මලබාර් වෙරළ තීරය ආශ්‍රිතව සිදු වූයේ යැයි විශ්වාස කළද, ශ්‍රී ලංකාව ද වල් ගම්මිරිස් වර්ග ගණනාවක නිවහනකි. ශ්‍රී ලංකාවෙන් හමු වූ P. nigrum L හි විශාල ජාන විචල්‍යතාවය සහ ගම්මිරිස් වල් භේදවලට ඥාතීත්වයක් පැවතීම සැලක්ල්ලට ගන්නා විට, ශ්‍රී ලංකාව ද ගම්මිරිස්වල නිජබිමක් ලෙස විශ්වාස කෙරේ. වාණිජ කළු ගම්මිරිස් වෙළඳාම පවතින සමයේ සිට සමහර වාණිජ කළු ගම්මිරිස් ප්‍රභේද ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. ඉහළ අස්වැන්නක් සහිත ගම්මිරිස් ප්‍රභේද වන ඉන්දියාවෙන් "පැනියූර් -1" සහ මැලේසියාවෙන් "කුචින්" 1970 ගණන්වලදී හඳුන්වා දුන් නමුත් MB12 සහ GK 49 ඉහළ අස්වැන්නක් සහ උසස් ගුණාත්මයක් ලබා දෙන දේශීය වර්ග වන අතර ඒවා කළු ගම්මිරිස් වගා කරන්නන් අතර ජනප්‍රියය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෑතකදී ඩිංගි රාල, කොහු කුඹුරේ රාල සහ බූටෑවේ රාල නමින් නව දෙමුහුන් වර්ග තුනක් හඳුන්වා දී ඇත.

**පාංශු සහ දේශගුණික අවශ්‍යතා.**

අවම ගැඹුර සෙන්ටිමීටර 60ක් ඇති කාබනික ද්‍රව්‍ය වලින් පොහොසත් හොඳින් ජලය බැස යන ලෝම පසෙහි ගම්මිරිස් වඩාත් හොඳින් වැඩේ. මැටි පස මුල් වර්ධනය සීමා කරන අතර කෙටි වියළි කාලවලදී තෙතමන ආතතිය ඇති කරයි. ජලවහනය දුර්වල පස් බොහෝ විට පාංශු රෝග වලට තුඩු දෙයි. පාංශු පී එච් අගය 5.5 සිට 6.5 දක්වා පවත්වා ගැනීම වඩා හොඳය. රතු කහ පොඩ්සොලික්, රතු දුඹුරු ලැටසොලික් සහ නොමේරූ දුඹුරු ලෝම පස් ගම්මිරිස් වගාවට සුදුසු ය. ජලවහනය දුර්වල හා බාදනය වූ නොගැඹුරු පස් මෙම වගාවට සුදුසු නොවේ.

උෂ්ණත්වය සෙල්සියස් අංශක 20 සිට 30 දක්වා වූ තෙත් නිවර්තන කලාපවල වර්ධනය හා අස්වනු මට්ටම් වඩා හොඳය. තද සුළං හානිකර ය. එබැවින් ගම්මිරිස් වගාවට වඩාත් සුදුසු වන්නේ සුළං බාධක සහිත මැදරට සහ උඩරට ප්‍රදේශයි

**බෝග ස්ථාපිත කිරීම.**

සාමාන්‍යයෙන් ගම්මිරිස් කඳ දඬු කැබලි භාවිතයෙන් වර්ධක ප්‍රචාරනය සිදු කරයි. වාණිජ වගාවන් සඳහා, අතු කැබලි තෝරාගනු ලබන්නේ අග්‍රස්ථ අතුවලින් සහ බිම් ධාවක වලිනි. දඬු කැබලි පාර්ශ්වීය අතුවලින් ලබා ගන්නේ නම් පඳුරු ආකාරයේ ගම්මිරිස් පැල නිෂ්පාදනය කළ හැකිය. තෝරාගත් මව් ශාකය ඉහළ අස්වැන්නක් ලබාදෙන,

නිරෝගී සහ ප්‍රාණවත් වර්ධනයක් සහිත විය යුතුය. ඒවා කෙටි අන්තර් පර්ව දුර, දිගු කරල්, ඇටවලින් ශුකියම සම්පූර්ණයෙන් ආවරණය වූ, තද ඇට සහ පළිබෝධ සහ රෝගවලින් තොර විය යුතුය. විවිධ දේශගුණික කලාපවල ගම්මිරිස් වගා කරන බැවින් තෝරාගත් පෙළපත ප්‍රදේශයේ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි විය යුතුය. දඬු කැබලි ආමානය 250 වූ, මතුපිට පස්, ගොම, වැලි සහ කොහු බත් සමාන කොටස් මිශ්‍රණයකින් පිරවූ “8 x5” පොලිතීන් මලුවල පැළ කරනු ලැබේ. රෝපණය කරන ලද පොලිතීන් මලු සති 4 ක් සඳහා ආර්ද්‍රතා කුටියක් තුළ තබා ගත යුතුය. එයට වතුර දැමීම හා වල් නෙලීම සඳහා අර්ධ වශයෙන් විවෘත කළ යුතුය. ඉදිරි සති 2 සිට 3 දක්වා කාලය තුළ පොලිතින් ක්‍රමයෙන් ඉවත් කළ යුතුය. ආර්ද්‍රතා කුටියෙන් ඉවත් කිරීමෙන් පසුව තවාන් පැල සෙවන ගෘහයක තැබිය යුතු අතර අවසන් සති 3,4 තුළ දැඩි කිරීම සිදු කළ යුතුය. සමස්තයක් ලෙස මාස 4-6 තවාන් කාල සීමාවක් පවත්වා ගත යුතුය.

**ක්ෂේත්‍ර රෝපණය.**

තනි භෝගයක් ලෙස සහ පොල් සමග අතුරු භෝගයක් ලෙස පරතරය: මීටර් 2.4 x 2.4 පරතරය නිර්දේශ කෙරේ. ඉඩම් සැකසීමෙන් පසු  වලවල් සාදා මතුපිට පස්, ගොම පොහොර හෝ කොම්පෝස්ට් මිශ්‍රණයෙන් පුරවනු ලැබේ.ගම්මිරිස් වැල් සජීවී හෝ මියගිය ආධාරක මතට පුහුණු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සජීවී ආධාරක භාවිතා කරන අතර බහුලව භාවිතා වන ආධාරක ගස් ග්ලිරිසීඩියා (Gliricidiasepium) වේ. සමහරු Erythrinaindica (එරබදු) හෝ Grevillearobusta භාවිත කළ හැකිය. සෙන්ටිමීටර 3-5ක විෂ්කම්භයක් සහ දිග මීටර් 2.5ක් වන ග්ලිරිසිඩියා දඬු රෝපණ වලේ කෙළවරේ සෙන්ටිමීටර 20 ක් ගැඹුරට සිටුවිය යුතුය. ගම්මිරිස් සිටුවීමට ප්‍රමාණවත් සෙවනක් ලබා දීමට අවම වශයෙන් මාස 06 කට පෙර ආධාරක රෝපණය කළ යුතුය. මෝසම් වැසි ආරම්භ වීමත් සමඟ ගම්මිරිස් වගා කිරීම සිදු කෙරේ. මාස 4-6 ක් පමණ වයසැති කොළ 5-8 ක් සහිත ශක්තිමත්ව වැඩෙන බඳුන්ගත කළ පැළ වලවල්වල සිටුවනු ලැබේ. රෝපණය කළ විගසම සෘජු හිරු එළියෙන් අතු කැබලි ආරක්ෂා කිරීම සඳහා තාවකාලික සෙවන ලබා දිය යුතු අතර පාංශු තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා සුදුසු වසුන් පාදමට යෙදිය යුතුය.

**භෝග කළමනාකරණය.**

**ගම්මිරිස් වැල් පුහුණු කිරීම හා කප්පාදු කිරීම.**

නව ගම්මිරිස් පැල ඇදීම පටන් ගන්නා විට, රෙදි පටි වැනි මෘදු ද්‍රව්‍යයක් ආධාරයෙන් ආධාරකයට බැඳ තැබිය යුතුය. වැල ගැට 10-8 දක්වා වර්ධනයවන විට අග්‍රස්ථ රිකිලි 3-4 ක් ආධාරකයට පුහුණු කිරීම සහ ප්‍රමාණවත් පාර්ශ්වීය ශාඛා සංඛ්‍යාවක් පුහුණු කර තිබීම අවශ්‍ය වේ. අග්‍රස්ථ අංකුර 2-3ක් තිබීම වඩාත් ඵලදායී ස්ථම්භාකාර වියනක් ලබා දෙන අතර පාර්ශ්වීය ශාඛා සැළකිය යුතු සංඛ්‍යාවක් තිබීම ඉහළ අස්වැන්නක් සහතික කරයි  8-10 ගැට අවධියේදී අග්‍රස්ථ අංකුර නිපදවන්නේ නැත්නම් මුදුන් රිකිලි 3-4 ක් උත්තේජනය කිරීම සඳහා ගම්මිරිස් වැල අග්‍රස්ථයෙන් කප්පාදුකිරීම කළ යුතුය.

අවුරුදු 3-5 කට පසු ගම්මිරිස් වැල ආධාරකයේ ඉහළට ගොස් හොඳ වියනක් සාදයි. මීටර් 3.5-4.0 ක උසකින් ගම්මිරිස් පැළයේ උස පවත්වා ගැනීමටත් හොඳ හැඩයකින් යුත් වියනක් සාදා ගැනීමටත් කප්පාදු කළ යුතුය.

**සෙවන පාලනය සහ වසුන් යෙදීම.**

උපරිම උස මීටර් 4-5ක් පමණ වන පරිදි ග්ලිරිසීඩියා ආධාරකයේ ශාඛා වල උස හා සංඛ්‍යාව කප්පාදු කිරීමෙන් පාලනය කළ යුතුය. ග්ලිරිසීඩියා ගස් වසරකට අවම වශයෙන් 3 සිට 4 වතාවක් කප්පාදු කිරීම නිර්දේශ කරනු ලැබේ. තෙත් කලාපයේ වසරකට සිව් වතාවක් ග්ලිරිසීඩියා කප්පාදු කිරීම වාසිදායක වන්නේ ශ්‍රම පිරිවැය සහ අනවශ්‍ය සෙවන අඩු කරන බැවින් සහ ප්‍රමාණවත් වසුන් ද්‍රව්‍ය ද සපයන බැවිනි. ගසකට වසරකට කිලෝග්‍රෑම් 10 ක ග්ලිරිසීඩියා අතු යෙදීමෙන් අස්වැන්නේ කිසිදු අඩුවීමකින් තොරව අකාබනික පොහොර අවශ්‍යතාව 50% කින් අඩු කර ගත හැකි බව පර්යේෂණාත්මක සාක්ෂි පෙන්වා දී ඇත. ග්ලිරිසිඩියා සොයා ගැනීම දුෂ්කර නම් විකල්පයක් ලෙස, වියළි ගොම කිලෝග්‍රෑම් 16 ක් සහ කුකුළු පොහොර කිලෝග්‍රෑම් 12 ක මිශ්‍රණයක් වැලකට වසරකට යෙදිය හැකිය.

**බෝග ආරක්ෂණ.**

**ගම්මිරිස් කහ මොට්ල් වෛරස් රෝගය.**

ගම්මිරිස් සඳහා වඩාත්ම හානිකර රෝගය වන්නේ ගම්මිරිස් කහ මොට්ල් වෛරස් (PYMV) රෝගයයි. ආරම්භයේ දී කහ පැහැති ලප ළපටි පත්‍ර මත දැකිය හැකි අතර පසුකාලීනව කහ විචිත්‍ර පැල්ලම් සහිත කුඩා, අක්‍රමවත් පත්‍ර, කෙටි පර්ව සහ අඩක් පුරවා ඇති ඇට සහිත කුඩා කරල් දෘශ්‍යමාන රෝග ලක්ෂණ වේ. ක්‍රමයෙන් අස්වැන්න පහත වැටේ. ගම්මිරිස් ජේන්ද මකුණා, පිටි මකුණා සහ ආසාදිත රෝපණ ද්‍රව්‍ය හරහා මෙම රෝගය ව්‍යාප්ත වේ. නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම සහ ආසාදිත ශාක විනාශ කිරීම සහ රෝග වාහකයන් පාලනය හැර හඳුනාගත් වෙනත් පාලන පියවරයන් නොමැත.

**ක්ෂණික මැලවීම.**

මෙම රෝගය ඇතිවන්නේ Phytophthoracapsisi නම් දිලීරයකිනි. ශාකයේ පාදම මුලින්ම ආසාදනය වී පසුව වැලෙහි පාදස්ථ කොටස් කුණුවී එය මූල පද්ධතියට ද පැතිරේ. ආසාදනයට ලක් වූ විට, ශාක මැලවී සති 2-3 ක් තුළ මිය යයි. ජලාප්‍රවාහනය වැඩි දියුණු කිරීම සහ සෙවන පාලනය කර ගැනීමෙන් රෝගය වළක්වා ගත හැකිය. රෝගී ආසාදිත ශාක කොටස් ඉවත් කර බෝඩෝ මිශ්‍රණය හෝ වෙනත් දිලීර නාශකයක් වැලෙහි පොළොවට ආසන්න කොටසට ඉසිය යුතු ය.

රසායනික පාලනය: රිඩොමිල් MS 72 WP (මැන්කෝසෙබ් 64% + මෙටලැක්සීන් 8%) ග්‍රෑම් 25 ක් ජලය ලීටර් 10 ක ද්‍රාවණය කර යෙදිය හැකිය.

**සෙමෙන් මැලවීම.**

නියඟයෙන් පත්‍ර කහ පැහැයට හැරෙන නමුත් වර්ෂාවෙන් පසු සාමාන්‍ය තත්වයට පත්වේ. මෙම තත්වය වසරක් හෝ දෙකක් පමණ පවතින අතර අවසානයේ ශාක කහ පැහැයට හැරී මිය යයි. සෙමෙන් මැලවීම හේතුවෙන් ගම්මිරිස්වල අස්වැන්න 20-30% පමණ අඩුවන බව නිරීක්ෂණය කර ඇත. යාන්ත්‍රික හානි, නෙමටෝඩාවන් සහ කෘමි හානි හා දිලීර ආසාදන මගින් මූල පද්ධතියට වන හානිය ගම්මිරිස් සෙමෙන් මැලවීමට හේතුව වේ. නෙමටෝඩාවන් වළක්වා ගැනීම සඳහා කාබොෆ්‍යුරාන් ග්‍රෑම් 03 ක් බඳුනට හෝ කාබොෆ්‍යුරාන් ග්‍රෑම් 30 ක් රෝපණ වලට එක් කළ යුතුය. වසරකට සිව් වතාවක් පාහින ලද ග්ලයිසීඩියා යෙදීම මගින් නෙමටෝඩාවන්

සැලකිය යුතු ලෙස අඩු කරන බව පර්යේෂණාත්මක සාක්ෂි මගින් සනාථ කර ඇත. තත්වය බරපතල නම්, ආසාදිත ශාක උදුරා දමා විනාශ කළ යුතුය. නිසි ලෙස පාංශු සංරක්ෂණය හා පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයන් පවත්වා ගැනීම රෝගය අවම කරයි. සත්‍ය හේතුව තහවුරු කිරීමෙන් පසු රසායනික ප්‍රතිකාර යෙදිය යුතුය.

**පළිබෝධකයන්.**

**කඳන් විදින කුරුමිණියා – Pterolphia annualata**

ඉතා මෑතදී මෙම කුරුමිණි හානිය වාර්තා වූ අතර කුරුමිණියාගේ කීටයා කඳ තුළට ඇතුල්වී අභ්‍යන්තර කොටස් ආහාරයට ගනී. මේ නිසා සම්පූර්ණ වැල හෝ වැල් කොටසක් කහපාට වීම සහ මැලවීම ක්ෂේත්‍රය තුල දකින්නට හැකිය. එමෙන්ම කුඩා රවුම් සිදුරු වැල් මත තිබීම සහ වියලී ගිය ගම්මිරිස් පත්‍ර හා පුරුක් වැලෙන් වෙන් නොවී, බිමට නොවැටී, වැල මතම රඳා පැවතීම හානියේ ලක්ෂණයන් වේ. කඳ පලා බැලූ විට ඇතුළත කොටස් කා දමන, පාද රහිත, ක්‍රීම් පැහැති කීටයන් දැකිය හැකිය. හානිය පාලනය සඳහා ක්ෂේත්‍රයේ වල් මර්ධනය, ගම්මිරිස් මුල අසල අඩි දෙකක් පමණ වට රවුම උදලු ගා සම්පූර්ණයෙන්ම වල් ඉවත් කිරීම, පොලව සමග ස්පර්ශ වන ධාවක සහ හරස් අතු කපා ඉවත් කිරීම, සිදුරු පවතීනම් එම වැල් කොටස් හානි වූ සිදුරට අඩි එකක් පමණ පහලින් කපා දමා ඒවා එකතු කර වහාම ගිනි තබා විනාශ කිරීම කල යුතුය. ඉන්පසු නිර්දේශිත කෘමිනාශකයක් උපදෙස් ලබාගෙන යොදන්න.

**රේන්ද මකුණා– Diconocorisdistanti (Drake)**

වසරේ සෑම කාලයකම පාහේ ක්ෂේත්‍රයේ දැකිය හැක. එහෙත් වර්ෂාවත් සමගම මෙම සතුන්ගේ සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීමක් දැකිය හැක. වැඩුන සත්‍ය සහ ශිෂුවන් ගම්මිරිස් වැල්වල පත්‍ර වලින් හා ලපටි කරල් වලින් යුෂ උරා බොති. යුෂ උරා බිවූ පත්‍රවල සහ හා ලපටි කරල් මත දුඹුරු පැහැති ලප ඇතිවේ. නොමේරූ කරල් වල හානි කළ ස්ථාන වල බීජ හට නොගන්නා හෝ අඩු බිජ ප්‍රමාණයක් හටගන්නා අතර බොහෝ විට කරල් වියලී වැටී යයි. කරල් හට ගන්නා අවස්ථාවේදී මෙම හානිය නිසා අස්වැන්න ද ඉතා අඩුවේ. ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් වන සෙවන ශාක ක්‍රමානුකූලව නඩත්තු කිරීම සහ වල් මර්ධනය මෙම රේන්ද මකුණා මර්ධනය සඳහා ඉතා වැදගත් වෙයි. හානිය ඉතා අධික ක්ෂේත්‍රවලට පමණක් කරල් හට ගැනීම ආරම්භයත් සමග නිර්දේශිත කෘමිනාශකයක් උපදෙස් ලබාගෙන යොදන්න.

**මුල් ආශ්‍රිත පිටි මකුණා – Planococcuscittri (Risso)**

ගම්මිරිස් වැලේ පසට යටවූ කොටසේ කඳෙහි හා මුල් වල සුදු පැහැති පිටි මකුණන් සමූහ වශයෙන් ජීවත් වේ. මොවුන් මුල් වලින් ජලය සහ පෝෂණය උරාබීම නිසා ගම්මිරිස් වැලට ජලය හා පෝෂණ ඌණතා ඇතිවී වැල් කහ පැහැ ගැන්වී, මැලවී පසුව එම වැල් මැරී යයි. පාලනය සඳහා නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතය, යහපත් කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම, ගම්මිරිස් මුල අසල අඩි දෙකක් පමණ වට රවුම උදලු ගා සම්පූර්ණයෙන්ම වල් ඉවත් කිරීම, කෙෂ්ත්‍රයේ වල් මර්ධනය සහ නිර්දේශිත පොහොර යෙදීම මගින් ගම්මිරිස් වැල්වල ශක්තිමත් බව වැඩි කිරීම කල යුතුයි. පිටි මකුණන් ප්‍රචාරණය වනු ලබන්නේ කුඹින් මගිනි. එම නිසා ගම්මිරිස් වැල් ආශ්‍රිතව කුඹින් සිටී නම් ඔවුන් මර්ධනය කල යුතු වේ. වැලේ පාදස්ථ කොටස පිරිසිදු කර නිර්දේශිත කෘමිනාශකයක් උපදෙස් ලබාගෙන යොදන්න.

**පැලමැක්කන් – Gynaikothripskarny Bagn.**

ශිෂුවා සහ වැඩුන කෘමියා පත්‍රවල යට පැත්තේ සිට යුෂ උරා බොයි. පැලමැක්කන්ගේ හානියට ලක්වූ පත්‍රවල දාර ඇතුලට හැකිලේ. ගම්මිරිස් වගාවන් වල මෙම කෘමියා එතරම් හානියක් නොකළත් පැල තවාන් වල මෙය ගැටළුවක් විය හැක. තවානේ පැල හානියට ලක්වූ විට පත්‍ර කුඩා වී හැඩය වෙනස් වේ. පාලනය සඳහා හානියට ලක් වූ පැල තවානෙන් වෙන්කරන්න. හානි වූ පත්‍ර කඩා ඉවත් කර ගිනි තබා විනාශ කරන්න. හානිය ඉතා අධික නම් සම්පූර්ණ පැලයම විනාශ කරන්න. ඉන්පසු නිර්දේශිත කෘමිනාශකයක් උපදෙස් ලබාගෙන යොදන්න.

**අස්වනු නෙලීම හා පසු අස්වනු පිළිවෙත්.**

පරිණත වීමෙන් මාස 7-8 කට පසු ගම්මිරිස් අස්වනු නෙලනු ලැබේ. ඇට වෙන් කිරීම අතින් හෝ ඇට වෙන්කරන යන්ත්‍රයක් භාවිතයෙන් කළ හැක. ගම්මිරිස් ඇට හිරු එළියෙන් කෙලින්ම වියළා ගත හැකිය. නැත්නම් කෘත්‍රිම වියලනයක් භාවිතා කළ හැකිය. අව්වේ වියළීම සඳහා දින 4-6 ක් ගතවේ. ඒකාකාර කළු පැහැයක් ලබා ගැනීම සඳහා අමු ගම්මිරිස් උණු ජල ප්‍රතිකාරයට භාජනය කෙරේ. එහිදී අමු ගම්මිරිස් විනාඩි 03 ක් පමණ නටන තෙක් රත් කළ ජලයේ ගිල්වීම සිදු කෙරේ (බ්ලාන්චින් කිරීම). එමගින් වියළීමේ කාලය දින 2-3 කින් අඩු කරන අතර සිටින ක්ෂුද්‍ර ජීවීන් විනාශ කරයි. සුදු ගම්මිරිස් නිෂ්පාදනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඉදුණු ඇට බීජාවරණය කුණුවන තෙක් දින 5-6 ක් පමණ ජලයේ ගිල්වනු ලැබේ. පසුව බීජාවරණය කම්බි දැලක් මත අතුල්ලමින් හෝ යාන්ත්‍රික පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් භාවිතයෙන් ඉවත් කරනු ලැබේ. අනතුරුව ගම්මිරිස් බීජ හොඳින් සෝදා වියළා සුදු ගම්මිරිස් නිෂ්පාදනය කරයි.

එම සුදු ගම්මිරිස් වලට අමතරව, රෝස / රතු ගම්මිරිස්, ඇඹරූ ගම්මිරිස්, ගම්මිරිස් තෙල්, ගම්මිරිස් ඔලියොරෙසින් සහ ගම්මිරිස් සෝස් සහ ගම්මිරිස් ටොෆි සහ ජුජුබ්ස් වැනි අගය එකතු කළ නිෂ්පාදන ද නිෂ්පාදනය කළ හැකිය.

මූලාශ්‍ර- අන්තර්ජාලය සහ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය

# 09. කොරෝනා වෛරස ව්‍යාප්තියේ බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් යළි නංවාලීම සඳහා සෞභාග්‍යා වැඩසටහනේ දායකත්වය.

*ප්‍රදීප් ලංකාපෙල*
*සංවර්ධන නිලධාරී.*

**කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය නිසා ඇතිවූ ආර්ථික අර්බුදය.**

ඉතිහාසය පුරාවට රටවල් විවිධාකාර අර්බුදවලට මුහුණපා තිබේ. එහෙත් ඉදිරි දශක ගණනාවක් පුරාවට ප්‍රතිවිපාකවලට මුහුණදීමට මඟ පාදන තරම් දරුණු මට්ටමේ ව්‍යසන ඇත්තේ ස්වල්පයකි. 20 වැනි සියවසේ ශ්‍රී ලාංකාවේ ඉතිහාසය දෙස බැලීමේදී එවැනි අර්බුද දෙකක් කැපී පෙනෙයි - එනම් 1929 දී ඇතිවූ ගෝලීය මහා ආර්ථික අවපාතය නිසා ලංකාවට මුහුණපෑමට සිදුවූ අර්බුදය හා 1970-77 කාලයේදී අත්විදි හාල් පෝලිම් යුගයයි. අඳුරු වළාවක් මෙන් ඉතිහාසයේ සටහන් වන මෙකී අත්දැකීම් විසින් ඉන් පසු එළඹි දශකවල රටේ ආර්ථික ප්‍රතිපත්තිය තීරණය කරන ලදී. මහා ආර්ථික අවපාතයේ දී, ගෝලීය ණය අර්බුදයක් සමඟ වෙළඳ භාණ්ඩවල මිල සීඝ්‍රයෙන් අඩු වීම හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ විවිධාංගීකරණය නොවූ වතු ආර්ථිකය විනාශයට පත්විය. ඉන්පසු මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳපොලවල් මත යැපීම අවම කිරීම සඳහා සම්මුතියක් ඇති කර ගන්නා ලදී.

1934 දී නිදහසට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ ප්‍රමුඛතම විශ්ලේෂණය වූ ලංකාවේ බැංකු කොමිෂන් වාර්තාව නිරීක්ෂණය කල පරිදි, “ලංකාවේ ආර්ථික ව්‍යුහය හේතුවෙන් රටට මුහුණ දීමට සිදුවන අවදානම කොතරම්ද යන්න මෙම කාල පරිච්ඡේදයේ තරම් ප්‍රබල ලෙස දැනී තිබුනේ නැත. රටේ ධනයෙන් 90% කට වැඩි ප්‍රමාණයක් උපයා දෙන ප්‍රධාන නිෂ්පාදන තුන වූ තේ, රබර් සහ පොල්වලින් ලද ආදායම මෙම අවපාතයේ දී බරපතල ලෙස පසුබෑමට ලක්විය. අනෙකුත් රටවල ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රබල විශ්වාසයක් බවට පත් වූ ආර්ථික ස්වයංපෝෂිතභාවය ශ්‍රී ලංකාවට ද ව්‍යාප්ත විය”. යුධ කාලීන සැලසුම්කරණයෙන් සහ රුසියාව කාර්මිකකරණය කිරීමේදී සෝවියට් රුසියාව අනුගමනය කල විධාන ආර්ථිකයේ සාර්ථකත්වයත් සමඟ පුද්ගලික සමාගම් වෙනුවට රජය මූලික කරගත් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ජාතික ස්වාධීනත්වයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය වන බව මෙම කාලයේදී යටත්විජිත වශයෙන් සිට නිදහස ලද තුන්වන ලෝකයේ රටවල් අතර පැවති පොදු මතයක් විය.

එහෙත් මෙම උද්දාමය ඉක්මණින් අවසන් විය. ආනයන ආදේශනය අසාර්ථක වීම සහ තීරණාත්මක වැවිලි අංශයේ ව්‍යවසායන් ඇතුළුව ව්‍යවසායන් පවත්වාගෙන යාම පිළිබඳ රජයේ අති අසාර්ථක බව 1977 විවෘත වෙළඳපොල ප්‍රතිසංස්කරණ සඳහා මග පෑදීය. රටේ ජනතාව අතර අපේක්ෂා භංගත්වය පැහැදිලිව පෙනෙන්නට තිබුණි. 2004 දී වසර විසිපහක් පුරාවට අනුගමනය කළ විවෘත ආර්ථික ආකෘතිය හදිසි හා අනපේක්ෂිත ලෙස නතර වුවද ආර්ථික වශයෙන් ගත් කළ අප තවමත් 1977 විවෘත ආර්ථික විප්ලවයේ දරුවන් වෙමු .

**ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතර ඒවා නම්:**

1. කොරෝනා වයිරසය: කොරෝනා වයිරසය නිසා ගෝලීය හා දේශීය ඒකාබද්ධ භාණ්ඩ සැපයුමට හා ඉල්ලුමේ ඇතිවන බලපෑම්.

2. ඵලදායිතාවයෙන් අඩු ඉදිකිරීම් සහ ආනයන පරිභෝජනය සඳහා වැඩි පොලී අනුපාත යටතේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළවලින් අසීමාන්තික ලෙස විදේශ මුදල් වලින් ණය ගැනීම. මෙසේ ලබාගන්නා ලද ණය අඩු කල් පිරීමේ කාලයකින් යුතු වීම ආර්ථිකයට අහිතකර ලෙස බලපායි.

3. ගංවතුර, නියඟ, ව්‍යවස්ථාමය කුමන්ත්‍රණය සහ පාස්කු බෝම්බ ප්‍රහාර හේතුවෙන් ඇති වූ ආර්ථික මන්දගාමිත්වය.

90 දශකයේ අගභාගයේ සහ 2000 දශකයේ මුල් භාගයේ සිදු වූ ප්‍රතිසංස්කරණවල කාල පමාව නිසා එකී ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල වසර කිහිපයක්ම ඵල දැරුවේය. 2005 න් පසු ඉහළ පොලී අනුපාතවලට ගන්නා ලද ඩොලර් ණය, රටේ ආර්ථික වර්ධනය ඉහළ දැමීමට යොදාගත් ප්‍රධාන ක්‍රමවේදය විය.

2007 න් පසු ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොලවලින් ලබාගත් වාණිජ ණය ගැනීම සීඝ්‍රයෙන් ඉහළ ගියේය. මෙය 2009 යුද්ධය අවසන් වූ විගසම ඉදිකිරීම් හා පරිභෝජන ක්ෂේත්‍රවල සැලකිය යුතු වර්ධනයක් ඇති කළේය. ව්‍යාපෘති ණය යොදාගනිමින් හිස් ගුවන් තොටුපලවල් සහ වැඩකට නැති කුලුණු ඉදිකරන ලදී. රාජ්‍ය අංශයේ සේවක ප්‍රමාණය පෙර නොවූ විරූ ලෙස ඉහළ යාම හේතුවෙන් වේගයෙන් ඉහළ යන අයවැය හිඟය පියවීම සඳහා ස්වෛරී බැඳුම්කර නිකුත් කරන ලදී.

පසුගිය වසර කිහිපය තුළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනක සහය ඇතිව, ශ්‍රී ලංකාවේ ණය බර සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොලවල් මත යැපීම අවම කිරීමට රජය දැඩි උත්සාහයක් ගත්තේය. ශ්‍රී ලංකාව ප්‍රථම වතාවට ප්‍රාථමික ගිණුමේ ඉහළ අතිරික්තයක් (non-trivial primary surplus) 2017 දී ඇති කරගත් අතර ව්‍යවස්ථා, කුමන්ත්‍රණය සහ පාස්කු බෝම්බ ප්‍රහාරය මධ්‍යයේ වුවද 2018 සහ 2019 නොවැම්බර් දක්වා එම සාර්ථකත්වය නැවතත් ළඟා කරගැනීමට සමත් විය. නමුත් මෙය පමණක් ප්‍රමාණවත් නොවීය.

යථාර්ථය නම්, රාජ්‍ය ණය ප්‍රමාණය පහත නොයන බව වන අතර වටිනාම වැදගත් කාරණය වන්නේ රාජ්‍ය ණය ආපසු ගෙවීමේ ධාරිතාවේ ප්‍රමාණයට සාපේක්ෂව රාජ්‍ය ණය අඩු කිරීමයි. එහි සරලම ස්වරූපයෙන්, එය මෙම සමීකරණයේ වටිනාකම අඩු කිරීම ගැන ය.

මෙය ආකාර දෙකකින් සිදු කළ හැක. මෙම සමීකරණයේ " රාජ්‍ය ණය" වන ලවයේ අගය අඩු කිරීමෙන් හෝ හරය වන " වාර්ෂික දළ දේශීය නිෂ්පාදනයේ" අගය වැඩි කිරීමෙන් රාජ්‍ය ණය ආපසු ගෙවීමේ ධාරිතාවේ ප්‍රමාණයට සාපේක්ෂව රාජ්‍ය ණය අඩු කළ හැකිය. පසුගිය වසර කිහිපයේදී ශ්‍රී ලංකාව නිවැරදි ලෙස ලවයේ අගය අඩු කරන "රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධකරණ" ප්‍රවේශය අනුගමනය කළේය. එහෙත් සන්ධාන දේශපාලනයේ ගතිකයන් හා කාල පමාව විසින් වඩා වැදගත් හරය එනම් ආර්ථික වර්ධනයේ ප්‍රගතියට බාධා ඇති කළේය. නව රජය විසින් සැලකිය යුතු ලෙස මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කරමින් රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධකරණ ගමන් මඟ ආපස්සට හැරවීය. එය රජයේ ආදායම විශාල ලෙස අඩු කළ පුළුල් පරාසයක බදු කප්පාදුවක් ක්‍රියාත්මක කළේය. අපේ සමීකරණයේ භාෂාවෙන් කියන්නේ නම් ඒම බදු කපා හැරීම් මඟින් ලවයේ අගය ඉහළ දැමීය. මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සාධාරණීකරණය කරනු ලැබුවේ වැඩිවන රාජ්‍ය ණයට වඩා වේගයෙන් වර්ධනය වන දළ දේශීය නිෂ්පාදනය හේතුවෙන් රාජ්‍ය ණයෙහි සාපේක්ෂ අගය අඩු වනු ඇති බවයි. එම සැලැස්ම පැහැදිලිවම අසාර්ථක විය. අද දවස වන විට රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයෙන් 95% මට්ටමට ළඟා වී තිබේ. භාණ්ඩාගාර ඇපකර වැනි වගකීම් ද සලකා බැලූ විට මෙම අගය 95% ටත් බොහෝ වැඩි අගයක් විය හැක.

**ආර්ථික අර්බුදය සඳහා රජය ගත් වැඩපිළිවෙල**

- රාජ්‍ය ණය අඩු කිරීම
- බදු වැඩි කිරීම
- රාජ්‍ය වියදම් අඩු කිරීම
- ඵලදායිතා වර්ධනය
- ආයෝජන වැඩිකිරීම
- අපනයන තරඟකාරිත්වය

**සෞභාග්‍යා වැඩසටහනේ දායකත්වය**

COVID – 19 ව්‍යසනයේ අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා නව සහන (“සෞභාග්‍යා COVID – 19 පුනරුද සහන“)

COVID – 19 ව්‍යසනයේ අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර නැවත නඟා සිටුවීම තුළින් අපහසුවට පත් ශ්‍රී ලාංකීය ජන ජීවිතය සහ මෙරට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ජාතික වැදගත්කම සලකා ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් COVID – 19 ව්‍යසනයේ අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මෙම ප්‍රතිමූල්‍ය පහසුකම හඳුන්වා දී තිබේ (“සෞභාග්‍යා COVID – 19 පුනරුද සහන”). ණය සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අනුමත රුපියල් බිලියන 50 ක මුදල, රුපියල් බිලියන 150 ක් දක්වාත් වැඩිවිය.

**සෞභාග්‍යා COVID – 19 පුනරුද සහන“ වැඩසටහනෙහි ප්‍රධාන ලක්ෂණ**

- මෙහෙයුම් ආයතනය - ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
- මෙහෙයුම් ප්‍රදේශ - දිවයිනේ සියලු ප්‍රදේශ
- සහභාගීත්ව ආයතන - මූල්‍ය බලපත්‍රලාභී බැංකු
- උපරිම ණය සීමාව මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය.

  * 2020 අංක 05 දරණ මුදල් මණ්ඩල චක්‍ර ලේඛයට අනුව වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන 1 ට අඩු ඕනෑම ව්‍යාපාරයක් සඳහා ණය පහසුකම ලබා ගත හැක. (කෙසේ වෙතත්, වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන එකට වැඩි සංචාරක හා අපනයන අංශ මෙන්ම ඒ හා සම්බන්ධ සැපයුම් සේවාවන්ට ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබා ගත හැක.

- සුදුසුකම්ලාභීන් — * ආර්ථික ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය සපයනු ඇත.

- ණය ලාභියා විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවිය යුතු පොළී අනුපාතය — *වාර්ෂිකව 4%

- සහන කාලය — *ව්‍යාපාර ක්‍රියාවලියෙහි ස්වභාවය අනුව උපරිම කාලය මාස 06 යි.

- ණය කාල සීමාව — *සහන කාලය ඇතුළත්ව උපරිම මාස 24 කි.

- ඇප — *ආර්ථික ක්‍රියාවලියෙහි ශක්‍යතාවය සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. කෙසේ නමුත්, ණය පහසුකමට අදාළ අවධානම සලකා සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් සුදුසු ඇපයක් ලබාගත හැකිය.

**( අන්තර්ජාලය ඇසුරිනි)**

# 10.සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම සඳහා කෘෂිකර්මාන්තයේ හා දේශීය කර්මාන්තවල බලපෑම.

*එච්.බී.අයි.ඒ. චන්ද්‍රසිරි*
*සංවර්ධන නිලධාරී.*

රටක සෞභාග්‍ය තීරණය කරනු ලබන වැදගත් සාධකය ලෙස ඵලදායිතාව හඳුනා ගෙන ඇත. ඵලදායිතාව තීරණය වන්නේ කාර්යක්ෂමතාව හා සඵලතාව මගිනි. දශක තුනක ශ්‍රී ලංකාවේ පැවති ඊළාම් යුද්ධයද ඉන්පසුව 2019 ඇතිවූ බෝම්බ පිපිරවීම් හා ඉන්පසුව ඇතිවූ කොවිඩ් රෝගී තත්වයද ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය පහළ වැටීම කෙරෙහි දැඩි ලෙස බලපෑමක් ඇති කරන ලදි.

රටක් සෞභාග්‍ය කෙරෙහි ළඟා වීමට නම් එම රටේ පුරවැසියන්ගේ සමාජ හා ආර්ථික ගැටලු විසඳාගැනීමට හැකි විය යුතුයි. ජනතාවට සහනාධාර ලබාදෙන ජනසවිය, සමෘද්ධිය වැනි වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල අප රටට ලබා ගත නොහැකි විය. එම සහනාධාර ලබාදීම නිසා ජනතාව තුළ ආර්ථික දියුණුවක් ලබාගැනීමට උනන්දුවක් ඇතිනොවීය. සිදුවිය යුත්තේ පුද්ගලයින් සක්‍රිය ලෙස නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගත හැකි වැඩපිළිවෙලකිනි.

**දේශීය කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරිම.**

ආහාරවලින් ස්වයංපෝෂිත වීම අප රටට ඉතා අවශ්‍ය දෙයකි. රටට අවශ්‍ය සියලුම ආහාර ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කර ඒවා ආනයනය කිරීම නතර කල යුතුයි. එමගින් පිටරටට ඇදී යන විශාල ඩොලර් ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි අතරම දේශීය ගොවීන්, ව්‍යාපාරිකයන් වැනි අය ගොඩනැගීමද වැඩිපිරිසකට රැකියා ලබාදීමටද හැකිවේ.

දේශීය කෘෂිකර්මාන්තය ඉහළ නැංවීමට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීමත් රජය මගින් ඉටු විය යුතුයි. කෘෂිකර්මාන්තයේ යෙදෙන සමස්ත ජනතාව ඇගයීමට ලක් කිරීම ඉතා අඩුම මට්ටමක පවතී. තරුණ පරපුර අතර කෘෂිකර්මාන්තයට ඇල්මක් ඇතිකිරීමට නම් ඒ සඳහා ආර්ථික වටිනාකමක් ඇති වන පරිදි වැඩපිළිවෙලක් සකස් කල යුතුයි. ගොවියාගේ ආර්ථික පැත්ත පමණක් නොව ජීවන මට්ටම හා සෞඛ්‍ය ඉහළ දැමීමටද රජය ක්‍රියාත්මක විය යුතුයි.

රසායනික ද්‍රව්‍යවලින් තොර කෘෂිකර්මාන්තයක් සඳහා පියවරෙන් පියවර කටයුතු කළ යුතුයි. වස විෂෙන් තොර ආහාර පරිභෝජනය කිරීම හා එමගින් වැළදෙන රෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම රජයේ සෞඛ්‍ය අංශ මගින් සිදු කළ යුතුයි.

ලංකාව තුළ නිෂ්පාදනය වන එළවලු හා පළතුරු විශාල ප්‍රමාණයක් හානි වන බැවින් ඒවා කල්තබා ගැනීමට පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ගොවීන් දැනුවත් කළ යුතුයි. මේ සඳහා තාක්ෂණික ආයතන සමග ඒකාබද්ධ වී තාක්ෂණය, වෙළෙඳපොල , ඇසුරුම්කරණය , පාරිභෝගික අවශ්‍යතාවය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම රජය මගින් සිදු කළ යුතු තවත් වැදගත් කාර්යයකි. රාජ්‍ය බැංකු මගින් වගාකරුවන්ට අඩු පොලියට ණය ලබාදීම සිදුකළ යුතුයි.

කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ගේ අස්වැන්න ප්‍රවාහනය කිරීමේදී තැලී පොඩිවී විනාශ වී යන ප්‍රමාණය ඉතා ඉහළය. එම නිසා නිසි ලෙස ඇසුරුම්කරණය හා ප්‍රවාහනය කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ගොවීන්ට ලබාදිය යුතුයි.

අස්වැන්න විනාශවීමට බලපාන තවත් හේතුවක් වන්නේ අලි මිනිස් ගැටුම්, රිලවුන්ගේ බලපෑම, ඌරන්ගෙන් වන බලපෑම් ආදියයි. මේවා නැවැත්වීමට අවශ්‍ය උපකරණ හා දැනුම ගොවීන්ට ලබා දිය යුතුයි.

**දේශිය කර්මාන්ත දිරිමත් කිරීම.**

දේශිය කුඩා කර්මාන්ත වන පන්, මැටි, බීරලු, කොහු, වේවැල්, ලණු, පැදුරු, වැටකේ ආශ්‍රිත කර්මාන්ත ගොඩනැංවීමට රජය මගින් පහසුකම් ඇති කළ යුතුයි. මෙහිදී කර්මාන්තකරුවන් මුහුණදෙන ප්‍රධාන ගැටලුව අමුද්‍රව්‍ය සපයා ගැනීම, වෙළෙඳපොල සොයා ගැනීම, නව පරපුර මෙම කර්මාන්තයට යොමුවීමට ඇති අකමැත්ත ආදියයි. මෙහිදී නිෂ්පාදකයන් හා වෙළඳුන් අතර සම්බන්ධීකරණය කිරීම, මිල පාලනය කිරීම , මිල තීරණය කිරීම රජය මගින් සිදු කළ යුතුයි.

එහෙත් විදේශ රටවලින් ගෙන්වන පරිසරයට හානිදායක ප්ලාස්ටික් බෑග්, කුඩ, පාපිසි, කොසු, ලණු, වැනි පරිසරයට හානිදායක භාණ්ඩ ගෙන්වීම නවතා දැමිය හැක.

**කාන්තා ව්‍යවසායකත්වය ගොඩ නැංවීම.**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ කාන්තාවන්ය. ලංකාවේ කාන්තා පාර්ශ්වය ගෘහ ව්‍යවසායකත්වය සඳහා වැඩි නැඹුරුවක් දක්වයි. එමගින් පවුලේ ආර්ථිකයට සවියක් වී ඇති අවස්ථා අපමණය.

ලංකාවේ කාන්තාවන් වැඩිපුරම යොමු වී ඇති ව්‍යාපාර වන්නේ ඇඳුම් මැසීම, බිම්මල් නිෂ්පාදනය, මල් වගාව, රූපලාවන්‍ය කටයුතු, රසකැවිලි නිපදවීම , හඳුන්කූරු නිපදවීම ආදියයි.

නමුත් මෙම බොහෝ ව්‍යාපාරවල ආර්ථිකමය තත්වය අඩු මට්ටමක පවතී. කාන්තා ව්‍යවසායක්වය සංවර්ධනයට නොයෙකුත් බාධා පවති. එනම් භාණ්ඩ අලෙවි කරගැනීමට වෙළෙඳපොලක් සොයා ගැනීම ප්‍රධාන ගැටලුවයි. එමෙන්ම නිෂ්පාදන සඳහා නියමිත මිලක් නොමැති වීම නිසා මෙම කර්මාන්ත වල ඉදිරි පැවැත්ම අඩුය. භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ පුහුණුවීම් ලබාදෙන ආයතන නොමැතිවීම නිසා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අඩු මට්ටමක පවති. බැංකුවලින් ණය පහසුකම් ලබා ගැනීමේ නොහැකියාව නිසා ප්‍රාග්ධන ගැටලු වලට මුහුණ පෑමට සිදු වී ඇත.

ශ්‍රී ලංකාව සෞභාග්‍යමත් දේශයක් බවට පත්කිරීම සඳහා කෘෂිකර්මාන්තය, දේශීය කර්මාන්ත හා කාන්තා ව්‍යවසායකත්වය දියුණු කිරීම ඉතාම අත්‍යාවශ්‍ය කරුණකි.

# 11.සෞභාග්‍යමත් දේශයක් සඳහා ඉලක්ක ගොඩනැංවීම.

ජී.බී.ඩී. වැත්තෑව
සංවර්ධන නිලධාරී.

රටක් වශයෙන් දියුණුවීමට අවශ්‍ය ප්‍රබලම දේ නම් නිශ්චිත ප්‍රබලම ඉලක්කයක් තිබීමයි. මොනදේ . තිබුනත් මොනදේ ලැබුණත් ඉලක්කයක් නැති මිනිසා දියුණු නොවේ. ඉලක්කයක් රටක් වශයෙන්ද අවශ්‍ය වේ. ඉලක්කයක් සතු විය යුතු ගුණාංග කිහිපයක් පවතී .

1. ඉලක්කය නිශ්චිත විය යුතුය. මිනිසාට ඇත්තේ සීමිත කාලයකි. එම නිසා එම කාලය තුළ ලඟා කරගත හැකි ඉලක්කය නිශ්චිත විය යුතුය. සියලු දේ ලබාගැනීමට වැඩ මගින් නිශ්චිත එක දෙයක් හෝ ලබා ගැනීම වටී.

2. ඉලක්කය සෑම විටම මැන බැලිය හැකි විය යුතුය . ප්‍රගතිය මැනීමට නොහැකි ඉලක්කයක් කාලයමැ .තොරවෙනු ඇත. නිශ්චිත ඉලක්කය නිතර නිතර මැන බලා තමා ආ දුර කොපමණද යා යුතු දුර කොපමණද යන්න සිතා බැලිය යුතුය .

3. ඉලක්කයක් සෑමවිටම ලඟාකර ගත හැකි විය යුතු ය. අපට ළඟා කරගත නොහැකි ඉලක්ක වලින් අපගේ කාලයත් මුදලුත් අනිකුත් සියලු දේත් නාස්ති වි යයි.

4. ඉල්ලකය සෑමවිටම ප්‍රායෝගික විය යුතු ය. ප්‍රායෝගික නොවන ඉලක්ක ඉලක්කයක් නොතිබීමට වඩා හානිකරය. ඉලක්ක ප්‍රායෝගික නොවන විට රටක් වුව ද නොසිතූ කරදර වලට පත්වේ.

5. ඉලක්කයක වැදගත්ම දෙයක් ලෙස ඉලක්කයේ අවසානය සඳහා නිශ්චිත කාලයක් තිබිය යුතුය. නිශ්චිත කාලයකින් තොර ඉලක්කයක් කිසිදා ඉටුනොවන ඉලක්කයක් ලෙස දැකිය හැක . නමුත් ඉලක්කයේ කාලය . ප්‍රායෝගික ෙහ්තු මත අඩු වැඩි වීම එතරම් ප්‍රශ්නයක් නොවේ.

ඉලක්කයක් නොමැති පුද්ගලයා වෙනත් පුද්ගලයකුගේ සෑමවිටම සිරකරුවෙකි. ඉලක්ක දිර්ඝකාලින, මධ්‍ය කාලින හා කෙටිකාලින ලෙස වර්ගකර දැකිවිය හැකියනමුත් ජීවිතයේ සියලුම ඉලක් ක සාර්ථක. මිනිසුන් . ම දැකනොමැත. එම නිසා විටක සාර්ථක වෙිවැදගත් වන්නේ ඉල .විටක අසාර්ථක වේ .ක්කයට ගමන් කිරීමයි. ප්‍රභල ඉලක්ක ප්‍රභල මිනිසුන් නිර්මාණය කරන අතර දුබල ඉලක්ක දුබල මිනිසුන් බිහිකරයිමිනිසෙකු ශක්තිමත් . වන්නේ ඔහු සතු ශක්තිය, බලය, කුසලතාවය නිසා නොව ඔහු සතුව පවතින ඉලක්කය මත වේ.

මිනිසෙකු දුප්පත්ව ඉපදීම ඔහුගේ වරදක් නොවන අතර ඔහු දුප්පත්ව මියයාම ඔහුගේ වරදක් වේ . මිනිසුන්ට දියුණුවීමට මෙතරම් පහසු කාලයක් වෙනත් කිසිමදාක තිබී නැත. සිතුවොත් සියල්ල වෙනස් කිරීමට සිදු වන්නේ ඉතා කුඩා කාලයකි.සිතීමෙන් තොර දියුණුවක් නොමැත .හෝ මිනිසුන් සිැකම්මැළි කම්මසි. සෑමදෙනාම එකම දේ කර දියුණුව බලාපොරොත්තු වීම විහිළුවකි.

මුදල් නැති වීම හා ඇති වීම තමාගේ උත්සාහය, සැලසුම් හා ක්‍රියාකාරකම් මත තීරණය වෙිසල්ලි . සෙවීමේදී අප තෙරුම්ගත යුතු වැදගත් දෙයක් ඇත. එනම් සෑමවිටම සල්ලි තිබෙන්නේ අනුන්ගේ අතේ යඑම . නිසා අපට ඒවා ලබාගැනීමට සැලැස්මක්, උපායමාර්ග, භාණ්ඩයක් හෝ සේවාවක් තිබිය යුතු ය .

අපේ රටේ ජනතාව කෝටි 2 ට අධිකව සිටී. එක් මිනිසෙක් එක් දිනකට එක බුලත් කොලයක් බැගින් නිෂ්පාදනය කලොත් කිසිම අපහසුතාවයකින් තොරව දවසකට කෝටි 10 ට වැඩ මුදලක් අපේ ආර්ථිකයට එකතු වේ වාර්ෂිකව එය කෝටි .3650 ට අධික වේ. අපේ රටට දියුණුවීමට නම් අවශ්‍ය වන්නේ එවැනි අරමුණු යළුවැනි . ඉලක්කය අපේ රටේ වගා කල හැකි භූමියෙන් අප තවම නිසි ඵල ප්‍රයෝජන නොගනී එසේ .නොකරගන්නේ නම් අපට හොද අපනයන වෙළෙඳපොලක් සොයාගත හැකනමුත් අප සැමවිටම නායකයන් මත පමණක් යැපෙන . රටක් සංවර්ධනය කිරීමට නම් කලයුතු ප්‍රධානම .රටක්වී ඇතකාර්යය වන්නේ පුරවැසියාගේ ආකල්ප වලට අදාලව ඉලක්ක ගොඩනඟා ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයිමත්යරටක සිටින මිනිසුන් . මිනිසාගේ දියුණුවේ .තරම් වටිනා සම්පතක් රටකට තවත් නැතසීමාව කිසිවෙකුට විස්තර කල නොහැකි අතරම මිනිසාට කුමක් කළ හැකි ද කුමක් වේද කියා කිසිවෙකුට උපකල්පනය කිරිමට නොහැකි ය.

අපේ රටේ දුප්පත්කමට හේතුව රටේ මුදල් නොමැතිකම ද නැතිනම් අපේ රටේ මිනිසුන්ට අරමුණක් නොමැතිකම ද? යැයි මම නොදනිමි. දුප්පත් මිනිසුන්ට කොතරම් මුදල් දුන්නත් ඔවුන් සැමදාමත් දුප්පත් අය ලෙස දිවි ගෙවයි. නමුත් ප්‍රභල අරමුණක් ලබා දුන්නොත් ඔවුන් ඔවුන්ගේ වෙනස ආරම්භ කර ගනු නියත වේ.

අප රට වෙනස් කිරීමට නම් මුලින්ම වෙනස් කළ යුතු වන්නේ අප රටේ මිනිසුන්ගේ සිතුවිලි හා ඉලක්කයන් ය. ධනාත්මක සිතුවිලි නොමැතිකම හා ප්‍රායෝගිත ඉලක්ක නොමැති පුද්ගලයකුට දියුණු විය නොහැක. රටකට ද තත්වය එසේම ය. මුදල්, කාලය, සම්පත් ඉලක්කයක් ඇති විට අපට ගලා එනු ඇත. නමුත් ඉලක්කයක් නොමැති නම් ඒ සියල්ල තිබුණත් අප නිකං සියල්ල ලබා දෙනු මෙන් ඉල්ලා සිටිනු ඇත.

ඒ අනුව සෞභාග්‍ය දැක්මෙන් අපේ රටේ මිනිසුන්ගේ සිත් සදන හා ඉලක්ක සදන වැඩපිළිවෙළක් අපේක්ෂා කළ හැකිය.

# 12. ශ්‍රී ලංකාවේ කාබනික වගාවට විකල්පයක් ලෙස ක්‍රියාත්මක වූ හරිත විප්ලවයේ ප්‍රතිවිපාක.

කේ.එම්.ජී සමරසේන
පුහුණු හා පර්යේෂණ නිලධාරි

ආසියාවේ 1960 න් පසුව හරිත විප්ලවය පිළිබඳ කටයුතු වඩාත් ව්‍යාප්ත වන්නට විය. හරිත වර්ණ විප්ලවය යන්නෙන් අදහස් කරන්නේ කෘත්‍රිම සාධකයන් මගින් ලෝකයේ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉක්මනින් දියුණු කිරීමේ ක්‍රියාවලියයි. මෙය කොළ විප්ලවය ලෙස අර්ථ දැක්වේ. මෙහිදී මෙතෙක් කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවන සාම්ප්‍රදායික ක්‍රමයන් ඉවත් කරමින් නූතන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමක් සිදුවන අතර ඒ තුළින් නිෂ්පාදනය වැඩිවේ යැයි සලකා බලයි.

හරිත විප්ලවය හඳුන්වා දුන්නේ ආහාර අවශ්‍යතා පිළිබඳ විවිධ ප්‍රශ්න තිබුණු පරිසරයකය. මේ කාලයේ ලෝක යුද්ධ ආදීයෙන් පීඩනයට පත්වී ආර්ථික කඩා වැටීම් සිදුවූ යුරෝපීය ආර්ථිකයක් තිබුණි. එහි බලපෑම අධිරාජ්‍ය ගැතිව සිටි ආසියා අප්‍රිකා හා ලතින් ඇමරිකා රටවලට ද දැනුණි. මේ කාලයේ ඇඩි ආහාර අර්බුදයක් දක්නට ලැබුණි. මන්දපෝෂණය , ඌණපෝෂණය යනාදී ගැටළු එළි දකිමින් තිබුණි. අනෙක් අතට ඉඩම් ප්‍රතිසංස්කරණ වැනි රැඩිකල් වෙනස්වීම් ක්‍රියාත්මක විය. සමාජවාදී ආර්ථික මූල ධර්මයන් තුන්වන ලෝකයේ රටවල පැතිරෙමින් පැවති නිසා එය ඇමරිකානු ධනවාදී ආර්ථිකවලට තර්ජනයක් විය. මෙම තර්ජන සඳහා ප්‍රතිචාර දැක්වූ ඇමරිකානු අර්ථක්‍රමය මිනිසුන්ගේ දැවෙන ප්‍රශ්නයක් වන ආහාර අවශ්‍යතාවය ඉක්මනින් ඉටුකර දීමක් තුළින් ප්‍රශ්නවලට විසඳුම් ලැබෙයැයි කල්පනා කළේය. එනම් බඩගින්නට විසඳුම් ඉදිරිපත් කිරීම ඇතිවිය හැකි දේශපාලන අර්බුදයන්ට විසඳුම් වෙතැයි සලකා බැලීමයි. මේ නිසා මෙම රෙකපෙලර් පදනම තුළින් කෘෂිකාර්මික කටයුතුවල පරිවර්තනයක් ඇති කිරීමේ පදනම ආරම්භ කළේය. මේ නිසා මෙක්සිකෝවේදී තිරිඟු සහ ඉරිඟු පිළිබඳ පර්යේෂණ කරන ලදී. මෙහිදී අපට වැදගත් වන්නේ වී පිළිබඳ පර්යේෂණයන් ය. වී පිළිබඳ අන්තර්ජාතික සහල් පර්යේෂණ ආයතනය ඇති කරමින් ආසියාකරයට එහි බලපෑම ව්‍යාප්ත කළේය. මේ අනුව හරිත විප්ලවයෙන් සිදුවන්නේ වඩා සියුම් ක්‍රම මගින් නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කිරීමයි. එහි කාර්යයන් නම්

1. බීජ පර්යේෂණවලට ලක්කිරීම අත්හදා බැලීම හඳුන්වා දීම.
2. ජල පාලනය මෙම බීජ සඳහා අත්‍යවශ්‍ය අංගයක් වීම.
3. යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම අවශ්‍ය වීම.
4. කෘත්‍රිම පොහොර යෙදවීම අවශ්‍ය වීම.
5. කෘෂි රසායනික ද්‍රව්‍යයන් යෙදවීම අවශ්‍ය වීම.
6. සහල් සැකසීම සම්බන්ධ කටයුතු ව්‍යාප්ත කිරීම.

මෙහිදී ලෝක බැංකු ආධාර ඇතිව බීජ පිළිබඳ පර්යේෂණ කටයුතු සිදුවේ. පර්යේෂණ මධ්‍යස්ථාන හඳුන්වා දෙන ලදී. ලංකාවේ බතලගොඩ, මහඉලුප්පල්ලම, බෝඹුවල ආදී වශයෙන් සහල් පර්යේෂණ ව්‍යාප්ත කරන ලදී. මේ සඳහා අවශ්‍ය උපකරණ විදේශ ආධාර පදනමින් සපයා දෙනු ලැබේ. මේවා ඒ ඒ ප්‍රදේශවලට පවතින කාලගුණික හා පස් ඇතුළු වෙනත් භෞතික තත්ත්වයන් සැළකිල්ලට ගෙන වී බීජ හඳුන්වා දෙනු ලැබීය. බී.ජී

වශයෙන් භාවිත වන්නේ බතලගොඩින් ජනනය කරන ලද බීජයන් ය. මහ ඉලුප්පල්ලම එම්.අයි. වශයෙන් ද බෝඹුවල බී.ඩබ්ලිව් වශයෙන් ද ඒ ඒ පරිසරයට ගැලපෙන පරිදි සකස් කර තිබේ.

වර්ෂා ජලයෙන් වුවද ලංකාවේ මේවා වගා කළත් වඩාත් අත්‍යවශ්‍ය වන්නේ වාරි ජල සැපයුමයි. මේ නිසාම ලංකාවේ වියළි කලාපීය ජනාවාස ජලාශ ප්‍රතිසංස්කරණයත් මහවැලි ව්‍යාපාර ආදියත් මෙයට උපකාරි කරගෙන තිබේ. මෙම බීජ යටතේ නිපදවෙන ශාඛවල ජීවකාලය මාස තුනකට පමණ තරම් කෙටිකාලීන වේ. මේවාහි අස්වැන්න සම්ප්‍රදායික බීජවල අස්වැන්ට වඩා ඉතා ඉහළය. එබැවින් වර්ෂයකට කන්න දෙක තුනක්ම වගා කළ හැකිය. මේ නිසා ලංකාවේ පවතින වර්ෂාපතන ඍතුන් අනුව වගා කිරීමට නොහැකිය. කෙටිකාලීන නිෂ්පාදනයන් වශයෙන් කෘත්‍රිම ජල සැපයුම් අවශ්‍ය විය. ඉහළ අස්වැන්නක් සඳහා ජල පාලනය අවශ්‍යම වේ.

යන්ත්‍ර සූත්‍ර භාවිතය අවශ්‍ය වී ඇත්තේ ඉක්මනින් බිම් සකස් කිරීම අස්වැන්න නෙලීම අවශ්‍ය වී ඇති නිසාය. ට්‍රැක්ටර් ඇතුළු කෘෂි ආම්පන්න මේ සඳහා යෙදවේ. එම නිසා මේවා නිපදවන කර්මාන්ත ලංකාවේ නොමැති බැවින් ආනයනය කිරීමට සිදුවිය. මේවා භාවිත කළ හැක්කේ විශාල ඉඩම්වලය. කැබලි වී ගිය ඉඩම්වල මේවා යෙදවීම අපහසුය. මේ නිසා ඉඩම් කැබලි වීම වෙනුවට ඉඩම් ඒකාබද්ධ කිරීමක් අවශ්‍ය වේ. ට්‍රැක්ටර් භාවිතය සඳහා ඉන්ධන ඇතුළු අධික වියදම් වැය කිරීමට සිදුවේ.

මේවා වැඩි දියුණු කරන ලද බීජ නිසා ස්වභාවික පරිසරයේ තත්ත්වයන්ට ඇති අනුකූලතාවය ඉතා අඩුය. එබැවින් වැඩිදියුණු කරන ලද පොහොර භාවිතය අවශ්‍යය. මේ නිසා රසායනික පොහොර ආනයනය කිරීමට ලංකාවට සිදුවේ. මේවා ආනයනය වෙනුවෙන් ඉහළ පිරිවැයක් වැය වේ.

මෙම වැඩිදියුණු කරන ලද බීජ නිතරම ලෙඩ රෝග සහ කෘමින්ගෙන් සිදුවන හානිවලට ලක්වේ. ඒබැවින් වී වගාව ආශ්‍රිත කෘමිරෝග හඳුනා ගැනීමට නිලධාරීන් ගොවීන් පුහුණු කිරීමක් අවශ්‍ය වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ සම්බන්ධව පුළුල් වැඩපිළිවෙළක් දියත් කළේය. ගොවීන්, ගොවි කණ්ඩායම් හමුවී උපෙදස් සේවා සැපයීමේ අවශ්‍යතාවය මෙහිදීද අවධාරණය විය. ඒවගේම වල් බිහිවීම මෙම කෘත්‍රිම බීජ සමග සිදුවේ. ඒවා මර්දනය කිරීමද අවශ්‍ය කාර්යයක් විය.

මෙවැනි කාර්යයන් සමුදායක් එකවර ක්‍රියාත්මක වීමේදී ඒ සම්බන්ධ යෙදවුම් ආශ්‍රිතව රැකි රක්ෂා අවස්ථා ඇති වේ. යෙදවුම් දේශීය වශයෙන් නිපදවිය හැකිනම් සියලුම සම්පත් රට තුළින්ම ලැබෙන තත්ත්වයක් යටතේ වාසිදායක ප්‍රතිඵල ඇති වේ. කෙසේ වෙතත් මෙම ක්‍රියාකාරිත්වය තුළ ජාත්‍යන්තර මට්ටමින් සිදුවන යෙදවුම් සහ වෙනත් සේවා සැපයීමක් ක්‍රියාත්මක වෙයි. ලංකාවේ කෘෂි නිෂ්පාදනයට මේ තුලින් ඉහළ බලපෑමක් සිදුවී තිබෙන බව දැක්විය හැකිය.

හරිත විප්ලවය නිසා පංති විෂමතාවය වැඩි වී ඇතැයි අදහස් කරයි. හේතුව සාම්ප්‍රදායික වගා ක්‍රමවලදී පෞද්ගලික දේපල අයිතියට පමණක් ඉඩම් සීමාවීමයි. හරිත විප්ලවය සමඟ ගොවියාට ඉඩම් මෙන්ම ට්‍රැක්ටර්, ජලය සැපයුම් උපකරණ, රසායනික ද්‍රව්‍ය ඉසින යන්ත්‍ර , ගබඩා උපකරණ ආදී භාණ්ඩ සමූහයක් එක්රැස් කිරීමට අවශ්‍ය විය. ඒවා ලබාගැනීමට හැකි වූ පංතිය වඩාත් පෝෂණය වූ අතර දුප්පත් ගොවීන් සිය ඉඩම් ඔවුනට අලෙවි කළේය.

අනෙක් ගැටළුව නම් නිෂ්පාදන පිරිවැය ඉහළ යාමයි. පොහොර සහ වෙනත් යෙදවුම් වෙනුවෙන් දැරියයුතු පිරිවැය ඉහළ යත්ම ගොවීන්ට නිෂ්පාදන සඳහා අධික වියදම් දැරීමට සිදුවේ. මේ නිසා වී මිල ඉහළ ගියේය. ක්‍රම

ක්‍රමයෙන් බලශක්ති අර්බුදයන් මත යෙදවුම් මිලද ඉහළ ගිය නිසා වී මිල ඉහළ ගියේය. මේ නිසා ගොවීන් අධෛර්යමත් වීම වැලැක්වීමට රජය සහතික මිල ක්‍රමයක් හඳුන්වා දුන්නේය.ඒ අනුව වී පිළිබඳව සහතික මිල ක්‍රමය ලංකාවේ සිදු වූයේ නිෂ්පාදන පිරිවැයට විකල්පයක් වශයෙනි. මෙනිසා සහල් මිල ඉහළ ගිය අතර සහල් පරිභෝගිකයන්ගේ ජීවන වියදම් ඉහළ ගියේය. පොහොර ඇතුළු රසායනික ආයත කිරීමට සිදුවිය. මේ නිසා විදේශ විනිමය වැය වන්නට විය. ක්‍රමයෙන් ඉහළ යන වියදම් යටතේ විදේශ විනිමය වශයෙන් විදේශවලට ඇදීයන ප්‍රමාණයද ක්‍රමයෙන් වැඩිවිය. ලංකාව වැනි රටවලට ට්‍රැක්ටර් ආදියද නිපදවීමේ ශක්තියක් නොමැති නිසා ඒවායේ අමතර කොටස් විදේශවලින් ආයාත කිරීමට සිදුවිය. මේ නිසා විශාල වියදමක් වශයෙන් විදේශ විනිමය විදේශගත වන්නට විය. සහල් ආයාත සීමා වීමෙන් විනිමය ඉතුරු වූවත් යෙදවුම් සඳහා නැවත එම විනිමය කැපකිරීමට සිදුවිය. නව වී බීජ යටතේ නිපදවන ශාකවල ජීව කාලය මාස තුනකට පමණ කෙටි කාලීන වේ. මෙවැනි අස්වැන්න සම්ප්‍රදායික බීජවල අස්වැන්නට වඩා ඉතා ඉහළය. එබැවින් වර්ෂයකට කන්න දෙක තුනක් ම වගාකළ හැකිය. නමුත් මේ නිසා ලංකාවේ පවතින වර්ෂාපතන ඍතූන් අනුව එලෙස වගා කිරීමට නොහැකිය. කෙටිකාලීන නිෂ්පාදනයක් වශයෙන් කෘත්‍රිම ජල සැපයුම් අවශ්‍ය වේ. ඉහළ අස්වැන්න සඳහා ජල පාලනය අවශ්‍ය ම වේ.

යන්ත්‍ර සූත්‍ර භාවිතය අවශ්‍ය වී ඇත්තේ ඉක්මනින් බිම් සකස් කිරීම, අස්වැන්න නෙළීම අවශ්‍ය නිසයි. ට්‍රැක්ටර් ඇතුළු කෘෂි ආම්පන්න මේ සඳහා යෙදවේ. එම නිසා මේවා නිපදවන කර්මාන්ත ලංකාවේ නොමැති බැවින් ආනයනය කිරීමට සිදුවිය. මේවා භාවිත කළ හැක්කේ විශාල ඉඩම්වලය. කැබලි වී ගිය ඉඩම්වල මේවා යෙදවීම අපහසුය. එම නිසා ඉඩම් කැබලි වීම වෙනුවට ඉඩම් ඒකාබද්ධ කිරීමක් අවශ්‍ය වේ. ට්‍රැක්ටර් භාවිතය සඳහා ඉන්ධන වියදම් ඇතුළු අධික වියදම් වැය කිරීමට සිදුවේ.

මෙවැනි වැඩි දියුණු කරන ලද බීජ නිසා ස්වභාවික පරිසරයේ තත්ත්වයන්ට අනුකූලතාවය ඉතා අඩුය. එබැවින් වැඩි දියුණු කරන ලද පොහොර භාවිතය අවශ්‍ය වේ. මේ නිසා රසායනික පොහොර ආයාත කිරීමට ලංකාවට සිදුවේ. මේවා ආනයනය වෙනුවෙන් ඉහළ පිරිවැයක් වැය වේ. මෙම වැඩි දියුණු කරන ලද බීජ නිතරම ලෙඩ රෝග සහ කෘමීන්ගෙන් සිදු වන හානිවලට ලක්වේ. එබැවින් වී වගාව ආශ්‍රිත කෘමි රෝග හඳුනාගැනීමට නිලධාරීන් විසින් ගොවීන් පුහුණු කිරීමත් අවශ්‍ය වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ සඳහා පුළුල් වැඩපිළිවෙලක් දියත් කළේය. ගොවි කණ්ඩායම් හමු වී උපදෙස් සේවා සැපයීමේ අවශ්‍යතාවය මෙහිදී අවධාරණය විය. ඒ වාගේම වල් බිහිවීම මෙම කෘත්‍රිම බීජ සමඟ සිදුවේ. මේවා මර්දනය කිරීමද අවශ්‍ය කාර්යයක් විය.

මෙවැනි කාර්යයන් සමුදායක් එකවර ක්‍රියාත්මක වීමේදී ඒ සම්බන්ධ යෙදවුම් ආශ්‍රිත රැකී රක්ෂා අවස්ථා ඇති වේ. යෙදවුම් දේශීය වශයෙන් නිපදවිය හැකිනම් සියළුම සම්පත් රට තුළින් ම ලැබෙන තත්ත්වයක් යටතේ වාසිදායක ප්‍රතිඵල ඇතිවේ. කෙසේ වෙතත් මෙම ක්‍රියාකාරිත්වය තුළ ජාත්‍යන්තර මට්ටමෙන් සිදුවන යෙදවුම් සහ වෙනත් සේවා සැපයීමත් ක්‍රියාත්මක වෙයි. ලංකාවේ කෘෂි නිෂ්පාදනයට මේ තුළින් ඉහළ බලපෑමක් සිදුවී තිබෙන බව දැක්විය හැකිය.

ශ්‍රී ලංකාව නිදහස ලබන විට පිරිහී ගිය දේශීය කෘෂි අංශයකට හිමිකම් කියූ නිසා සහල් ආයාත කිරීමට සිදුවිය. සාම්ප්‍රදායික භෝගවලින් උපයන විදේශ විනිමය සහල් සඳහා සම්පූර්ණයෙන් යෙදවිය. නිදහසින් පසු රජයන් සහල් ආයාත වියදම් අඩුකර ගැනීමට වී ගොවිතැන දියුණු කිරීමේ කටයුතුවල යෙදුණි. මෙතෙක් ලබාදුන් සහල් සහනාධාරය ක්‍රමයෙන් අඩු කළේය. මේ අනුව 1965 දී ඇතිකළ වගා සංග්‍රාමයක් සමඟ හරිත විප්ලවයේ කටයුතු ආරම්භ විය. මේ කාලයේ වාරිමාර්ග ක්‍රියාත්මක කිරීමත් සිදුවිය. ගොවි හමුදාව වශයෙන් නිර්මාණයක්

ඇති කළේද මෙම අරමුණු ඉටුකර ගැනීමටයි. මේ ක්‍රියා මාර්ගයත් සමඟ හරිත විප්ලවය ආශ්‍රයෙන් ඇති වූ ප්‍රතිඵල 1970 වර්ෂයේ දී වඩාත් දියුණු වූ අතර වර්තමානය දක්වාම මේවා ක්‍රියාත්මක වේ.

මුලින්ම හරිත විප්ලවය නිසා වී නිෂ්පාදනය සීඝ්‍රයෙන් ඉහළ යන්නට විය. 1960 ගණන් වලදී පැවති වී නිෂ්පාදනය අපගේ ආහාර අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වූයේ නැත. දළ වශයෙන් වී බුසල් දසලක්ෂ 40ක් පමණ නිපදවිය. හරිත විප්ලවයේ බලපෑමත් සමඟ 1978 දී වී බුසල් දසලක්ෂ 70 ක පමණ නිපයුමක් ද 1980 වන විට වී බුසල් දසලක්ෂ 90ක් පමණ ද විය. 1982 දී වී බුසල් දසලක්ෂ 106 ක් වශයෙන් ද අඛණ්ඩව බුසල් දසලක්ෂ 100 ට වැඩි නිෂ්පාදනයක් පෙන්නුම් කරයි. ඊට පසු වර්ෂවල බුසල් දසලක්ෂ 116 ක් තරම් නිෂ්පාදනයක් හිමිකරගෙන තිබේ. ලංකාවේ සහල් අවශ්‍යතාවය සැලකූවිට මෙකල සහල් අතින් ස්වයංපෝෂිත වීමට බුසල් දසලක්ෂ 130ක් පමණ තරම් අවශ්‍ය වේයැයි ගණන් බලා ඇත. වී වගාවට අවශ්‍ය යෙදවුම් සපයන බහු ජාතික සමාගම්වල බලපෑම්වලට යටත්වීමට රජයට සිදුවේ. මෙය බොහෝ අය හඳුන්වන්නේ නව අධිරාජ්‍යවාදී සංකල්පයක් ලෙසයි. හරිත විප්ලවය නිසා ඇතිවී තිබෙන වාසි මෙන්ම ක්‍රමක් ක්‍රමයෙන් මතුවන අහිතකර ප්‍රතිඵලයන් ද වේ.

# 15. මූලික ආර්ථික සංකල්ප හඳුනා ගනිමින් ජාතික ආර්ථික අර්බුදය තුල ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම පිළිබඳ විග්‍රහයක්.

අනුෂා හේවගේ
සංවර්ධන නිලධාරි

සමාජ ක්‍රමයක් තුළ මිනිසුන් ජීවත්වීමේදී විවිධ අවශ්‍යතා හා වුවමනා හටගනී. මෙම වුවමනා ඉටුකර ගැනීමට යාමේදී ඔවුනට විවිධාකාරවූ ප්‍රශ්නවලට මුහුණපෑමට සිදුවන අතර ඒ සඳහා විසඳුම් සෙවීමේදී එක් එක් සමාජය කටයුතු කරන ආකාරයද විවිධ ස්වරූප ගනී. මෙසේ මිනිසාගේ විවිධාකාරවූ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා පුද්ගල සමූහයක් සංවිධානගතවීම ආර්ථිකයක් ලෙස පොදුවේ අර්ථ ගැන්වේ. ආර්ථිකයක් තුළ දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ මිනිස් අවශ්‍යතා අසීමිතව පැවතීමත් ඒවා සපුරා ගැනීම සඳහා වන සම්පත් සීමා සහිත වීමත් හේතුවෙන් විකල්ප ප්‍රයෝජන සහිත සම්පත් වඩා ඵලදායී ලෙස තෝරා ගැනීමක් සිදු කළයුතුවීමයි. ආර්ථිකයක් තුළ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ ස්වභාවය පදනම් කර ගනිමින් එකිනෙකට වෙනස් ආකෘතීන් මත රටක ආර්ථික රාමුව සැකසී තිබේ. මේ සඳහා වෙළඳපොල ආර්ථික පද්ධති, විධානගත ආර්ථික පද්ධති හා මිශ්‍ර ආර්ථික පද්ධති උදාහරණ වේ. ශ්‍රී ලංකාවේ මිශ්‍ර ආර්ථික පද්ධතියක් ක්‍රියාත්මක වන අතර ආර්ථික ක්‍රියාවලිය හැසිරවීමේදී රාජ්‍ය මැදිහත්වීමත් සමග පෞද්ගලික අංශයේ දායකත්වයත් සිදුවේ. ආර්ථික විද්‍යා විග්‍රහයට අනුව ආර්ථිකයක් සූක්ෂ්ම හා සාර්ව ආර්ථිකය යන දෙයාකාරයකින් ක්‍රියාත්මක වේ. මිනිසාගේ දෛනික අවශ්‍යතා සමග ගැටෙන මූලික වෙළෙඳපොල කටයුතු සූක්ෂම ආර්ථික විග්‍රහයට අයත්වන අතර මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ භාණ්ඩ හා සේවා වෙළෙඳපොල කටයුතු ඊට ඇතුළත්වේ. රටක අපේක්ෂිත සමස්ත අරමුණු ළඟාකර ගැනීමේ උපාය මාර්ග සාර්ව ආර්ථිකයෙන් අර්ථ ගැන්වෙන අතර අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ළඟා කරගෙන ඇත්ද යන්න සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ මිනුම් දර්ශක මත පදනම්වේ. ආර්ථිකයක ආර්ථික විචල්‍යයන් ජනතාවට වඩා හිතකරවන ආකාරයට හැසිරවීම තුළින් ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග ආර්ථික ප්‍රතිපත්ති ලෙස හඳුනා ගනී. මෙම විග්‍රහය තුලද ආර්ථික අර්බුදය යන්න විමසා බැලීමේදී මූලිකත්වය ගෙන සලකා බැලෙන්නේ රටෙහි ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී ඒවා සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි වන බලපෑමේ වෙනස්වීම පිළිබඳවයි. මෙහිදී සාර්ව ආර්ථික විචල්‍යයන් යනු මොනවාදැයි යන්න දැන ගැනීම වටී. රටක සමස්ත නිමවුම, සේවා නියුක්තිය, පොදු මිල මට්ටම, විනිමය අනුපාතිකය, පොළී අනුපාතිකය, ගෙවුම් ශේෂය ආදිය ඊට අයත්වේ. සමස්තයක් ලෙස ගත් කළ රටක සමස්ත නිෂ්පාදනය හා ආදායම, විරැකියාව සහ උද්ධමනය යන අංශ පිළිබඳ විග්‍රහ කෙරේ.

රටක ආර්ථිකයක් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු සමස්තයක් ලෙස;

මිල ස්ථායීකරණය - උද්ධමනයකින් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය හැසිරවීම අවම උද්ධමනයකින් පවත්වාගෙනයාම.

පූර්ණ සේවා නියුක්තිය - ආර්ථිකය සතු සම්පත් පූර්ණ ලෙස උපරිම කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම.

සාධාරණත්වය - ආර්ථිකයක සියළු පුද්ගලයින් වෙත මූලික අවශ්‍යතා සපුරා ගතහැකි අයුරින් ආදායම් ව්‍යාප්තිය.

ආර්ථික වර්ධනය - ආර්ථිකයක මූර්ත දළ ජාතික නිෂ්පාදනයේ අඛණ්ඩ ඉහළයාම.

තිරසර සංවර්ධනය - පාරිසරික හානි අවම කරමින් පරිසරයේ ගුණාත්මකභාවය රැකගනිමින් ආර්ථිකයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීම හා සමාජ සාධාරණත්වය ආරක්ෂා කිරීම.

රටක සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෙවලම් දෙකක් හඳුනා ගත හැකිවේ.

මුදල් ප්‍රතිපත්තිය -(Monitory Policy) මුදලේ පිරිවැයට බලපෑමක් කිරීම මගින් හෝ මුදල් සැපයුමට බලපෑමක් කිරීම මගින් මිල ස්ථායීතාව පවත්වාගෙන යාමට මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය -(Fiscal Policy) අර්ථිකයක අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා රාජ්‍ය ආදායම් හා රජයේ බදු ප්‍රතිපත්තිය මෙහෙයවීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වන අතර රාජ්‍ය වියදම්, රාජ්‍ය ණය හා රාජ්‍ය බදු මගින් ක්‍රියාත්මක කෙරේ.

ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් රටක ආර්ථික ක්‍රියාවලියේ ගමන්මග, අරමුණු හා ක්‍රියාවලිය පෙන්නුම් කරයි. රටක ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදි ආර්ථිකමය, ගෝලීය බලපෑම්, සම්පත් හිඟකම, ප්‍රාග්ධනය සපුරා ගැනීම, තාක්ෂණය හා වෙළෙඳපොල යනාදි ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ගන්නා විට රටක් ලෙස මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය ජාතිය ගොඩනැගීමයි. යටත්විජිතකරණයට ලක්වූ බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවටද ප්‍රාග්ධනය, දුගීබව හා තාක්ෂණික නොහැකියාව ආදී අභියෝග විය. නමුත් 1948 දී නිදහස ලබන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සිංගප්පූරුව, දකුණු කොරියාව හා තායිලන්තයට වඩා ඉදිරියෙන් විය. අග්නිදිග ආසියාවෙන් දෙවැනි වූයේ ජපානයට පමණි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කඩඉම් අවස්ථා කිහිපයක් 1948 සිට මේ දක්වා හඳුනාගත හැකිවේ. ශ්‍රී ලංකාවේ ආර්ථිකය 1977 න් පසුව විවෘත ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුල විදේශීය පෞද්ගලික අංශය දේශීය ආර්ථිකයට යොමු කරමින් රටෙහි ආර්ථික ප්‍රතිපත්තිය ලෝක ආර්ථික ක්‍රමවේදයට යොමු කරන ලදී. ඒ අනුව ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමෙහිලා ක්‍රියාත්මක කරන ලද ආර්ථික ක්‍රියාවලින් කිහිපයක් පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| - බහුකාර්ය වාරිමාර්ග යෝජනා ක්‍රම | - අපනයන සැකසුම් කලාප |
| - කාර්මික ජනපද හා කර්මාන්තපුර | - ඇඟළුම් කර්මාන්ත |
| - අපනයන සංවර්ධන ගම්මාන | - ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා |
| - ප්‍රාදේශීය සංවර්ධන යෝජනා | - උදාගම් |
| - යටිතල පහසුකම් පුළුල් කිරීම | - ස්වයං රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම |

1994 න් පසුව ආර්ථික ප්‍රතිපත්ති දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථිකය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 2015 වර්ෂය වන විට ආර්ථිකය යටිතල පහසුකම් වඩා පුළුල් මට්ටමට පත්කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය. 2019 වර්ෂය අවසානය වන විට ජාතික ආර්ථික ප්‍රතිපත්ති රාමුව පහත දක්වා ඇති සාර්ව ආර්ථික ඉලක්කයන් සපුරා ගැනීමේ අරමුණින් සම්පාදනය කෙරුණි.

ආර්ථික වර්ධන වේගය 6.5% න් ඉහළට ගෙනයාම.

ඒක පුද්ගල ආදායම ඇ.ඩො.6500 ඉක්මවා යාම.

සේවා වියුක්ති අනුපාතය 4% ට වඩා පහළ අගයකට ගෙන ඒම.

වාර්ෂික උද්ධමන අනුපාතය5% ට වඩා අඩු අගයක් ගැනිම.

වාර්ෂික අයවැය හිගය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස 4% ට වඩා පහත හෙළීම.

තනි ඉලක්කම් පොළී අනුපාතිකයක්.

රුපියලේ අගය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම.

රටක ආර්ථික අරමුණු සාක්ෂාත්වූ විට ජනතාවගේ ජීවන මට්ටම උසස්වීම, සේවා නියුක්තිය ඉහළයාම, විදේශ විනිමය ඉපයුම් ඉහළයාම, ප්‍රාදේශීය සංවර්ධනය වේගවත්වීම, යටිතල පහසුකම් වර්ධනයවීම, නව රැකියා වෙළෙඳපොල පුළුල්වීම. ඉහළ ආර්ථික වර්ධනයක් පැවතීම ආදී තත්ත්වයන් යටතේ ආර්ථිකයක් හඳුනාගත හැකිවේ. පසුගිය කාලවකවානු තුළ ආර්ථික අරමුණු සපුරා ගැනීමේ අරමුණින් යටිතල පහසුකම් යටතේ අධිවේගී මාර්ග, ගුවන් තොටුපොල, වරාය නවීකරණය, විදුලිබලාගාර ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක විය. එපමණක් නොව ආර්ථික ව්‍යාපෘති යටතේ උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය, දිවිනැගුම, ගම නැගුම ආදිය ක්‍රියාත්මක කරන ලදී. දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමෘද්ධි, ස්වයං රැකියා නියුක්තිකයන් දිරිගැන්වීම හා ගෙවතු වගා සංග්‍රාම ක්‍රියාත්මක කරන ලදී. තොරතුරු තාක්ෂණය ග්‍රාමීය මට්ටම දක්වා ප්‍රචලිත කිරීමේ අරමුණින් නැණසල, විදාතා සම්පත් මධ්‍යස්ථාන ආදිය ඇති කරන ලදී. දශක කිහිපයක් තුළ විවිධාකාර වූ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුවද ශ්‍රී ලංකාව අපේක්ෂිත ආර්ථික වර්ධන ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත්ව ඇතිබව පසුගිය වර්ෂවල සාර්ව ආර්ථික දර්ශකයන් අධ්‍යයනය තුළින් අවබෝධවේ. ආර්ථික වර්ධනයක් යනු රටක නිෂ්පාදන ධාරිතාව ඉහළයාම නැතහොත් කාලයක් තිස්සේ මූර්ත ජාතික නිෂ්පාදනයේ සිදුවන අඛණ්ඩ වැඩිවීමයි. ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය 2020 වර්ෂය වන විට (-3.6) දක්වා පහත බැස ඇත. විනිමය අනුපාතිකය ඇ.ඩො සඳහා රු.300.00 ඉක්මවා ගොස් ඇත. උද්ධමන අනුපාතය 2020 වර්ෂයේ 4.6 වූ අගය 15 ඉක්මවා ඇත. 2021 වර්ෂයේ ඇ.ඩො.බිලියන 4.8 ක් ව පැවති විදෙස් සංචිත ප්‍රමාණය 2021 දෙසැම්බර් මස වනවිට ඇ.ඩො.බිලියන 1.0 දක්වා පහත බැස ඇත. මෙසේ රටක ආර්ථිකයක් තුළ ඇතිවන සෘණාත්මක කාලපරිච්ඡේදයක් එසේ නොමැතිනම් ආර්ථික විචල්‍යයන් සැලකියයුතු ලෙස නරක අතට හැරීම ආර්ථික අර්බුදයක් ලෙස අර්ථ දැක්විය හැකිය. යම්කිසි කාලපරිච්ඡේදයක් තුළ රටක් මුහුණදෙන හිඟකම පිළිබඳ තත්ත්වයක් අර්බුදයක් ලෙස අදහස් කෙරෙන අතර එය ආර්ථිකයේ සිදුවන තාවකාලික පසුබෑමක්, බිඳවැටීමක්, අවපාතයක ස්වරූපයක් ගනී. ආර්ථික අර්බුදයකට රට මුහුණපා සිටින බවට සාක්ෂි ලෙස සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ සිදුවන වෙනස්වීම හඳුනාගත හැකිවේ. උදාහරණ ලෙස දළ දේශීය නිෂ්පාදනයේ පහත වැටීම, උද්ධමනය, විරැකියාව, පොළී අනුපාත ඉහළයාම, විනිමය අනුපාත ඉහළ අගයක් ගැනීම ආදී විචල්‍යයන්වේ. ආර්ථික අර්බුදයක් ක්ෂණිකව ඇතිවූවක් නොවේ. 1929 ඇතිවූ ලෝක මහා ආර්ථික අවපාතයට පසුව 2007 අවසාන භාගයේ ඇමරිකා එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගනිමින් දැවැන්ත ආර්ථික අර්බුදයක් හිස එසවීය. එහි ප්‍රතිවිපාක විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග කේන්ද්‍රවීමේදී ශ්‍රී ලංකාවටද බලපෑමක් ඇතිවේ. එපමණක් නොව දශක කිහිපයක් පුරා විවිධාකාරයෙන්

බලපවත්වන කරුණු සමස්තයක් ලෙස ආර්ථික අර්බුදය කෙරෙහි ඍජු හෝ වක්‍ර බලපෑමක් ඇති කර ඇතිබව පැහැදිලිවේ. උදාහරණ වශයෙන්;

දශක තුනක් පුරාවට විහිද ගිය කුරිරු යුද්ධයේ අවසානයත් සමග ආර්ථිකය ගොඩනැංවීම එතරම් පහසු නොවීය.

ගෝලීය මූල්‍ය ආර්ථික අර්බුද හමුවේ විදේශීය ප්‍රාග්ධන ලබා ගැනීමේ ප්‍රවේශයන් හිගවීම.

අඛණ්ඩව පවතින වාර්ෂික අයවැය හිගය හේතුවෙන් පරිභෝජන ණය ප්‍රතිශතය ඉහළයාම.

බදු ප්‍රතිපත්තීන් හි පවතින දුර්වලතා හා බදු අයකරගැනීමේදී පවතින දුර්වලතා.

රාජ්‍ය සේවයේ ප්‍රසාරණය.

කොවිඩ්-19 කොරෝනා වසංගත තත්ත්වය.

රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණයේ පවතින අකාර්යක්ෂමතාවය හා රාජ්‍ය ව්‍යාපාර පාඩු ලැබීම.

ස්වභාවික උපද්‍රව (සුනාමි, ගංවතුර, නියඟයන්).

පාස්කු ප්‍රහාරය වැනි අභ්‍යන්තර යුධ ගැටුම්.

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික අර්බුදය මේ වනවිට ප්‍රධාන පැතිකඩ තුනක් ඔස්සේ හඳුනාගත හැකිවේ. එනම් විදේශ විනිමය සංචිත හිගය, බලශක්ති අර්බුදය හා විදේශ ණය අර්බුදය ලෙසිනි. විදේශ විනිමය සංචිත යනු රටක මහ බැංකුව හෝ මුදල් අධිකාරීන් පවත්වාගෙන යන විදේශ මුදල් තැන්පත්වේ. නිල සංචිත නැතහොත් ජාත්‍යන්තර නිල සංචිත ලෙසද හැඳින්වෙන මෙම විනිමය සංචිත රන් සංචිත, විශේෂ හර ගැණුම් අයිතිය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත (කෝටාව) ලෙස පවතී. විදේශ සංචිත පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය වන්නේ රටක ආනයන ගෙවීම් පියවීම, ණය පියවීම, ද්‍රවශීලතාවය පවත්වාගෙනයාම, විදේශ ආයෝජන ආකර්ෂණය හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යනාදියයි. සාම්ප්‍රදායික ප්‍රාථමික අපනයන ආර්ථිකයකට හිමිකම්කීම මත ඍණ විදේශ වෙළෙඳ ගිණුමක් පැවතීම මීට ආසන්නතම හේතුව ලෙස හඳුනාගත හැකිවේ. අත්‍යවශ්‍ය නොවන ආනයන සම්බන්ධයෙන් වන ලිහිල් ආනයන ප්‍රතිපත්ති, කාර්මික අංශයේ දායකත්වය අපේක්ෂිත මට්ටමට ළඟා නොවීම හා විදෙස් ආයෝජන ආකර්ෂණය සැළකියයුතු ලෙස පහත වැටීම අර්බුදයට ආසන්න හේතු ලෙස හඳුනාගත හැකිවේ. විදේශ ණය අර්බුදය නිදහසින් පසු ආර්ථිකයේ බලපවත්වන වාර්ෂික අයවැය හිගය හේතුවෙන් පැන නැගි කරුණක් වන අතර එය ප්‍රාග්ධන වියදම් පූරණය පමණක් නොව සහනාධාර ඇතුළු වර්තන වියදම් පියවීම සඳහාද යොදා ගනී. වර්ෂයකට දළ වශයෙන් රාජ්‍ය ණය වැඩිවීමේ ප්‍රතිශතය 12% ක අගයක් ගනී. රාජ්‍ය ආදායම් ප්‍රභවයන් නිසි ලෙස ඇස්තමේන්තු කිරීමට අපොහොසත්වීම හා ඇස්තමේන්තුගත ආදායම් බදු ප්‍රතිපත්තීන් හරහා විධිමත්ව අයකර ගැනීමට කටයුතු නොකිරීම අපේක්ෂිත රාජ්‍ය ආදායම් පහළයාමට හේතුවී තිබේ. ඉහතින් සළකා බලන ලද අර්බුදයන්ගේ අතුරුඵලයක් ලෙසින් හා ආර්ථික ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දුර්වලතා හේතුවෙන් උද්ගතව ඇති ගැටළුවක් ලෙස බලශක්ති අර්බුදය හඳුනා ගතහැකිවේ. මන්ද යත් විකල්ප බලශක්ති ප්‍රභවයන් වෙත විතැන්වීමට අපොහොසත්වීම සැලසුම්කරණයේ පැවති දුර්වලතාවයක් වන අතර විදේශ විනිමය හිගය ඛනිජ තෙල් අපනයනයේදී මුහුණපාන ගැටළුවකි.

සමස්ත ආර්ථිකය තුළ අර්බුදකාරී පරිසරයක් ගොඩනැගෙනවිට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස එහි බලපෑමට හසුවන ප්‍රබලම කණ්ඩායම අඩු ආදායම්ලාභී ග්‍රාමීය ප්‍රජාව බව අවිවාදාත්මක කරුණකි. මන්ද යත් ඔවුන්ට අනන්‍යවූ ලක්ෂණයන්ගෙන් එනම් දිළිඳුබව, පවුලේ ජනගහනය අධිකවීම, ප්‍රාග්ධන ඌනතා පැවතීම, දැඩි ආදායම් විෂමතාවයක් පැවතීම, කෘෂි ආර්ථිකයක් මත යැපීම, තාක්ෂණික පහසුකම්හි පවත්නා ඌනතාවයන් හා අඩු යටිතල පහසුකම් පැවතීම යනාදියයි. උද්ධමනය ඉහළයාම තුළ අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හැකියාව නැතහොත් ග්‍රාමීය ප්‍රජාවගේ ක්‍රය ශක්තිය පහත බැසීමෙන් මූලික අවශ්‍යතාවයන් පවා සපුරා ගැනීමට නොහැකි මට්ටමට ඔවුන් පත්වනු ඇත. විරැකියාව ඉහළයාමෙන් ආදායම් මාර්ග අහිමි පිරිසක් බවට පත්වනු ඇත. ආර්ථික අර්බුදය තුළ ග්‍රාමීය ප්‍රජාව තවදුරටත් අසරණ තත්ත්වයට පත්වනු ඇත. නිදහසින් පසු ග්‍රාමීය ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් විවිධ වැඩසටහන් (ජනසවිය, සමෘද්ධිය, දිවිනැගුම, ගමනැගුම) ක්‍රියාත්මක වුවද එම වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් සහනාධාර ලබා ගැනීමේ අරමුණින් බැහැරව ස්ථිර ජීවනෝපාය මාර්ගයන් වෙත ක්‍රමිකව විතැන්වීමක් සිදුවී නොමැත. ඒ අනුව සිදුව ඇත්තේ සෑම වැඩටහනක් යටතේම එකම ප්‍රජාවක් කාලාන්තරයක් සහානාධාර මත යැපීමකි. නමුත්, සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඊට සමගාමීව සහනාධාරයෙන් ඔබ්බට එම ප්‍රජාව යම් නිෂ්පාදන කාර්යයකට සක්‍රියව දායක කර ගැනීම තුළින් ආදායම් මාර්ග සැලසෙනවා සේම රටේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියට දායකවීමෙන් යැපුම් මානසිකත්වයෙන් මිදී ස්ථිර ආදායම් මාර්ග හිමි සේවා නියුක්තිකයන් පිරිසක් ප්‍රජාව තුළ බිහිවනු ඇත. මේ සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් පුළුල් කිරීම හා ප්‍රාදේශීය වශයෙන් කේන්ද්‍රගතව ඇති භෞතික සම්පත් හා පාරිසරික සාධක කෙරෙහි නිවැරදි ශක්‍යතා ඇගයීම් සිදුකොට ග්‍රාමීය ප්‍රජාව සක්‍රීය ලෙස දායක කර ගතහැකි ඵලදායී නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලීන් බිහිකරලීමේ අවකාශ ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ ඇතුළත් කිරීම කළ යුතුවේ. එමගින් ආර්ථිකයට අත්වන වාසි අතර සම්පත් උපයෝජනය, දිළිඳුකම පිටුදැකීම, නිෂ්පාදන කාර්යයට ග්‍රාමීය ප්‍රජා සහභාගිත්වය මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ යැපුම් මානසිකත්වය දුරුවීම දැක්විය හැකිවේ.

ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සහභාගිත්වය සමගින් වැඩිදියුණු කළ හැකි නිෂ්පාදන ආයෝජන කර්මාන්ත ක්ෂේත්‍ර කිහිපයකට උදාහරණ ලෙස දක්වන්නේ නම් කඩදාසි, සීනී, පොහොර, බෙහෙත්වර්ග, ටින්මාළු, විසිතුරු සැරසිලි නිෂ්පාදන, ආභරණ, සපත්තු ඇතුළු රබර් ආශ්‍රිත නිෂ්පාදන ආදී ක්ෂේත්‍ර ඉන් කිහිපයකි. එපමණක් නොව මෑත කාලවකවානුව තුළ සීග්‍රයෙන් වර්ධනය වූ අත්‍යවශ්‍ය නොවන ආනයන වෙනුවට ආනයන ආදේශන කර්මාන්ත ක්ෂේත්‍රයන් බිහි කරලීම තුළින් වැඩි නිෂ්පාදන අවස්ථා සැලසෙනවා සේම විවිධ කුසලතා සහිත ශ්‍රමික ප්‍රජාවට රැකියා අවස්ථා උත්පාදනය වනු ඇත. රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී ග්‍රාමීය ආර්ථිකය නැංවීම අරමුණු කිරීමෙහිලා එහි සඵලදායීත්වය වෙනුවෙන් අවධානය යොමු කල යුතු කරුණු කිහිපයකි. එනම්

- මානව සංවර්ධන දර්ශක ඉහළ අගයක් නිරූපනය කරන රටක් වශයෙන් එම ශ්‍රම බලකාය කාර්මික හා තාක්ෂණ ඥානයෙන් පිරිපුන් ශ්‍රම බලකායක් බවට සහතික වියහැකි මට්ටමට ප්‍රායෝගිකත්වයෙන් සවිබල ගැන්වීම.

- දේශීය මෙන්ම විදේශීය ශ්‍රම වෙළෙඳපොල අරමුණු කරගනිමින් ගෝලීය ශ්‍රම වෙළෙඳපොලට ගැලපෙන ලෙස ශ්‍රම බලකාය අවශ්‍ය පරිදි විදේශීය විශේෂඥ දැනුමින් සන්නද්ධ කිරීම.

- ව්‍යවසායකත්වයට ප්‍රමඛතාවය ලබාදීම හා ඒ සඳහා තරුණ ප්‍රජාව පෙළඹවිය හැකි ක්‍රමවේද හඳුනාගැනීම.

- ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ශිෂ්‍ය ප්‍රජාව තුළ ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීම හා ආකල්පමය වෙනසක් ඇති කළ හැකි ප්‍රතිසංස්කරණ සැකසීම.

- ආර්ථිකයේ නිෂ්පාදන ක්ෂේත්‍රය ආනයන ආදේශන මෙන්ම විදේශ වෙළෙඳපොල තුළ අපනයන විවිධාංගීකරණයට අවකාශ ඇතිකිරීම.

- ප්‍රාදේශීය ස්වභාවික සම්පත් ව්‍යාප්තීන් හඳුනාගැනීම හා ප්‍රජා හැකියාවන් හඳුනා ගැනීම.

- දේශීය සාම්ප්‍රදායික නිෂ්පාදන කර්මාන්ත ජාත්‍යන්තර වෙළෙඳපොලට ගැලපෙන පරිදි සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික නිපුණතාවය ග්‍රාමීය මට්ටමට ළඟා කරදීම.

- නූතන තාක්ණික මෙවලම් හා උපකරණ සහනදායී ලෙස ලබා ගතහැකි ප්‍රවේශ ග්‍රාමීය ප්‍රජාව වෙත ළඟා කරදීම.

- යටිතල පහසුකම්, මුල්‍ය සහන ව්‍යාපෘති, ඉතුරුම් හා ආයෝජන ක්‍රමවේද ඇති කිරීම.

- මූලික අදියරේදී නිෂ්පාදන සඳහා දේශීය වෙළෙඳපොල සුරක්ෂිතතාවය ඇති කිරීම හා අතරමැදි මැදිහත්කරුවන් අවම වන පරිදි රාජ්‍ය මැදිහත්වීමක් සිදු කිරීම.

- නාගරික හා ග්‍රාමීය ආර්ථික ව්‍යුහයන් තුළ පවතින විෂමතාවයන් හැකිතාක් අවම වන අයුරින් මූලික සම්පත් බෙදාහැරීම විධිමත් කිරීම.

- ග්‍රාමීය ප්‍රජාව සඳහා අවශ්‍ය පරිපාලන අවශ්‍යතා සපුරා ගැනීමේ ප්‍රවේශ පුළුල් කිරීම හා සරල ක්‍රමවේද හඳුන්වාදීම.

- ක්ෂේත්‍රගත නිලධාරීන්ගේ දැනුවත්භාවය, නායකත්ව ගුණාංග, වගකීම්, රාජකාරී ඉටුකිරීම පිළිබඳ ධනාත්මක චින්තනය ආදිය පිළිබඳව අවධානය යොමු කිරීම හා අධීක්ෂණ කටයුතු විධිමත් කිරීම.

මෙසේ රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති නිසි පරිදි රාජ්‍ය යාන්ත්‍රණය තුළ ක්‍රියාත්මක වීමේදී අපේක්ෂිත අරමුණු වඩා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමේ අවස්ථාව ආර්ථිකය උරුම කර ගනු ලබන අතර එමගින් ආර්ථික වර්ධනයක් වෙත රට ගමන් කරනු ඇත.

# 14.ග්‍රාමීය සංවර්ධනයේදී ගම හා නගරය අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ වැදගත්කම .

ඩබ්. අනුෂා ප්‍රියංජනී
සංවර්ධන නිලධාරි

ලෝකයේ රටවල් පිළිබඳ විග්‍රහ කර ගැනීමේදී සමස්ත ලෝකයේම මුළු ජනගහනයෙන් අඩකටත් වඩා වැඩියෙන් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලය. කාලීනව මෙම ප්‍රතිශතයේ යම් අඩුවීමක් දක්නට ලැබුණද තවමත් සමස්ත ලෝකයේම ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවත්වන ජනතාවගේ ප්‍රමාණය නාගරික ප්‍රදේශවලට වඩා ඉදිරියෙන් සිටී.

ලංකාව පිළිබඳ තත්වය විමසීමේදී මෙම තත්වය ලෝක පරිමාණයටත් වඩා ඉදිරියෙන් සිටී. ලෝක බැංකු වාර්තාවන්ට අනුව 2011 වර්ෂයේ දත්ත අනුව ලෝක ජනගහනයෙන් ග්‍රාමීය ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය 48%කි. නමුත් ලංකාවේ මෙම තත්වය ඉහළින් සිටින අතර ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ එය මුළු ජනගහනයෙන් 80% වඩා වැඩි වේ. ඒ අනුව ලංකාවේ ජාතික සංවර්ධන ක්‍රියාදාමයේදී වඩා අවධානය යොමු කළ යුත්තේද වඩා ඉදිරියෙන් සිටිනුයේද ග්‍රාමීය ජනතාවයි.

ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයේදී ලංකාවේ ආර්ථික ව්‍යුහය පිළිබඳ අවධානය යොමු නොකොට සංවර්ධනය කිරීම ඉතා අපහසු වේ. මක් නිසාද යත් ලංකාව පවතින්නේ නිෂ්පාදන ආර්ථිකය මුල් කර ගත් ආර්ථික රටාවකි. ලංකාව ප්‍රධාන වශයෙන් කෘෂි අර්ථික රටාවකි. වර්තමානය වන විට යම් යම් වෙනස්කම් දක්නට ලැබුණද , මීට දශක කීපයකට පෙර ලංකාවේ ප්‍රධාන අපනයන භෝගය ලෙස සලකනු ලැබුවේ තේ, රබර් හා පොල්ය. මෙකී නිෂ්පාදන ක්‍රියාවලිය සැබෑ ලෙසින්ම ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රය කර ගනිමින් නිෂ්පාදනය කරන්නකි. එපමණක්ද නොව, ලංකාවේ වී වගාව මුල් කර ගත් කෘෂි ආර්ථික ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ හා ග්‍රාමීය ජනතාව මුල් කොට ගනිමින් ක්‍රියාත්මක වේ. තත්ත්වය මෙසේ හෙයින් වර්තමානයේදී ලංකාවේ ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී සැබෑ ලෙසින්ම ග්‍රාමීය සංවර්ධනය වැදගත් බව පෙනේ. එසේ හෙයින් ලංකාවේ සංවර්ධන කාර්යයේදී ප්‍රධාන දිශානතිය ලෙස ආර්ථික විශේෂඥයින් සලකනු ලබන්නේ ප්‍රාදේශිය හා ග්‍රාමීය සංවර්ධනයයි. මේ අනුව ග්‍රාමීය අඩු ආදායම්ලාභි ජනතාව සවිබලගන්වා දිළිඳුකම අවම කොට ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සහ සැළසුම් සකස් කිරීමේදී ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර අත්‍යාන්තයෙන්ම බැඳී පවතින අන්තර් සම්බන්ධතාවය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

ලංකාවේ ආර්ථිකය දෙස විමසීමේදී දැනට ආදායම් මාර්ගය ලෙස වැඩි දෙනෙක් නියැලී සිටින කර්මාන්තය ලෙස කෘෂි කර්මානත්ය දැක්විය හැකිය. ලංකාවේ කෘෂි ආර්ථිකය යැපුම් ආර්ථිකයක් ලෙස දැක්විය හැකිය. ලංකාවේ ප්‍රධාන ආහාරය බත්ය. ඒ අනුව ලංකාවේ හෙක්ටයාර් 807, 800 ක පමණ භූමි බාගයක වී වගා කරන අතර ලංකාවේ ජනගහනයෙන් 879000 පමණ වන පවුල් සංඛ්‍යාවක් වී නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳී සිටී. මෙම ප්‍රමාණය රටේ සමස්ත ජනගහනයෙන් 20% ක් පමණ වුවද , ජීවනෝපාය අනුව ශ්‍රම බලකාය වර්ගීකරණයේදී 34.7 ක් වන බව පෙනේ.

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවතින අන්තර් සම්බන්ධතාවය පිළිබඳ සැළකීමේදී ඒ පිළිබඳව විද්වත් කතිකාවක් ඇති වන්නේ 1980 දශකයෙන් පසුවයි. ඒ අනුව විද්වතුන්ගේ අදහස වන්නේ ග්‍රාමීය සංවර්ධනයේදී ග්‍රාමීය නාගරික වශයෙන් තව දුරටත් නොසළකා මෙම අංශ දෙකම එක් කොට කරන ඒකාබද්ධ සංවර්ධනයක් විනා ඒක පාර්ශ්වීය සංවර්ධනයක් පිළිබඳව නොවේ. එක්සත් ජාතීන්ගේ ජනාවාස පිළිබඳ ආයතනය (UN HABITAT) දක්වන ආකාරයට

ප්‍රාග්ධන ගලනය, පුද්ගල භාණ්ඩ ගලනය, අදහස්, ආකල්ප, තාක්ෂණය හා නවෝත්පාදන ගලනය හරහා ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ ඒකාබද්ධ වී ඇති බැවින් මෙම ප්‍රදේශ සංවර්ධනය සඳහා ග්‍රාමීය නාගරික සංවර්ධන ප්‍රවේශය යනුවෙන් ( Rural Urban Development Approach) ඊට ආවේණික සංවර්ධන උපාය මාර්ගයක් භාවිතා කළ යුතු බවයි. ග්‍රාමීය සංවර්ධනය සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් දශක කිහිපයක් පුරා විවිධ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කළද එම රටවල තවමත් නොදියුණු ග්‍රාමීය ප්‍රදේශ පවතී. ඒ අනුව විශාල ග්‍රාමීය ජනතාවක් හා අඩු නාගරික ජනතාවක් සිටින ශ්‍රී ලංකාව වැනි රටක ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවතින පරතරය අඩු කර ගැනීමෙහිලා සංවර්ධන සැළසුම් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමෙහිදී ග්‍රාමීය නාගරික අන්තර්සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. ග්‍රාමීය හා නාගරික වශයෙන් වන බෙදීම යුරෝපයේ කාර්මික විප්ලවයත් සමඟ එම රටවල ඇති වූ වේගවත් නාගරීකරණය සමඟ විද්වතුන්ගේ අවධානයට ලක් වූවකි. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල දැක ගත හැකි ව්‍යුහාත්මක ලක්ෂණ සැළකිල්ලට ගනිමින් එම ප්‍රදේශ එකිනෙකට වෙනස් ප්‍රදේශ ලෙස නිර්වචනය වූ අතර ආයෝජන හා සංවර්ධන සැළසුම් සකස් කිරීමේදී මෙම ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් සැළකිල්ලට ගන්නා ලදි. යටත්විජිතකරණය නිසා හුදෙක්ම නාගරික ගැති සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීමේ ප්‍රථලයක් ලෙස වර්තමානය දක්වා දියුණු වෙමින් පවතින රටවල ග්‍රාමීය නාගරික පරතරය වැඩි වී ඇති අතර නාගරික ප්‍රදේශ ග්‍රාමීය ප්‍රදේශවලට වඩා ශක්තිමත් වී ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ¾ පමණ වන ජනතාවක් වාසය කරන්නේ ග්‍රාමීය ප්‍රදේශ වන අතර ජාතික සංවර්ධනයේදී ග්‍රාමීය සංවර්ධනය ඉතා වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. ඒ අනුව ග්‍රාමීය සංවර්ධන සැළසුම් සකස් කිරීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී මෙම ප්‍රදේශ දෙක අතර පවතින අන්තර් සම්බන්ධතාවය අවබෝධ කර ගතුයුතු සේම එම සම්බන්ධතාවය තීව්‍ර වන සේ සැළසුම් සකස් කළය යුතුය.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ භෞතික, ආර්ථික, සමාජ සේවා පහසුකම්, ප්‍රජා විද්‍යාත්මක, තාක්ෂණික ආකල්පමය හා පාරිසරික ආදී සංකීර්ණ සබඳතා රාශියකින් එකිනෙක හා බැඳී පවතින අතර එම සබඳතාහි තීව්‍රතාවය විවිධ හේතු මත ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. සංවර්ධිත රටවල ඉහළ නාගරීකරණය සමඟ වඩාත් ශක්තිමත් ග්‍රාමීය නාගරික සබඳතා ගොඩනැඟී ඇති අතර බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ශක්තිමත් ග්‍රාමීය නාගරික සබඳතා තවමත් ගොඩනැඟී නැත.

ග්‍රාමීය හා නාගරික අන්තර් සම්බන්ධාවයෙහි වැදගත්කම සළකා බැලීමේදී මෙම කොටස් දෙකෙහි ස්වරූපය පිළිබඳ දළ අවබෝධයක් අවශ්‍ය වේ. ග්‍රාමීය ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත වන්නේ කෘෂි කර්මය වන අතර නාගරික ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත වන්නේ කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා සේවා සැපයීමයි. මෙම ප්‍රදේශ දෙක අතර සම්බන්ධතාවය ගොඩ නැඟෙන්නේ ග්‍රාමීය ජනතාව නාගරික භාණ්ඩ හා සේවා මත යැපීමත් නාගරික ජනතාව ග්‍රාමීය සම්පත් හා නිෂ්පාදනයන් මත යැපීමත් නිසාය.

ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා වන ලෝකයේ පිළිගන්නා ලද පොදු නිර්නායක නැත. එක් එක් රටවල් සිය අභිමථාර්ත පරිදි තීරණය කර ගන්නා ලද නිර්නායක පදනම් කර ගනිමින් නාගරික ප්‍රදේශ හඳුනා ගනු ලැබේ. බොහෝ රටවල තමන් විසින් තීරණය කර ගන්නා ලද කිසියම් ජන සංඛ්‍යාවක් මේ සඳහා භාවිතා කරනු ලබන අතර ඇතැම් රටවල් ජන ඝණත්වය, ද්විතියික හා තෘතියික ආර්ථික කටයුතුවල නියුක්ත ජන සංඛ්‍යාව පරිපාලන හෝ පළාත් පාලන මායිම් වැනි නිර්ණායක වලින් එකක් හෝ කිහිපයක් භාවිතා කරයි. ශ්‍රී ලංකාව නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා පළාත් පාලන මායිම් භාවිතා කරයි.

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යුහාත්මක ලක්ෂණ අනුව මෙම ප්‍රදේශ එකිනෙකට වෙන්ව හඳුනා ගත්තද ඒවා නිරන්තරයෙන් එකිනෙකට බද්ධව ක්‍රියා කරයි. Jefferson (1931) පවසන පරිදි නගරවලට තනිවම වර්ධනය විය නොහැකි අතර ග්‍රාමීය ප්‍රදේශවල අනුග්‍රහය ඒ සඳහා අත්‍යවශ වේ. ග්‍රාමීය නාගරික සබඳතා පිළිබඳව කරන ලද අධ්‍යයනවලදී හෙළි

වූයේ නාගරික වැසියන් ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදන මත යැපීමත්, ග්‍රාමීය වැසියන් තම ආදායම සඳහා නගරය භාවිතයට ගැනීමටත් නිරන්තරයෙන් කටයුතු කරන බවයි. ග්‍රාමීය ජනතාව ගම්වල ජීවත් වෙමින් ජීවිතයේ විවිධ අවශ්‍යතා ලබා ගැනීම සඳහා එනම් සිල්ලර බඩු, ඇඳුම් පැළඳුම්, ගෘහභාණ්ඩ, අධ්‍යාපනික කටයුතු, සෞඛ්‍ය, පරිපාලන, විනෝදය හා උදක්ම රැකියා සඳහා නගරයට පැමිණෙති. එමෙන්ම ග්‍රාමීය ජනතාවගේ කෘෂි නිෂ්පාදන ඇතුළු අනෙකුත් නිෂ්පාදන අලෙවි කර ගැනීමේ වෙළෙඳපොල ඇත්තේද නගරය කේන්ද්‍ර කර ගනිමිනි.

Mushi( 2003) පවසන්නේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර මෙලෙස ඇතිවන අන්තර් සම්බන්ධතාවය ග්‍රාමීය ප්‍රදේශවලට පමණක් නොව නාගරික ප්‍රදේශවලටද යහපත් අයහපත් ආකාරයෙන් බලපෑම් ඇති කරන බවයි. ග්‍රාමීය නිෂ්පාදනවල මිළ පහළ යාම හෝ මිළ අඩු වීම ග්‍රාමීය දරිද්‍රතාවයට හේතු වනවා පමණක් නොව නාගරික ප්‍රදේශවල භාණ්ඩ හා සේවා වල ඉල්ලුම පහළ යාමට ද හේතු වේ. එමෙන්ම කෘෂිකාර්මික ද්‍රව්‍ය ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික වෙළෙඳපොලට ගලා යාම, නිමි භාණ්ඩ නාගරික ප්‍රදේශවල සිට ගමට ගලා යාම වැනි දෛනිකව හෝ කාලීනව සිදු වන සංචලතා තාක්ෂණය, තොරතුරු ගලා යාම, මූල්‍යමය ගණුදෙනු ආදි සංකීර්ණ ක්‍රියාවලින් රාශියක් නිරන්තරයෙන් ගම හා නගරය අතර සිදු වේ. මේ තුළින් ගොවියා හා වෙළෙඳුන් අතර මෙන්ම නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින් අතරද දෛනිකව හුවමාරු සබඳතා ඇති වේ. මෙලෙස ගම හා නගරය සමඟ නිරන්තරයෙන් පවතින අන්තර් සබඳතාවය ගමේ සංවර්ධනයට මහත් රුකුලකි.

ග්‍රාමීය සංවර්ධනයේදී ගම හා නගරය අතර පවතින භෞතික සම්බන්ධතාවය ඉතා වැදගත් වේ. එය ග්‍රාමීය සංවර්ධනයේ තීරණාත්මක සාධකය වශයෙන්ද හැඳින්විය හැකිය. මෙහිදී සිදුවන භෞතික සම්බන්ධතාවල ස්වභාවය අනෙකුත් සියලු සම්බන්ධතාවයන්ගේ තිව්‍රතාවය කෙරෙහි බලපායි. භෞතික සම්බන්ධතාවයේදී මිනිසා විසින් ඇති කරන ලද ප්‍රවාහන ජාලය වශයෙන් සැලකෙන මහා මාර්ග ජල මාර්ග හා දුම්රිය මාර්ග ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධනය සඳහා වැදගත් කාර්යයභාරයක් ඉටු කරනු ලැබේ. දියුණු කරන ලද කාර්යක්‍ෂම මාර්ග පද්ධතියක් තුළින් ගමන් කිරීමේදී ගත වන කාලය හා ප්‍රවාහන පිරිවැය අඩු වේ. භාණ්ඩ හා පුද්ගල සංචලතාව වැඩි වන විට වෙළෙඳපොල ප්‍රසාරනය වේ. ආයෝජනය ඉහළ යයි. අධ්‍යාපන අවස්ථා පුළුල් වේ. සන්නිවේදනය දියුණු වී සේවා සපයනු ලබන ප්‍රදේශ වැඩි වේ. ප්‍රවාහන පද්ධතිය දුර්වල නම් නිෂ්පාදන ගමට සීමා වීම, රැකියා අවස්ථා විරල වීම මෙන්ම අඩු කාර්මීකරණය වැනි දේ සිදු වේ. එම නිසා දියුණු ප්‍රවාහන පද්ධතියක් ග්‍රාමිය නාගරික සම්බන්ධතාවය වැඩි කිරීමට හේතු වේ. ග්‍රාමීය සංවර්ධනයේදී මූලික අංගය වන්නේ ආර්ථිකය දියුණු වීමයි. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ ආර්ථික පදනම වශයෙන් එකිනෙකට වෙනස් වුවද ඒ මත ඇති වන අන්තර් සම්බන්ධතා ග්‍රාමසංවර්ධනයේදී ඉතා වැදගත් වේ. ශක්තිමත් ආර්ථික සම්බන්ධතා හරහා භූගෝලීය වශයෙන් ප්‍රදේශ ඒකාබද්ධ කරන අතර දුර්වල ආර්ථික සම්බන්ධතා ග්‍රාමීය ප්‍රදේශ හුදකලා කිරීමට හේතු වේ. ගම හා නගරය අතර පවතින ආර්ථික සම්බන්ධතාවය නිෂ්පාදන සම්බන්ධතා, වෙළෙඳපොල සම්බන්ධතා, මූල්‍යමය සම්බන්ධතා වශයෙන් කොටස් තුනක් යටතේ සාකච්ඡාකළ හැකිය.

ග්‍රාමීය සංවර්ධනයේදී නිෂ්පාදන සම්බන්ධතාවල වැදගත්කම අංශ කිහිපයකින් සිදු වේ. එක් අතකින් නිෂ්පාදන කර්මාන්ත යනු ප්‍රාග්ධනය, තාක්ෂණය, ශ්‍රමය, ස්වභාවික සම්පත් ආදී ග්‍රාමීය නාගරික අවශ්‍යතා දෙකම එකිනෙකට බැඳුනු ජාලයක් වන අතර ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ දෙකෙහිම වර්ධනයට නිෂ්පාදනවල පවතින සම්බන්ධතාවය වැදගත් වේ. නාගරික ප්‍රදේශ මඟින් ග්‍රාමීය ප්‍රදේශවල කෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය කෘෂි උපකරණ නිෂ්පාදනය හෝ අලෙවිය සිදු කරනු ලබන අතර ග්‍රාමීය ප්‍රදේශ මඟින් නාගරික නිෂ්පාදන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයනු ලැබේ.

වෙළෙඳපොල සබන්ධතා යනු භාණ්ඩ හුවමාරුවයි. නිෂ්පාදන භාණ්ඩ හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ එකිනෙක වෙළෙඳපොල වශයෙන් ක්‍රියාකරනු ලබයි. වෙළෙඳපොල යනු ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් හමු වන ස්ථානය වේ. ඒ අනුව ග්‍රාමීය නිෂ්පාදන අලෙවිකර ගැනීමට ගැමියා වෙළෙඳපොලට පැමිණෙන විට ඒවා මිළට ගැනීමට නාගරික ජනතාව වෙළෙඳපොල කරා පැමිණෙති. නාගරික ප්‍රදේශවල පිහිටා ඇති බැකු හා මූල්‍ය ආයතන මඟින් ගැමියාට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයනු ලබන අතර එහිදී ඉතිරිකිරීම්, ණය, ලීසිං පහසුකම් සපයනු ලැබේ.

සේවා පහසුකම් ලබා ගැනීමට ජනතාවට ඇති හැකියාව ග්‍රාමීය සංවර්ධනයට අවැසි තවත් සාධකයකි. විශේෂයෙන්ම පුද්ගලයකුගේ ජීවිතයේ ගුණාත්මක වර්ධනය සඳහා මෙය ඉතාම වැදගත් වේ. ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය , අධ්‍යාපන, පරිපාලන හා විනෝදාත්මක අවශ්‍යතා සඳහා නිරන්තරයෙන් නගරයට සේන්දු වීමට ග්‍රාමීය ජනතාවට සිදු වේ. එමෙන්ම කාර්මික හා තාක්ෂණික සම්බන්ධතාවයද ගම හා නගරය අතර වන බැඳිම ශක්තිමත් කරන තවත් සාධකයකි. විදුලිය හා සන්නිවේදනය මඟින් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර තොරතුරු අදහස් ගලා යාම සිදු වන අතර මෙමඟින් නව තාක්ෂණික ක්‍රමශිල්ප ගමට ගලා යාමත් එමඟින් නවෝත්පාදන බිහිවීමටත් රුකුලක් වේ.

එමෙන්ම අතීතයේ පටන් ගම හා නගරය අන්තර්සම්බන්ධතාවය සමාජ සම්බන්ධතාවය තර කරන තවත් බැම්මකි සංස්කෘතික කටයුතු .ඒ හරහා විවිධ අංශ හරහා ගම හා නගරය අතර අන්තර්සම්බන්ධතා පවත්වන අතර  වර්තමානය වන විට ගම හා නගරය අතර වැඩිදෙනෙක් අන්තර්සම්බන්ධතාවය පවත්වන්නේ රැකිරක්ෂා හරහාය.  ශ්‍රී  ලංකාවේ රැකියා අවස්ථා සඳහා ගමේ ජනතාව නගරයට  පැමිණීම අතීතයේ පටන් පැවතගෙන එන අතර  අධ්‍යාපන කටයුතු, පෞද්ගලික පන්ති සඳහා වර්තමානය වන විට  ග්‍රාමීය දරු දැරියන්  විශාල පිරිසක්  දිනපතා නගරයට පැමිණෙති. මේ අනුව සළකා බලන විට ග්‍රාමසංවර්ධනයේදී ගම   නගරය සමඟ  බැඳි පවතින අයුරු හා එම අන්තර් සම්බන්ධතාවයේ වැදගත්කමත්  ගමට හෝ නගරයට හුදකලාව සිටීමට නොහැකි තරමට ගම හා නගරය අත්‍යන්තයෙන්ම එකිනෙකට බැඳී පවතින බවත් පැහැදිලි වේ. මේ නිසාම වර්තමානය වන විට බොහෝ  සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්වර්ධන සැළසුම් සකස් කිරීමේදී ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් නොව ඒවායේ එකිනෙක පවතින පරායත්ත බව අවබෝධ කරගෙන සැලසුම් සකස් කිරීමට පෙළඹී ඇත. ශ්‍රී  ලංකාවේ  තත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී දකුණ මධ්‍යම අධිවේගී මාර්ග පද්ධතිය මෙන්ම ආර්ථික මධ්‍යස්ථාන හා රට පුරා නගරවල ඇති  සුපර් මාකට් මඟින් අරඹා ඇති  ග්‍රාමීය නිෂ්පාදන මිළදී ගැනීමේ  ජාලය  ගම නගරය අතර පවතින අන්තර් සම්බන්ධතාවයට  කදිම උදාහරණ වේ.  ඉහත කරුණු පිළිබඳ සැළකීමේදී ග්‍රාමීය සංවර්ධනයේදී ගම හා නගරය අතර පවතින සම්බන්ධතාවය කෙතරම් දුරට වැදගත් වන්නේද යන්න මනාව පැහැදිලි වේ.  ග්‍රාමීය සංවර්ධනය උදෙසා   රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් සැළසුම් කරන   සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය නාගරික සම්බන්ධතා ශක්තිමත් කරමින් ඒ පිළිබඳ අවධානය යොමු කරමින්  සකස් කරන්නේ නම් එය ග්‍රාමීය ජනතාවට  සුබ ආරංචියක් වනු ඇත.

# 15. සංවර්ධනය, අසමානතාව හා කොවිඩ් 19.

සුභාසිනී දිනුෂා අල්ගම
පුහුණු හා පර්යේෂණ නිලධාරි

**සංවර්ධනය හා සංවර්ධනය මැනීම.**

ඔබත් මමත් පමණක්ම නොව අපගේ දෙමව්පියන් හා ඔවුන්ගේ වැඩිහිටි පරපුර ද, අපගේ දූ දරුවන් ද පමණක්ම නොව අප දරුවන්ගේ දරුවන්ට ද හඳාරන්නට සිදුවිය හැකි එකම පාඩම සංවර්ධනය යි. සැබවින්ම සංවර්ධනය යනු කුමක්ද?, සංවර්ධනය මැනිය හැක්කේ කෙසේද?, යන පැනයන් සඳහා ඔබේ පිළිතුරු කුමක්ද?.

සංවර්ධනය යන්නට විවිධ කාලවල, විවිධ පුද්ගලයන්, විවිධ ආයතන, විවිධ අවස්ථාවල විවිධ නිර්වචන අර්ථකථන, අදහස් ඉදිරිපත් කර ඇත. එසේම විවිධ විවේචන ද එල්ල කර ඇත. ඒ අනුව "සංවර්ධනය" යන්න විවිධ මානයන් ඔස්සේ වර්ථමානය දක්වා විකාශය වෙමින් පැමිණ ඉදිරියට ද වෙනස් වෙමින් ගමන් කරනු ඇත.

මුල් කාලීනව සංවර්ධනය යන්න රටක නිෂ්පාදිතය, ඒකපුද්ගල ආදායම වැනි ආර්ථික සාධක මත පදනම්ව නිර්වචන ඉදිරිපත්කර ඇත. නමුත් විද්වතුන්ගේ විවිධ අදහස් මතවාදයන් ඔස්සේ සංවර්ධනය යන්න විවිධ අංශ ඔස්සේ විමසා බැලිය යුතු කාරණයක් බව අපට අවධාරණය කරයි.

ඉන්දියාවේ කමලා බාසින්ගේ සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් කල අදහස් වලට අනුව සංවර්ධනය පිළිබඳ මෙතෙක් ඉදිරිපත් වූ අදහස් හා නිර්වචන පිළිබඳව නැවත නැවත් සිතන්නට අපව යොමු කරයි.

**"සංවර්ධනය යන සංකල්පය මූලික වශයෙන් හුවාදක්වන නිෂ්පාදනය වැඩි කිරීම පිළිබඳ අදහස් කාලයක් තිස්සේ මට ගැටලු සහගත වූ ප්‍රශ්නයක් විය. මෙම සංවර්ධන සංකල්පය අතිශයින් ද්‍රව්‍යවාදී වූ ද, අතිශයින් පටු වූ ද අදහසකි" කමලා බාසිං - ඉන්දියාව**

මේ ආර්ථික සාධකය මුල්කර ගත් සංවර්ධනය පිළිබඳව ඇයගේ සිතුවිල්ලයි. ඉන් ආර්ථික වශයෙන් ඉහල තත්ත්වයන් ලඟාවීමට හැකියාව තිබුණද සංවර්ධන කරා ලඟා වූ බව කිව හැකිද? යන්න සිතා බැලීමට අපිව පොළඹවයි. ඉන් එවැනි තත්ත්වයක් ආර්ථික වෘද්ධිය මිස සංවර්ධනයක් නොවන බව පෙන්වා දේ.

එවන් වූ විවිධ සාධකයක් මත රටක සංවර්ධනය පිළිබඳ කරන නිර්වචන පාදක කරගනිමින් සංවර්ධනය වෙමින් පවතින රටවල්, සංවර්ධිත රටවල්, තුන්වන ලෝකයේ රටවල් ආදී ලෙස විවිධාකාරයෙන් රටවල් අතර වෙනස්කම් පෙන්නුම් කරන නම් ලබාදීම තුළින් රටවල් අතර පවතින අසමානතාවයන් හඳුන්වා දී ඇත. මෙලෙස විවිධාකාරයෙන් රටවල් වර්ග කිරීම උදෙසා විවිධාකාර නිර්ණායක මත සංවර්ධනය මැනීමට ගන්නා උත්සාහයන් අපට හඳුනාගත හැක.

මුල් කාලීන සංවර්ධනය නිර්වචනය කර ගැනීමට හා මැන බැලීම උදෙසා ආර්ථික සාධකය භාවිතා කර ඇති අතර ඒක පුද්ගල ආදායම රටක සංවර්ධනය මනින ප්‍රධාන මිනුමක් ලෙස භාවිත කරයි. කමලා බාසින්ට අනුව එමගින් සංවර්ධනය මැනීම හෝ රටක සංවර්ධනයේ ස්ථානය තීරණය කිරීම කොතරම් සාධාරණ ද යන්න විමසා බලන ලද විද්වතුන් ඒ පිළිබඳව විවේචනයන් ඉදිරිපත් කර ඇත. මේ අතර ඩඩ්ලි සියර්ස් ප්‍රධාන තැනක් ගනී. ඔහු

විසින් ඉදිරිපත් කරන ලද අදහස තුළින් සංවර්ධනය දෙස බලන ආකාරය පිළිබඳ වරක් දෙවරක් නොව කිහිප වරක් සිතා බැලීමට අපව පොළඹවයි.

මෙම පෙළඹවීම් ඔස්සේ 1990 සිට මානව සංවර්ධන දර්ශකය තුළින් සංවර්ධනය දෙස නව මානයන්ගෙන් විමසා බැලීමට පටන් ගෙන ඇත. ඒ අනුව ආර්ථික වර්ධනය, ඒක පුද්ගල ආදායම වැඩිවීම සංවර්ධනය නොවන බැවින් නව මානයන්ගෙන් සංවර්ධනය නිර්වචනය කර ගැනීමටත් පෙළඹවීම නිසා 1995 වර්ෂයේ කෝපන් හේගන් නුවර පැවති ලෝක රාජ්‍ය නායක සමුළුවේදී සංවර්ධනය නව මානයන් ඔස්සේ සාකච්ඡාවට භාජනය වී ඇත.

**"ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, පරිසර සංවර්ධනය යන අංශවල මනා සම්බන්ධතාවයක් ඇතිව මහ ජනතාවට කල්පවත්නා උසස් ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමට හැකිවීම සංවර්ධනයයි".**

එහිදී සංවර්ධනය මේ ලෙස නිර්වචනය කරගෙන ඇත. ඒ අනුව ආර්ථික අංශය පමණක් නොව ජීවත් වීමේ දී අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් වලට අමතරව පුද්ගලයාගේ සමාජ හා පරිසර අංශවල මනා සම්බන්ධතාවයකින් හා මනා සමබරතාවයකින් පවත්වාගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් සංවර්ධනය අර්ථ කථනය කර ඇත.

2000 වර්ෂය වන විට ලෝකයේ රටවල සංවර්ධනය පිළිබඳ මානයන් තවදුරටත් විකාශනය විය. එහිදී ලෝකයේ රටවල් අතර 2015 වර්ෂය වන විට ලඟාකර ගතයුතු **"සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (millennium development goals)"** නම් වූ සංවර්ධන ඉලක්ක සමූහයක් සපුරා ගැනීම උදෙසා එකඟතා ඇති කර ගන්නා ලදී. නමුත් මෙම ඉලක්ක සපුරා ගැනීමේ දී ඇතැම් රටවල් සාර්ථක වී ඇති අතර ඇතැම් රටවල් අසාර්ථක වී ඇත. මේ වන විට ලෝකයේ ජනගහනයෙන් බිලියනයක් පමණ පිරිසක් දිනකට ඇමෙරිකානු ඩොලර් 1.25 ට වඩා අඩු ආදායමක් ලබන අතර මිලියන 800කට අධික පිරිසකට යැපීමට ප්‍රමාණවත් තරම් ආහාර නොලබන බවත් වාර්ථා වීමත්, අභිමතාර්ථ 8කට පමණක් සීමා වීම තුළ ඇතැම් අත්‍යවශ්‍ය අංශ ආවරණය නොවූ බවටත් අදහස් පල වීමත් හේතුවෙන් සංවර්ධනය පිළිබඳ නැවත විමසා බැලීමට යෝජනා විය. එබැවින් 2012 වර්ෂයේ බ්‍රසීලයේ රියෝ නගරයේ පැවති එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුව (Rio+20) තිරසර සංවර්ධන අභිමතාර්ථ සමූහයක් සකස් කිරීමට එකඟ වූ අතර ඒ සඳහා විවෘත ක්‍රියාකාරී කණ්ඩායමක් ද පිහිටුවීමට තීරණය කරන ලදී. එසේම 2015 වර්ෂයෙන් පසු කාලය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන න්‍යාය පත්‍රයට මෙම අභිමතාර්ථ එකතු කිරීමට එකඟතාවය පළ විය. ඒ අනුව රටවල් 70ක නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවේ අවසාන කෙටුම්පත 2014 වර්ෂයේ ජූනි මස වන විට අවසන් කර ලදී. 2015 නිව්යෝක් නගරයේ දී පැවති සමුළුවේදී 2015-2030 දක්වා කාලය සඳහා වූ ලෝක පරිවර්තනය කිරීම උදෙසා **තිරසර සංවර්ධන අභිමතාර්ථ** සහ ඒ හා සම්බන්ධ **ඉලක්ක 169ක්** ඇතුළත් **"තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය"** සියලු රටවල් වල සංවර්ධන ප්‍රතිපත්ති වලට ඇතුළත් කරගැනීමට කටයුතු කර ඇත. මෙම අභිමතාර්ථ සියල්ල (17) තුළ අසමානතාවය අවම කෙරෙන්නා වූ කරුණු රැසක් අන්තර්ගත කොට තිබේ.

සංවර්ධනය යන්න හෝ තිරසර බව එක් රටකට හෝ රටක එක් කොටසකට පමණක් හිමි වීම සංවර්ධනය ද?. මේ බව ඩඩ්ලි සියර්ස්ගේ සංවර්ධනය විග්‍රහකර ගැනීමට අනුව ප්‍රශ්නය කරයි.

**" යම් රටක දරිද්‍රතාවය, විරැකියාව, ආදායම් විෂමතාවය යනු ගැටළු තුනම හෝ කිහිපයක් මතු වී තිබේ නම් ඒක පුද්ගල ජාතික ආදායම දෙගුණයක් වුවත් එහිදී එය සංවර්ධනය වශයෙන් හැඳින්විය නොහැක"**

ඔහුට අනුව රටක් සංවර්ධනය වීමට නම් ආර්ථික වර්ධනය, පුද්ගලයන් ආර්ථිකය සපයාගන්නා මාර්ගවල ස්ථාවරත්වය හා ආර්ථිකය බෙදී යාමේ අසමානතාවය නැතිවීමත් ඉන් සමාජ අසමානතාවය නැති වීම අවශ්‍ය බවත් අපට පෙන්වා දෙයි.

මෙම සියලු කරුණු සලකා බැලීමේදී රට සංවර්ධනය කරා ළඟාවීමට නම් ආර්ථික වෘද්ධිය සමඟම විවිධ අංශ ඔස්සේ පවතින සමාජ අසමානතා අවම වන ප්‍රජාව පීඩාවකට පත් නොවන සාධාරණ ආකාරයේ වටපිටාවක් වර්ථමානයේ පමණක් නොව අනාගතයේ දී ද නිර්මාණය විය යුතු බව අපට පැහැදිලි වේ.

**අසමානතාවය**

අසමානතාවයන් ලෝකය පුරා පවතින බව අපට පෙන්නුම් කරන්නේ, පිරිසකට ආහාර ඇඳුම් නිවාස බෙහෙත් ආදී අවශ්‍යතාවයන් අධික ලෙස ළඟාකර ගත හැකි වී ඇති අතර තවත් පිරිසකට මූලික අශ්‍යතාවයන් පවා සපුරා ගැනීමටවත් ප්‍රමාණවත් නොවන තත්වයක් උදා වී ඇත. අපිට දක්නට ලැබෙන ප්‍රධාන අසමානතාව වශයෙන් ආදායම් බෙදීයාමේ වෙනස ලෙස සැලකිය හැකි අතර අසමානතාවය යනු එපමනක් ම නොවේ. සුදු - කළු භේදය (වර්ණභේධවාද) මත, ස්ත්‍රී - පුරුෂ භාවය මත ඇතිකරන වෙනස්කම් ආදී කරුණු නිසා ද අසමානතාවයක් (විෂමතාවයක්), ලෝකය පුරා පවතින ආකාරය දක්නට ලැබේ. ඒ අතර ප්‍රධාන වශයෙන් ආදායම් විෂමතාවය මත හට ගන්නා දිළිඳුකම තුල වැඩි පිරිසකට දුකක් පීඩාවක් ඇති කරයි නම් එතන ගැටලු සහගත තත්ත්වයක් පවතී. අසමානතාවය ආදායම්, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, සෞඛ්‍ය, ස්ත්‍රී පුරුෂ, ශරීර වර්ණය ආදී විවිධ අංශය තුල අසමානතාවය නැතහොත් විෂමතාවය හඳුනාගත හැක. වර්තමානය වන විට මෙම අසමානතාවය දෙස ද නව මානයන්ගෙන් ද බලමින් සිටී. ස්ටොක්හෝම්ස් පරිසර ආයතනය විසින් සිදුකල පර්යේෂණ මත පදනම්ව 2030 දී කාබන් විමෝචනයේ අසමානතාවය පිළිබඳව ද කතාබහට ලක්කර ඇති ආකාරයෙන් මේ බව පෙනීයයි.

විශේෂයෙන් ආර්ථික සාධකය (ආදායම) අසමාන ලෙස බෙදී යාම හේතුවෙන් පුද්ගලයින්, ප්‍රදේශ, රටවල් අතර ඇති කරන වෙනස්කම අසමානතාවය ලෙස ද මූලිකවම හැඳින්විය හැක. සමාජය තුල මෙසේ ආදායම් බෙදී යාමේ අසමානතාවය හේතුවෙන් සමාජ ආර්ථික ගැටළුව රැසක් ඇතිකරමින් කොටසකට පීඩාවන් ඇති කරනු ලබයි. මෙය සමාජ අසමානතාවය ලෙසද හඳුන්වා දිය හැක. ඉන් කිසියම් පිරිසක් විසින් තවත් පිරිසකට වෙනස් කොට සැලකීම පිළිබිඹු කරයි.

පොදුවේ ගත් කල, සමාජ අසමානතාවය වැඩි වශයෙන් සිදු වන්නේ නොදියුණු රටවල වන අතර, එය අධ්‍යාපනයේ හිඟකම, ශ්‍රම වෙළෙඳපොල තුළ හොඳ අවස්ථා අහිමි වීම, සංස්කෘතික, භාණ්ඩ හෝ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට අපහසු වීම ආදී ලෙස මෙම අසමානතාව නිර්මානය වේ. මෙම අසමානතාව උසස් සංවර්ධනයක් ඇති රටවල ද සිදු විය හැකිය. නමුත් අසමානතාවය නිසා ජනගහනයෙන් වැඩි කොටසක් පීඩාවට පත් වන්නේ දිළිඳු රටවල් හා දිළිඳු ප්‍රජාවයි. එසේ අසමානතාවය ස්ත්‍රී-පුරුෂ අසමානතාවය, වාර්ගික අසමානතාවය, කලාපීය අසමානතාවය, වැනි වෙනත් ආකාරයේ අසමානකම් තුලින් සමාජ අසමානතා ඇතිකරන අතර ඉන් වැඩි පිරිසක් පීඩාවට පත් කරයි නම් එවැනි සමාජයන් සංවර්ධිත නොවන ලෙස සැලකේ.

මාක්ස්ද මතවාදීන් පවසන්නේ සමාජ අසමානතාවය පැන නැගුනේ ධනවාදයත් සමඟ එනම් ප්‍රාග්ධනය හා පෞද්ගලික දේපළ එකතු කිරීමේ අදහස ඉස්මතු කළ ආර්ථික ක්‍රමය සමඟ බවත්, ප්‍රාග්ධනය සහ පරිභෝජනය කිරීමේ හැකියාව මත පදනම්ව පුද්ගලයින් අතර අසමානතාවය බිහිවන බවත්ය.

සමාජ අසමානතාවය විවිධ මහාද්වීපවල, රටවල්වල, ප්‍රදේශවල පමණක් නොව පුද්ගලයින් අතර ද පවතින ගැටලුවක් බව අප දනිමු. අසමානතාවයන් වැඩි ලෙස සැලකෙන අප්‍රිකානු රටවල්වල් වැනි අසමානතාවයන් හේතුවෙන් පීඩාවන්, ගැටලු වඩාත් පැහැදිලිව පෙනෙන ස්ථාන තුල මෙන්ම ලෝකයේ ඉහළම සමාජ ආර්ථික සහිත රටවල් තුල ද අසමානතාවයන් පවතී. නමුත් සංවර්ධනය තීරණය කිරීමේ දී ඉතාමත් දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල ප්‍රගතියේ සහ පූර්ණ සංවර්ධනයේ දී, සමාජයක අරමුණ වන්නේ සමාජ සමානතාවය ඇති කර ගැනීම සඳහා අසමානතා හිඩැස් අඩු කිරීම බව සඳහන් කළ යුතුය.

**ලෝකයේ අසමානතාවය.**

ලෝකය පුරා ප්‍රජාව අතර අසමානතාවය, විශේෂයෙන් සම්පත් හිඟකම හා සම්පත් බෙදීයාමේ විෂමතාවය මත පීඩා විඳින ආකාරය අපිට දැක්නට ලැබේ. 2021 වර්ෂයේ ලෝකයේ මුළු ආදායම ට්‍රිලියන 127ක් බවට ගණන් බලා තිබේ. මෙම ආදායම වැඩකරන ජනගහනයෙන් බෙදූ විට වැඩ කරන ජනතාවගේ මාසික එක පුද්ගල ආදායම ඩොලර් 1950 ක් වන අතර ආසන්න වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 4 ක් ඉක්මවන මුදලකි. එක් පවුලක දෙතුන් දෙනෙකු සිටීනම් මේ ප්‍රමාණය එවැනි ගුණයකින් වැඩිවිය යුතුයි. ඔබ හා ඔබේ පවුලේ සාමාජිකයින් මෙවැනි ආදායමක් ලබන්නේද?. හැමෝටම මේ කියන්නා වූ මුදල ලැබෙනවා ද?. එසේ නම් මූලික අවශ්‍යතාවයන් වත් සපුරා ගත නොහැකි පිරිසක් සිටින්නේ කෙසේ ද?. මේ වෙනස නැතහොත් අසමානතාවය පුද්ගලයින් අතර, ප්‍රදේශ අතර, රටවල් අතර පවතින ආකාරය ලෝකෙ පුරා ම දක්නට ලැබේ. ලෝකයේ සිටින අන්ත දුගී සංඛ්‍යාව මිලියන 735ක් බවට ගණනය කර ඇති අතර මේ පිරිස ශ්‍රම බලකායෙන් 10% ක් වේ. ලෝකයේ සම්පත් සමානව බෙදී ගියේ නම් සැමදෙනාටම ලැබෙන ආදායම සමාන විය යුතු නමුත් එවැනි තත්ත්වයක් නොමැති බව මෙම අන්ත දුගීන්ගේ ප්‍රමාණය අපට අවධාරණය කරයි. එසේ ම මෙවැනි වෙනසක් තුල පීඩාවට පත්වන පිරිසක් ද අපිට දැකගත නෙහැක.


වර්තමානය වන විට ලෝකයේ ඉහළම ධනපතීන් 1%ක් ලෝක වත්කම්වලින් 38% ක් වැනි ඉහළ ප්‍රමාණයක් භුක්ති විඳින බවත්, පහලම ආදායම් ලබන 50%ක ප්‍රමානයක් සඳහා හිමිවන්නේ නිශ්පාදිතයෙන් 2%ක් බවත් ගණන් බලා ඇත. එසේම ඉහලම ආදායම් ලබන 10% ක පිරිස සමස්ත ආදායමින් 76% භුක්ති විඳී. ඉතිරි 90% සඳහා හිමිව ඇත්තේ මුලු ආදායමින් 24% ක් පමනි. ආදායම් බෙදී යාමේ අසමානතාවයේ ලෝක තත්ත්වය මේ ලෙස වර්තාවන අතර ලෝකය පුරා රට රටවල් වල් අතරද මෙවැනි ම වෙනස්කම් දක්නට ලැබේ.

අසමානතාවය වැඩිම කලාපය වන්නේ මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයයි. අපිට ආසන්න රට වන ඉන්දියාවේ අම්බානි සහ ගෞතම අදානි රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 6.9% ක් සඳහා හිමිකම් කියයි. එසේම ඉහලම ආදායම් ලබන 10% විසින් ඉන්දීය සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 77%ක් හිමිකරගෙන සිටී. මිලියන 140 පමණ වූ අන්ත දිළින්දන් ( %) සඳහා දේශීය නිෂ්පාදිතයෙන් හිමි වී ඇත්තේ 10% ක් පමණි. එක්සත් ජනපදයෙහි ධනවත් 3% සමස්ත ආදායමෙන් 50% ක් හිමිකර ගන්නා අතර රුසියාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 50% ක් ඉහළ ආදායම් ලබන 8% දෙනා අතර බෙදී ගොස් ඇත.

සමස්තයක් ලෙස ගත් කළ මෙලෙස විෂමතාවයන් නැතහොත් අසමානතාවයන් ලෝකය පුරා නිර්මාණය වී තිබේ. ඒ මත ලෝකයේ වැඩි පිරිසක් විවිධාකාරයේ පීඩාවන්ට ලක් වෙමින් සිටී. මෙලෙස ඇතිවන අසමානතාවය වැලැක් විය නොහැකි නමුත් පීඩාවන් අවම වූ සාධාරන බෙදීයාමක් තුළින් සංවර්ධනය කරා ප්‍රවේශ විය යුතු බව වර්තමාන සංවර්ධන නිර්වචන විමසා බැලීමේ දී තහවුරු වේ. මානව සංවර්ධන දර්ශකය, තිරසර සංවර්ධන

අභිමතාර්ථ වැනි සංවර්ධන නිර්නායක විකාශනය වෙමින් වර්තමානය දක්වා පැමින ඇත්තේ මෙම අසමානතා අවම වූ, පීඩාවට පත්වන්නන් අවම වූ, සතුට, විවේකය වර්ධනය කරගනිමින් ඉදිරියට ගමන් ගන්නා සාධාරණ සමාජයන් ඇති කිරීම උදෙසායි.

**ශ්‍රී ලංකාවේ අසමානතාවය.**




ශ්‍රී ලංකාවේ විෂමතාවය නැතහොත් අසමානතාවය පිළිබඳව සොයා බැලීමේදී ජනගහනය අතර මෙන්ම ප්‍රදේශ අතර ද අසමාන බවක් හඳුනා ගත හැක. ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික නිෂ්පාදිතයෙන් 50% ක් හිමිකර ඇත්තේ 20% වන සුලු පිරිසකි. ජනගහනයෙන් පහලම ආදායම් ලබන 20% ක් සඳහා හිමිවී ඇත්තේ මුළු නිශ්පාදිතයෙන් 5% කි. පහලම ආදායම් ලබන 10% සඳහා හිමිව ඇත්තේ 1.5% වැනි ඉතා සුලු කොටසකි.

ශ්‍රී ලංකාවේ ජාතික ආදායම පුද්ගලයින් අතර බෙදීයාමේ අසමානතාවය මෙලෙස දැක්විය හැකි අතර ප්‍රදේශ අතර සම්පත් බෙදී යාමේ හා ජාතික නිශ්පාදනයට දායකත්වය ලබාදීමේ ද අසමානතාවයක් පවතින බව මහබැංකු වාර්තා මෙන්ම අනෙකුත් දත්ත පෙන්වා දෙයි.

සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන වැනි විවිධාකාර පහසුකම් වැඩි ප්‍රතිශතයක් බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රනය වී ඇත. එහි ප්‍රථිපලය වන්නේ රටේ එක් පිරිසක් පහසුකම් අතිවිශාල ප්‍රමාණයක් බුක්ති විඳින අතර තවත් පළාතක මෙම පහසුකම් කරා ලඟා වීම සඳහා දැඩි දුෂ්කරතා විඳීමට සිදු වී තිබීමයි. ශ්‍රී ලංකාවේ දිළිඳු ප්‍රජාවේ ප්‍රමාණය තිරණය කරනු ලබන්නේ මාසික ආදායම රු.36000ට අඩු ආදායම් ලබන ප්‍රමාණය මතයි. ඒ අනුව ලංකාවේ ආදායම බෙදී ගොස් ඇති ආකාරය අනුව ප්‍රදේශ අතර අසමානතාවයක් පවතී. දිළිඳු ප්‍රජාව 71%ක් සිටින මුලතිවු පහලම ආදායම් ලබන වැඩිම පිරිස ඇති දිස්ත්‍රික්කයවේ. කිළිනොච්චිය 66%ක් ද මඩකලපුව 65%ක් ද පහලම ආදායම් ලබන ජනතාවක් සිටි දිස්ත්‍රික්ක වේ. එසේම පහසුකම් අඩු දිළිඳුම ප්‍රජාවක් සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලෙස සලකනු ලබන සියඹලාණ්ඩුව, කන්දකැටිය, රිදීමාලියද්ද වැනි ප්‍රදේශ වල ප්‍රජාව ඉතාම පහල මට්ටමින් පහසුකම් බුක්ති විඳන ඉතාම දුෂ්කරතාවන්ට පීඩාවන්ට මුහුණදෙන පිරිස් ජීවත්වන ප්‍රදේශ වේ. එසේම ප්‍රාදේශීය වශයෙන් ජාතික ආදායමට දක්වන දායකත්වයේ ද අසමානතාවයක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ මෙම දායකත්වයේ වැඩිම දායකත්වය ලබා දෙන්නේ බස්නාහිර පළාතයි. එය 54%කි. අඩුම දායකත්වය ඌව පළාත වන අතර එම දායකත්වය 4% කි.

මෙලෙස පුද්ගලයින් අතර, ප්‍රදේශ අතර ආදායම් බෙදීයාමේ අසමානතාවයක් මෙන්ම පහසුකම් භුක්තියේද, ද.දේ.නි. සඳහා දක්වන දායකත්වයේද විවිධ විෂමතාවයන් පවතී. ඉන් වැඩි පිරිසක් දැඩි ලෙස පීඩාවන්ට පත්වීමත් හොඳින්ම දැක ගැනීමට හැකි වේ. මෙම තත්ත්වය රටක සංවර්ධනය නොවන බවත් මේ වන විට අපි හොඳින්ම දන්නා කරුනකි. එසේම රටේ සමස්ත ජාතික ආදායම රටේ සිටින එක් එක් පුද්ගලයාගේ දායකත්වය තුළින් නිර්මාණය වී ඇති නමුත් සුළු පිරිසක් වැඩි ප්‍රමාණයක් ද, වැඩි පිරිසක් අඩු ප්‍රමාණයක් ද බුක්ති විඳී. මේ ලෙස සියලුම දෙනා ගේ දායකත්වයෙන් ගොඩනැගෙන ජාතික ආදායමේ බෙදීයාම සාධාරණ විය යුතු නොවන්නේද?.

ලෝකය පුරා විෂමතාවක් පැවතියද ප්‍රමානවත් සම්පත් ප්‍රමාණයක් භුක්ති විඳීමටත්, මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමටත් පුද්ගලයන් හට හැකි විය යුතුයි. පවතින අසමානතාවයන් තුළ එවැන්නක් සිදු නොවේනම්, යම් අයෙකු පීඩාවට පත්වන්නේ නම් ඒ රට සංවර්ධිත නොවන බවත් අපි දැන් දනිමු. වර්ථමානය වන විට ලෝකය පුරා බහුතර ප්‍රජාවක් පීඩාවට පත් කරන මෙම අසමානතාවය බරපතල ලෙස වර්ධනය කර ප්‍රධානම හේතුව බවට කොවිඩ් -19 වසංගතය පත්වී ඇත.

**කොවිඩ් 19 හා අසමානතාවය.**

බරපතල ලෙස අසමානතා සහිත ලෝකයක් නිර්මාණය වීම කෙරේ, ව්‍යුහාත්මක හා පද්ධතිමය, ප්‍රතිපත්ති සහ දේශපාලනික සහාය ධනවත්ම සහ බලවත්ම අයට පක්ෂව සකස් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලොව පුරා සාමාන්‍ය ජනතාවගෙන් බහුතරයකට හානි සිදුවන බව කොවිඩ් -19 එන්නත ලබාදීම පිළිබඳ සකස් කරණ ලද වාර්තාව ද සාක්ෂි දරයි. එම වාර්ථාවට අනුව, පොහොසතුන් විසින් ඖෂධ සංස්ථා ඒකාධිකාරය ආරක්ෂා කිරීම නිසා, ප්‍රමාණවත් එන්නත් ලබාගැනීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවලට ඔවුන්ගේ ණය මට්ටම් සර්පිලාකාර ලෙස සමාජ වියදම් කපා හැරීමට බල කර ඇති බව සඳහන් වේ. මෙලෙස කප්පාදු පියවරයන් ගේ ප්‍රතිඵල ලෙස සංවර්ධන වෙමින් පවතින රටවල වෛරසයෙන් මියයන පුද්ගලයන්ගේ අනුපාතය ද ධනවත් රටවලට වඩා දළ වශයෙන් දෙගුණයක් බව ගණන් බලා ඇත. කොවිඩ්-19 ආරම්භ වූ දා සිට ප්‍රකෝටිපතියන්ගේ ධනය පසුගිය වසර 15ට වඩා වැඩි වී ඇත. එය ඩොලර් ට්‍රිලියන 5කි. මෙය මේ දක්වා ප්‍රකෝටිපති ධනයේ විශාලතම වැඩිවීමයි. ලෝක ආර්ථික සංසදයේ ඩාවෝස් න්‍යාය පත්‍රයට පෙරාතුව ප්‍රකාශයට පත් කරන ලද ඔක්ස්ෆෑම් වාර්ථාවේ **"අසමානතා මිනී මැරුම්"** නම් සංක්ෂිප්ත සටහන පවසන්නේ අසමානතාවය සෑම දිනකම අවම වශයෙන් පුද්ගලයන් 21,000ක් හෝ සෑම තත්පර හතරකට වරක් එක් පුද්ගලයෙකුගේ මරණයට දායක වන බවයි. මෙම තත්ත්වය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, කුසගින්න සහ දේශගුණික බිඳවැටීම් හේතුවෙන් ගෝලීය වශයෙන් සිදුවන මරණ මත පදනම් ව කරන ලද සොයා ගැනීමකි.

ඔක්ස්ෆෑම් වාර්ථාවට අනුව, වසංගතයේදී මානව වර්ගයාගෙන් 99% ගේ ආදායම පහත වැටෙද්දී ධනවත්ම මිනිසුන් දස දෙනෙකගේ ධනය දෙගුණ වන බවත්, සෑම තත්පර හතරකට වරක් එක් පුද්ගලයෙකු මරණයට පත්වන අතර සෑම පැය 26 කට වරක් නව ප්‍රකෝටිපතියෙකු බිහිකිරීමට අසමානතාවය දායක වී ඇත. එසේම ලෝකයේ ධනවත්ම මිනිසුන් දස දෙනා තම ධනය ඩොලර් බිලියන 700 සිට ඩොලර් ට්‍රිලියන 1.5 දක්වා දෙගුණයකටත් වඩා වැඩි කර ගන ඇත. වසංගතයේ පළමු වසර දෙක තුළ තත්පරයකට ඩොලර් 15,000 ක් හෝ දිනකට ඩොලර් බිලියන 1.3 ක අනුපාතයකින් ප්‍රජාවගේ 99% ක ආදායම පහත වැටී ඇත. තවත් මිලියන 160 කට අධික ජනතාවක් දරිද්‍රතාවයට ඇද දමා ඇත. එසේම ලොකයේ ධනවත්ම මිනිසුන් දස දෙනාට හෙට ඔවුන්ගේ ධනයෙන් 99.999% ක් අහිමි වුවත් ඔවුන් ලෝකයේ සිටින සියලුම මිනිසුන්ගෙන් 99% කට වඩා පොහොසත් වේ. එසේම ඔවුන්ට දැන් දුප්පත්ම බිලියන 3.1 ජනතාවට වඩා හය ගුණයක ධනයක් තිබෙන බව ඔක්ස්ෆෑම් ඉන්ටර්නැෂනල් හි විධායක අධ්‍යක්ෂ ගේබ්‍රියෙලා බුචර් පවසා ඇත. එබැවින් මෙම අසමානතාවයේ ප්‍රචණ්ඩ වැරදි නිවැරදි කිරීම ආරම්භ කිරීම කිසි විටෙකත් ප්‍රභූන්ගේ බලය සහ බදු අය කිරීම ඇතුළු ධනය ආපසු ලබා දීමෙන් ආරම්භ කිරීම එතරම් වැදගත් නොවීය හැකි වුවත් එම මුදල් නැවත සැබෑ ආර්ථිකයට ලබා ගැනීම තුලින් ජීවිත බේරා ගැනීම කටයුතු කළ යුතුබව ඇය තවදුරටත් සඳහන් කර ඇත.

**කොවිඩ් - 19 හා සෞඛ්‍ය ආරක්ෂණය මත අසමානතාවය.**

ආර්ථික අසමානතාවය යනු ආර්ථික ප්‍රචණ්ඩත්වයේ ආකාරයකි, එහිදී වරප්‍රසාද ලත් සුළු පිරිසකගේ ධනය සහ බලය සදාකාලික කරන ප්‍රතිපත්ති සහ දේශපාලන තීරණ, ලොව පුරා සිටින සාමාන්‍ය ජනතාවගෙන් අතිමහත් බහුතරයකට සහ ලෝකයටම සෘජු හානියක් සිදු කර ඇත. නමුත් ප්‍රකෝටිපතියන්ට දරුණු වසංගතයක් නැත. වර්ථමානයේ අසමානතාවය අධිකව වර්ධනය වීමට හේතු වූ කොවිඩ් -19 වසංගතය ලෝකය පුරා පැතිරයාමත් සමග ලෝක සෞඛ්‍ය ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණය සැපයීම, දේශගුණයට අනුවර්තනය වීමට අරමුදල් සැපයීම සහ රටවල් 80කට අධික ප්‍රමාණයක ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීම යන මේ සියල්ල සිදු කිරීමට පෙරටත් වඩා උත්සාහ ගත යුතුව ඇත.

ලෝකයේ රටවල ආර්ථිකය සුරැකීම සඳහා මහ බැංකු විසින් ඩොලර් ට්‍රිලියන ගණනක් මූල්‍ය වෙළෙඳපොලවල් වෙත පොම්ප කල ද ඉන් බොහෝමයක්, කොටස් වෙළෙඳපොල උත්පාතයක් ලගාකර ගත් ප්‍රකෝටිපතියන්ගේ සාක්කුවලට එකතු වීමෙන් අවසන් වී ඇත. එසේම එන්නත් මගින් මෙම වසංගතය අවසන් කිරීමට අදහස් කළ ආණ්ඩු බිලියන ගණනක ජනතාවගේ සැපයුම කපා හැරීමට හා ඖෂධ ප්‍රකෝටිපතියන්ට සහ ඒකාධිකාරයන්ට ඉඩ දී ඇත. එහි ප්‍රතිඵලය වන්නේ සෑම ආකාරයකම අසමානතාවයන් වර්ධනය වීමයි.

කොවිඩ්-19 වසංගතය, ලෝකයේ අසමානතාවය වාර්ගික, ආර්ථික සහ ස්ත්‍රී පුරුෂ ලෙස උග්‍ර ලෙස වර්ධනය කර තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ වැඩිවීම්, කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ රැකවරණය අහිමි වීම් වර්ධනය කර ඇත. 2020 දී කාන්තාවන්ට ඩොලර් බිලියන 800 ක ඉපැයීම් සාමූහිකව අහිමි වී ඇති අතර, 2019 ට වඩා රැකියා වල සිටින කාන්තාවන්ගේ මිලියන 13 ක අඩු වීමකි. අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් දූපත් වල සිටින බිලියනයක් වූ කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට වඩා පිරිමින් 252 කට වැඩි ධනයක් හිමි වී ඇත.

වසංගතයෙන් දැඩි ලෙස පහර වැදී ඇත්තේ වාර්ගික කණ්ඩායම්වලට ය. එංගලන්තයේ වසංගතයේ දෙවන රැල්ලේ දී, බංග්ලාදේශ සම්භවයක් ඇති පුද්ගලයින් කොවිඩ්-19 වලින් මිය යාමට බ්‍රිතාන්‍ය සුදු ජනගහනයට වඩා පස් ගුණයකින් වැඩි විය. බ්‍රසීලයේ කළු ජාතිකයින් සුදු ජාතිකයින්ට වඩා කොවිඩ්-19 වලින් මියයාමේ සම්භාවිතාව 1.5 ගුණයකින් වැඩි වේ. එක්සත් ජනපදයේ, ඔවුන්ගේ ආයු අපේක්ෂාව සුදු මිනිසුන්ට සමාන නම්, කළු ඇමරිකානුවන් මිලියන 3.4 ක් අද ද ජීවත් වනු ඇත.

වසංගතයට එරෙහිව සටන් කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වුවද, පසුගිය වසර දෙක තුළ ධනවත් රටවල ආන්ඩු ධනවතුන්ගේ ධනය මත බදු වැඩි කිරීමට අපොහොසත් වූ අතර එන්නත් විද්‍යාව වැනි පොදු භාණ්ඩ පුද්ගලීකරණය කිරීම දිගටම කරගෙන ගියේය. වසංගත කාලපරිච්ඡේදය තුළ පමණක්, 2000 - 2015 දක්වා වූ පසුගිය වසර 15ට වඩා එක් වසරක් තුළ වෙළෙඳපොල බලපෑම තර්ජනයට ලක්වන තරමටම ඔවුන්ගේ ආයතනික ඒකාධිකාරයන් දිරිමත් කර ඇත.

2020 සහ 2021 වසර පුරා දේශගුණික විපර්යාසවලට තුඩු දී ඇති, ලැව්ගිනි, ගංවතුර, ටොනේඩෝ, ආදිය බෝග අසාර්ථක වීමට දායක වීම කෙරේ ධනවත්ම 1%, ලෝකයේ පහළම 50%ට වඩා දෙගුණයකටත් වඩා දායක වී ඇති බවත්, (කාබන් (CO2) විමෝචනය කරන බවත්) ඔවුන් අසමානතාවයේත් බඩගින්නේ සහ දේශගුණික අර්බුදයේත් හදවත බවත් ප්‍රකාශ කර ඇත. මෙවැනි වේගයකින් සහ පරිමාණයෙන් අසමානතාවය

වර්ධනය වන්නේ අහම්බෙන් නොවන බවත් බුවර් ප්‍රකාශ කර ඇත. ඒ බව ඇයගේ, **"අපගේ ආර්ථික ව්‍යුහයන් මෙම වසංගතයට එරෙහිව අප සියල්ලන්ම අඩු ආරක්ෂිත බවට පත් කර ඇතිවා පමණක් නොව, ඔවුන් දැනටමත් අතිශයින් ධනවත් හා බලවත් අයට මෙම අර්බුදය ඔවුන්ගේම ලාභය සඳහා ගසාකෑමට ක්‍රියාකාරී වීමට මගපාදයි."** යන ප්‍රකාශය සනාත කර ඇත.

එසේම ලෝකයේ විශාලතම ආර්ථිකයන් දෙක වන එක්සත් ජනපදය සහ චීනය ධනවතුන් මත ඉහළ බදු අනුපාත සම්මත කිරීම සහ ඒකාධිකාරයට එරෙහිව පියවර ගැනීම ඇතුළුව අසමානතාවය අඩු කරන ප්‍රතිපත්ති සලකා බැලීමට පටන් ගැනීමේ වැදගත්කම ඔක්ස් පැම් වාර්තාව තවදුරටත් අවධාරණය කරයි. එසේම මෙවැනි අසමානතාවය ඇතිවන්නේ දේශපාලන ව්‍යුහයන් මෙන්ම ප්‍රතිපත්ති තුලින් මිස අහම්බයෙන් නොවෙන බවත්, එවැනි ව්‍යුහයන් මෙම වසංගතයේ දී අප සියල්ලන්ම අනාරක්ෂිත බව කර ඇති බවත්, දැනටමත් අතිශය ධනවත් හා බලවත් අය බවට පත් වී ඇත්තන් ලාභය සඳහා ගසාකෑමට ක්‍රියාකාරී සක්විත්තන් බවට පත් වී ඇති බවත් පෙන්වා දෙන ඔක්ස්පැම් වාර්තාව විසින් රජයයන්ට පහත සඳහන් නිර්දේශ ඉදිරි පත් කිරීමට කටයුතු කර ඇත.

- වසංගතය ආරම්භයේ සිට ප්‍රකෝටිපතියන් උපයාගත් මෙම අතිවිශාල නව ධනයට ස්ථිර ධනය සහ ප්‍රාග්ධනය මත බදු පැනවීමෙන් ආපසු ලබා ගැනීම.
- විශ්වීය සෞඛ්‍ය ආරක්ෂණය සහ සමාජ ආරක්ෂණය දේශගුණික විපර්යාස අනුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට සහ වැඩසටහන් සංවිධානය කිරීම සඳහා මෙම බදු මගින් රැස් කළ ට්‍රිලියන ගණන් ධනය ආයෝජනය කිරීම.
- ස්ත්‍රීන්ට සහ වාර්ගිකව පුද්ගලයන්ට වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය වැලැක් වීමට මෙන්ම වෙනස් කොට සැලකීම මුලිනුපුටා දැමීම සඳහා නව ස්ත්‍රී පුරුෂ සමානාත්මතා නීති ඇති කරන, ලිංගික හා ජාතිවාදී නීතිවලට විසඳුම් සෙවීමට, තීරණ ගැනීමේ අවස්ථාවන් කාන්තාවන්, වාර්ගික සහ අනෙකුත් පීඩිත කණ්ඩායම් සඳහා නියෝජනය කිරීමට සහතික කරන ප්‍රතිපත්ති හා සමාජයේ සියලුම අංශයන් කඩිනමින් නිර්වචනය කළ යුතුය.
- කම්කරුවන්ගේ වෘත්තීය සමිති හා වැඩ වර්ජන කිරීමේ අයිතීන් වලට වල කපන නීති අවසන් කර ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් නීතිමය ප්‍රමිතීන් සකස් කිරීම.
- වසංගතයේ අවසානය කරා ගෙන ඒම සඳහා තවත් රටවලට ආරක්ෂිත සහ ඵලදායී එන්නත් නිපදවීමට ඉඩ සලසා දීම සඳහා ධනවත් ආන්ඩු වහාම කොවිඩ්-19 එන්නත් තාක්ෂණය පිළිබඳ බුද්ධිමය දේපල නීති අත්හැරීම.

එම වාර්තාවේ සඳහන් මෙම නිර්දේශයන් තුළින් ලෝකයට ප්‍රකාශ කරන්නේ සංවර්ධනය උදෙසා අසමානතාවය බාධකයක් වන අතර ලෝකයේ සාධාරණ තත්ත්වයක් ගොඩනැගීම උදෙසා රට රට වල පවතින විෂමතාවයන් අවම කර ගැනීම උදෙසා කැපවීමෙන් කටයුතු කළ යුතු බව පමනක් නොව කොවිඩ්-19 හේතුකොට ගෙන වර්ධනය වන එම තත්ත්වයන් වලක්වා ගැනීම උදෙසා රට රටවල රජයන් ගේ දැඩි මැදිහත් වීම තුළින් එවැනි තත්ත්වයන් පාලනය කළ යුතු බව නොවේද?.

එසේනම් අප රට තුලට ද වහ වහා අසමානතාවය අවම කරන මෙවැනිම මැදිහත් වීමක් අවශ්‍යම බව ඔබටද වැටහෙනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍රයන්**

Economy|Coronavirus pandemic

**The poor die from COVID while the rich get richer, Oxfam warns**

YouTube - Leftline අසමානතාවය

විකිපීඩියා -අසමානතාවය